# The Socialist

ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ මාසික ප්‍රකාශනය

භූ දේශපාලනය | ඉතිහාසය | න්‍යාය | පන්ති අරගල

## ඉරානය තුළ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පරාජය

යුද්ධයේ මෙම අදියර අවසන් වීමෙන් යුද්ධය මුළුමනින්ම අවසන් වූ බවක් අදහස් නොවේ. ඇමරිකානු අධිරාජ්‍යවාදය තම තත්ත්වය යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා නව යුද්ධ සූදානම් කරනු ඇත. පි.15

## යුරෝපානු සංගම් (EU) සමුළුව යුද මාවත වේගවත් කරයි: ආයුධ ගොඩනැඟීම, වෙළඳ යුද්ධය, සමාජ කප්පාදු සහ සරණාගත විරෝධී පියවර

ඉරාන යුද්ධය සහ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අර්බුදය මඟින් වේගවත් කරන ලද, යුක්රේන යුද්ධයේ ඍජු නායකත්වයෙන් එක්සත් ජනපදය සාපේක්ෂව පසුබැසීම, බර්ලිනය, පැරිසිය, ලන්ඩනය සහ බ්‍රසල්ස් විසින් වඩාත් ආක්‍රමණශීලී ලෙස ක්‍රියා කිරීම සඳහා යොදා ගනිමින් තිබේ. පි.18

## බෙල්ෆාස්ට් නුවර සංක්‍රමණිකයන්ට එරෙහිව සිදුවන අන්ත දක්ෂිණාංශික ප්‍රචණ්ඩ ක්‍රියා තවදුරටත්

මෙම සතියේ සිදු වූ ජන සංහාරක ප්‍රහාර , බ්‍රිතාන්‍යය සහ අයර්ලන්තය පුරා අන්ත දක්ෂිණාංශික ප්‍රහාර උග්‍ර වීමේ නවත්ම තත්ත්වයයි. මේවා, සංක්‍රමණිකයන් සහ රැකවරණ පතන්නන් සමාජය හමුවේ නරක පිරිසක් ලෙස හුවාදැක්වීමට කාලයක සිට ක්‍රමානුකූලව සිදු කරන ලද ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. පි. 22

## රාවුල් කැස්ත්‍රෝට එරෙහි එක්සත් ජනපද අධිචෝදනාව සහ කියුබාවට එරෙහි CIA හීෂණයේ වාර්තාව

මෙම අධිචෝදනා පත්‍රය, මාස ගණනාවක් තිස්සේ සිදුවෙමින් පවතින, ට්‍රම්ප් පරිපාලනය විසින් යුද්ධයක් සඳහා පුළුල් ලෙස පදනමක් මවාපෑමේ ක්‍රියාවලිය සමඟ සමගාමීව බැලිය යුතුය. පි. 25




## දිසානායක ආණ්ඩුවේ "වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය": මාධ්‍ය නිදහසේ ගෙල සිර කිරීමේ සැලසුමක්

වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතන පනත් කෙටුම්පත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනු! මෙය සංශෝධනය කළ යුතු පනතක් නොවේ — එය පරාජය කළ යුතු පනතකි! මාධ්‍යවේදීන්ට රාජ්‍ය බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය එපා! මාධ්‍ය නිදහස යනු අයිතිවාසිකමකි, ධනපති රාජ්‍යය විසින් පිරිනමනු ලබන වරප්‍රසාදයක් නොවේ! පි.2

## පන්හිඳ පාවාදීම: යෝජිත CIMP පනත පිළිගන්නා මාධ්‍යවේදීන්ගේ ප්‍රතිගාමී ආකල්පය පරාජය කරනු!

අල්ලස ප්‍රතික්ෂේප කරනු! රක්ෂණ, විශ්‍රාම වැටුප්, ණය සහ වීසා පිළිබඳ රජයේ පොරොන්දුව ඔබේ යදම් සදහා ගෙවන මිලයි. කිසිදු ද්‍රව්‍යමය දිරිගැන්වීමක් මාධ්‍ය නිදහස පාවා දීමට තරම් වන්නේ නැත! පි.8

## "ආයෙත් නම් කවදාවත් එපා" – යාපනය මහජන පුස්තකාලය ගිනිබත් කිරීමේ 45 වැනි සමරුව

කලකට ඉහතදී ගින්නෙන් වෙලාගෙන තිබුණ, මේ විශිෂ්ට ස්මාරකයේ බිත්ති **දෙස** බලාගෙන අද දවසේ අපි මෙතන ඉඳන් ශබ්ද නඟලා කියන්න ඕනේ, "ආයෙත් නම් කවදාවත් එපා" (Never Again) කියලා. තවත් නම් එපා කියන එකේ ඇත්තම තේරුම වෙන්න ඕනේ: ආයෙ කවදාවත් පුස්තකාල පුච්චන්න දෙන්න බැහැ. ආයෙ කවදාවත් කළු ජූලියක් වෙන්න දෙන්න බැහැ. ආයෙ කවදාවත් මුල්ලිවයික්කාල් එකක් වෙන්න දෙන්න බැහැ කියන එකයි. පි.11

 ISSN 3093-6217

# දිසානායක ආණ්ඩුවේ "වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය" - මාධ්‍ය නිදහසේ ගෙල සිර කිරීමේ සැලසුමක්

**ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ (SLLA) ප්‍රකාශය.**

මෙම ප්‍රකාශය *2026 ජුනි 16* දින *theSocialist.LK* වෙබ් අඩවියේ ඉංග්‍රීසි බසින් *'The Dissanayake Government's "Chartered Institute of Media Professionals": A Blueprint for the Strangulation of Press Freedom'* යන සිරසින් පළ කෙරිණි.

2026 ජුනි 5 වන දින, ජනාධිපති අනුර කුමාර දිසානායකගේ ජනතා විමුක්ති පෙරමුණ (ජවිපෙ)/ජාතික ජන බලවේගය (ජජබ) රජය විසින් "ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය" පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතක් විශේෂ ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද මෙම පනත් කෙටුම්පත, "වෘත්තීය ප්‍රමිතීන් හඳුන්වා දීම සහ පවත්වාගෙන යාම" සහ "ගුණාත්මකභාවය ඉහළ නැංවීම" වැනි මෘදු වචනවලින් සරසා ඇත. නමුත් මෙය සැබවින්ම සැලසුම්සහගත වංචාවකි. මෙම පනතේ අඩංගු විශේෂ කොන්දේසි, එනම් එහි අර්ථ නිරූපණයන්, ආයතනික ව්‍යුහය සහ විනය ක්‍රියාමාර්ග පිළිබඳව සමීපව පරීක්ෂා කිරීමේදී පැහැදිලි වන්නේ, මෙය ස්වාධීන මාධ්‍යය මර්දනය කිරීමට, නිහඬ කිරීමට සහ අවසානයේදී සහමුලින්ම තුරන් කිරීමට අවශ්‍ය රාජ්‍ය වාරණයේ මෙවලමක් බවයි. විශේෂයෙන්ම, එය හෙළිදරව් කරන්නේ දිසානායක පාලන තන්ත්‍රය විසින් තම බලය පවත්වාගෙන යාමට මාරාන්තික තර්ජනයක් ලෙස දකින සමාජ මාධ්‍ය අන්තර්ගත නිර්මාණකරුවන් (social media content creators) සහ රජයට විරුද්ධව අදහස් දක්වන්නන් ඉලක්ක කර ගැනීමට මෙම පනත සකස් කෙරෙන බවයි.

කම්කරු පන්තිය සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කරන සියලු දෙනා මෙම පනත් කෙටුම්පත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කළ යුතුය. මෙය මාධ්‍යවේදය (journalism) දියුණු කිරීම සඳහා ගත් පියවරක් නොවේ. මෙය ශ්‍රී ලංකාවේ මාධ්‍ය මර්දනයේ දිගුකාලීන සහ ලේවැකි ඉතිහාසයට සෘජුවම සම්බන්ධ වෙමින්, ප්‍රජාතන්ත්‍රවාදී සංවාදයන් යටපත් කිරීම සඳහා නිර්මාණය කරන ලද ආයුධයකි. එමෙන්ම, මෙය ලොව පුරා ධනේශ්වර රජයන් විසින් මාධ්‍ය නිදහසට එරෙහිව දියත් කරනු ලබන ජාත්‍යන්තර ප්‍රහාරයන් සමග ද සම්පූර්ණයෙන්ම ගැලපෙන්නකි.

**රාජ්‍ය විසින් පාලනය කිරීමේ ව්‍යුහය**

මෙම පනත් කෙටුම්පත හරහා නීතිය මගින් පිහිටුවන ආයතනයක්, එනම් මෙම "වරලත් ආයතනය" (Chartered Institute) පිහිටුවනු ලබයි. එහි ව්‍යුහය දෙස බැලීමේදී පැහැදිලි වන්නේ සුජාතභාවයකින් මාධ්‍ය කලාවේ නිරත විය හැක්කේ කාටද යන්න තීරණය කිරීම සඳහා රාජ්‍යය විසින් පාලනය කරනු ලබන දොරටු පාලකයෙකු (Gatekeeper) ලෙස ක්‍රියා කිරීමට මෙය නිර්මාණය කර ඇති බවයි. මෙම නීති සම්පාදනයේ ඇති ලක්ෂණ පහක් මගින් එහි අධිපතිවාදී ස්වභාවය පිළිබඳව කිසිදු සැකයකින් තොරව සනාථ කරයි.

**පළමුවැන්න නම්, මෙම ආයතනය විසින් රාජ්‍යය මගින් නිර්මාණය කරන ලද නිල පිළිගැනීමේ (ප්‍රතීතන) ක්‍රමවේදයක් (accreditation system) හඳුන්වා දීමයි.** 3(එ) වගන්තිය මගින් ප්‍රකාශ කරනු ලබන්නේ, මෙම ආයතනයේ එක් අරමුණක් වන්නේ "මාධ්‍යවේදීන්ගේ කාර්යක්ෂමතාව ඇගයීමේ දී මාධ්‍ය වෘත්තීය භාවයෙන් යුත් මාධ්‍ය වෘත්තිකයන් පිළිගැනීමට ලක්කිරීම" බවයි. 4(ච) වගන්තිය මගින් "මාධ්‍ය ක්ෂේත්‍රයේ වෘත්තීමය ප්‍රමිති හඳුන්වා දීම, එම ප්‍රමිති සංවර්ධනය කිරීම, පවත්වාගෙන යාම සහ අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම" ට ආයතනයට බලය පවරා ඇත. එමෙන්ම 4(ත) වගන්තිය මගින් "ආයතනයේ සාමාජික නාමලේඛනයක් පවත්වාගෙන යාම සහ ප්‍රකාශයට පත් කිරීම" ට එයට අවසර ලබා දී ඇත. මෙම කොන්දේසි සියල්ල එකට ගත් කල, අදහස් ප්‍රකාශ කිරීමේ මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම, රාජ්‍යය විසින් අනුමත කරනු ලබන වරප්‍රසාදයක් බවට පරිවර්තනය කරයි. "සුදුසුකම් ලත්" මාධ්‍යවේදියෙකු ලෙස ඇතුළත් කර ගත හැක්කේ, ලියාපදිංචි කළ හැක්කේ සහ සහතික කළ හැක්කේ කාවද යන්න තීරණය කරන අවසාන තීරක ලෙස රජය මෙහිදී පෙනී සිටියි. **මාධ්‍ය නිදහස යනු නෛසර්ගිකව හිමිවන අයිතිවාසිකමක් වන අතර, එය ධනේශ්වර රාජ්‍යය විසින් ලබා දෙන හෝ අවලංගු කරන බලපත්‍රයක් නොවේ.** මෙම පනත් කෙටුම්පතේ මූලික පදනමම මෙම මූලධර්මයට එල්ල කරන ලද ප්‍රහාරයක් වේ.

**දෙවැන්න නම්, 'මාධ්‍ය වෘත්තිකයන් (media professional)" යන්න සඳහා දී ඇති අර්ථ නිරූපණය හිතාමතාම අතිශය පුළුල් සහ සියල්ල ඇතුළත් වන පරිදි සකස් කර තිබීමයි.** 27 වන වගන්තිය මගින් මාධ්‍ය වෘත්තිකයන්" යන්න අර්ථ දක්වා ඇත්තේ "මාධ්‍ය ක්ෂේත්‍රයේ ලේඛකයන්, අන්තර්ගතය තනන්නන්, අන්තර්ගත සංස්කාරකවරුන්, නිවේදකයන්, ඉදිරිපත් කරන්නන්, මාධ්‍ය විකාශකයන්, පුවත්පත් කලාවේදීන්, සංස්කාරකවරුන්, ප්‍රකාශකයන්, මාධ්‍ය

හිම්කරුවන්, මාධ්‍ය කළමනාකරුවන්, මාධ්‍ය අධ්‍යාපනය ලබා දෙන තැනැත්තන්, මාධ්‍ය පයේෂකයන්, මාධ්‍ය තාක්ෂණවේදීන් සහ ඡායාරූප ශිල්පීන්" ද ඇතුළත් වන පරිදිය. මෙහි "අන්තර්ගතය තනන්නන්" (content creators) ඇතුළත් කර තිබීම විශේෂයෙන්ම අවධානයට ලක්විය යුතුය. මෙම දැල මෙතරම් පුළුල් ලෙස එළා ඇත්තේ නිශ්චිත අරමුණක් ඇතිව ය: එනම් ස්වාධීන බ්ලොග්කරුවන් (bloggers), සමාජ මාධ්‍ය අදහස් දක්වන්නන් සහ විකල්ප වාමාංශික



ජනාධිපති අනුර කුමාර දිසානායක 2026 අප්‍රේල් 2 වන දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී, මෙරට සංචාරයක නිරත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) දූත පිරිසක් හමුවූ අවස්ථාව. ඡායාරූපය midpoint.lk අනුග්‍රහයෙනි.

මාධ්‍ය ජාලයන් රාජ්‍යයේ විනය පාලන යාන්ත්‍රණයට හසු කර ගැනීම සඳහා ය. දිසානායක පාලන තන්ත්‍රය කිසිදු පාර්ශවයකට සම්බන්ධ නැති ස්වාධීන අන්තර්ජාල මාධ්‍ය පිළිබඳව දැඩි බියක් දක්වයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාරාවේ ආයතනික මාධ්‍ය ජාලයන් පාලනය වන්නේ පරපුටු කථිකයාධිපත්‍යයක් (oligarchy) හෝ රාජ්‍යය විසින්ම ය. කම්කරු පන්තියේ පීඩනය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කප්පාදු පියවරයන්ට රජය අනුගත වීම හෙළිදරව් කිරීම සහ සමාජවාදී දේශපාලන විශ්ලේෂණයන් ප්‍රකාශයට පත් වන්නේ විකල්ප අන්තර්ගත නිර්මාණකරුවන් සහ ස්වාධීන සමාජ මාධ්‍ය නාලිකා හරහා ය. මෙම "අන්තර්ගතය තනන්නන්" ව්‍යවස්ථාපිත රාජ්‍ය යාන්ත්‍රණයක පාලනයට යටත් කිරීම මගින්, රජය සූදානම් වන්නේ හරියටම මෙම හඬවල් නිහඬ කිරීම සඳහා ආයුධයක් නිර්මාණය කිරීමට ය.

**තෙවැන්න නම්, "වෘත්තීමය විගමාචාර ක්‍රියාවක්" පිළිබඳව විමර්ශනය කිරීම සඳහා රාජ්‍යය විසින් අනුමත කරන ලද විනය කමිටුවක් මෙම පනත් කෙටුම්පත මගින් පිහිටුවීම යි.** 12(1)(c) වගන්තිය මගින් විනය කමිටුවක් පත් කිරීම සඳහා විධිවිදාන සලසා ඇත. 23(1) වගන්තිය මගින් ප්‍රතිපාදන සලසන්නේ, "විනය කමිටුව විසින්, ආයතනයේ සමාජිකයකුගේ වෘත්තීමය විෂමාචාර ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනය විසින් විනය කමිටුව වෙත යම් කාරණයක් යොමු කරනු ලබන ඕනෑම අවස්ථාවක දී, පරීක්ෂණයක් පවත්වනු ලැබිය යුතු" බවයි. ඉන්පසුව 23(2) වගන්තිය මගින් "**වෘත්තීමය විගමාචාර ක්‍රියාවක්**" යන්න අර්ථ දක්වා ඇත්තේ "26 වන වගන්තිය යටතේ සභාව විසින් සාදනු ලබන රීති මගින් නිශ්චය කරනු ලැබිය යුතු යම් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් අදහස් වන" බවයි. මෙම අර්ථ නිරූපණය කෙතරම් කවාකාර සහ නම්‍යශීලී එකක්ද යත්, එය රජයේ වැඩපිළිවෙළට ගැට නොගැසෙන මාධ්‍යවේදීන්ට දේශපාලනික වශයෙන් දඬුවම් කිරීම සඳහා ලබා දී ඇති අසීමිත බලපත්‍රයක් හා සමාන වේ. 24 වන වගන්තිය මගින් "සාමාජිකයෙකුගේ නම ලියාපදිංචියෙන් ඉවත් කිරීම" වෙනුවට "අනතුරු ඇඟවීම, අවවාද කිරීම හෝ වසරකට නොවැඩි යම් කාල සීමාවක් සඳහා ඔහුගේ සාමාජිකත්වය අත් හිරුවීම සිදු කළ" හැකි බලය සභාවට පවරා ඇත. මාධ්‍ය සේවකයෙකුගේ වෘත්තීය සුදුසුකම් (credentials) අහෝසි කිරීමට ඇති බලය යනු ඔහුගේ වෘත්තීය ජීවිතය විනාශ කිරීමට ඇති බලය වන අතර, එය රටේ සිටින අනෙකුත් සෑම මාධ්‍යවේදියෙකුටම භීතියක් ඇති කිරීම සඳහා යවන පණිවිඩයකි.

**හතරවැන්න නම්, මෙම පනත් කෙටුම්පත මගින් සම්පූර්ණයෙන්ම රාජ්‍යය විසින් පත් කරනු ලබන 'අතුරු සභාවක්' (Interim Council) පිහිටුවීමයි.** පාලක සභාව තේරී පත්වන තෙක්, අමාත්‍යවරයා විසින් "අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" සහ "මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රත්‍යක්ෂ වූ දැනුම, විශිෂ්ටත්වය සහ අවම වශයෙන් වසර විස්සක පළපුරුද්ද සහිත ප්‍රකට තැනැත්තන් හය දෙනෙකු" ගෙන් සමන්විත අතුරු සභාවක් පත් කළ යුතු බව 5(4)(අ) වගන්තිය මඟින් විධිවිධාන සලසයි."තෝරාගත යුතු සාමාජිකයන් ගණන සහ ආයතන වෙත එකී සාමාජිකයන් තෝරා ගනු ලබන නිර්ණායක පිළිබඳව" මෙන්ම "සභාවට සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ පත් කර ගැනීම" සඳහා නීති සම්පාදනය කිරීමේ බලය 5(4)(ආ) වගන්තිය යටතේ මෙම අතුරු සභාවට පවරා ඇත. ඒ අනුව, ප්‍රථම අවස්ථාවේදීම මෙම ආයතනයට ඇතුළත් වන්නේ කවුරුන්ද යන්න සහ එහි ස්ථිර පාලක සභාවේ අසුන් ගන්නේ කවුරුන්ද යන්න පාලනය කරනු ලබන්නේ මෙම අතුරු සභාව විසිනි. සාමාජිකත්ව නිර්ණායක, අභ්‍යන්තර නීති රීති සහ වරදක් සංස්ථාපනය වීම අර්ථ නිරූපණය කිරීම ඇතුළු සමස්ත ආයතනික ව්‍යුහයම මුළුමනින්ම හැඩගස්වනු ලබන්නේ ධනේශ්වර

රාජ්‍යයේ දේශපාලන පත්වීම්ලාභීන් විසිනි. මේ ආකාරයට, මෙම ආයතනය එහි ආරම්භයේ සිටම රජයේ මෙවලමක් වනු ඇත.

**පස්වනුව, මාධ්‍යවේදයේ නිරත වීම සඳහා මෙම ආයතනයේ සාමාජිකත්වය ලැබීම කිසිසේත්ම අත්‍යවශ්‍ය පූර්ව අවශ්‍යතාවක් නොවන බවට වන කිසිදු පැහැදිලි සහතිකයක් මෙම පනත් කෙටුම්පත තුළ කැපී පෙනෙන ලෙස ඇතුළත් වී නොමැත.**

මෙම මඟ හැරීම අහම්බයක් නොවේ. එමඟින් සංඥා කරනු ලබන්නේ මෙම ආයතනය අනිවාර්ය දොරටු පාලකයෙකු (පෙරහනක්) බවට පත් කිරීම සඳහා සැලසුම් කර ඇති බවයි. ලියාපදිංචි නොවූ හෝ ලියාපදිංචිය අවලංගු කරන ලද මාධ්‍යවේදීන්ට මාධ්‍ය සාකච්ඡාවලට සහභාගී වීම, රාජ්‍ය මාධ්‍ය ප්‍රතීතනය (accreditation) ලබා ගැනීම, පොදු අවස්ථා ආවරණය සඳහා ප්‍රවේශ වීම හෝ රැකියා සුරක්ෂිත කර ගැනීම නීතිමය වශයෙන් අවහිර වන තත්ත්වයකට ඉතා ඉක්මනින් මුහුණ දීමට සිදු වනු ඇත. මෙම ආයතනය යනු ප්‍රායෝගික වශයෙන් මාධ්‍යවේදය සඳහා බලපත්‍ර පැනවීමේ යාන්ත්‍රණයකි. එබැවින් එය රාජ්‍යයට අපහසුතාවක් ලෙස සැලකෙන මාධ්‍යවේදීන් ප්‍රායෝගික වශයෙන් තහනම් කිරීමේ උපක්‍රමයකි.

**අඛණ්ඩව සිදුවන මර්දනය**

වරලත් ආයතන පනත් කෙටුම්පත රික්තකයක් තුළින් මතුවූවක් නොවේ. එය දශක ගණනාවක් ඈතට දිවයන සහ සෑම ධනේශ්වර ආණ්ඩුවක් හරහාම ක්‍රියාත්මක වූ, ශ්‍රී ලංකාවේ මාධ්‍ය නිදහසට එල්ල වූ රාජ්‍ය මර්දන දාමයක (ප්‍රහාර මාලාවක) නවතම පියවරයි.

ලංකා සමසමාජ පක්ෂය සහ ස්ටාලින්වාදී කොමියුනිස්ට් පක්ෂය ද ඇතුළත් වූ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නායකත්වය දුන් සභාග ආණ්ඩුව විසින් 1973 දී හඳුන්වා දෙන ලද පුවත්පත් මණ්ඩල පනත මඟින්, මාධ්‍යවේදීන්ට එරෙහිව දඩ සහ සිරදඬුවම් (15, 16, 31 වන වගන්ති) නියම කිරීමට යොමු කෙරෙන විමර්ශණ සිදු කිරීමට හැකි දිස්ත්‍රික් උසාවියක බලතලවලින් යුත් (11 වන වගන්තිය) රජයේ විනිශ්චය සභාවක් පිහිටුවන ලදී. එහි සභාපතිවරයා සහ සාමාජිකයන් පත් කරනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි. සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ පුවත්පත වූ "කම්කරු මාවත" ද එහි ඉලක්කයන් අතර විය. නවීන ඩිජිටල්, විද්‍යුත් සහ මාර්ගගත (online) මාධ්‍ය ජාලයන් ද ඇතුළත් වන පරිදි පුවත්පත් මණ්ඩල පනතේ නියාමන සීමාවන් පුළුල් කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය හිමි වූ බව පසුගිය සැප්තැම්බර් මාසයේදී කැබිනට් ප්‍රකාශකවරයා නිවේදනය කළේය. මෙහි ඇති ඓතිහාසික උත්ප්‍රාසය ඉතා දැඩි ය: 1971 අසාර්ථක නැඟිටීමෙන් පසුව තම සාමාජිකයන් දහස් ගණනින් ඝාතනයට ලක් වූ ජනතා විමුක්ති පෙරමුණ (ජවිපෙ), එදා තමන්ව මර්දනය කළ පාලන තන්ත්‍රය විසින් මුල් වරට හඳුන්වා දෙන ලද එම මාධ්‍ය පාලන යාන්ත්‍රණයන්ම අද දින කම්කරු පන්තියට සහ ඔවුන්ගේ දේශපාලන නියෝජිතයන්ට එරෙහිව භාවිත කරමින් සිටියි.

රාජපක්ෂ පාලන තන්ත්‍රය (2005-2015) මාධ්‍ය මර්දනය පොලිස් රාජ්‍යයක මට්ටම දක්වා දැඩි කළේය. 2009 වසරේදී එම පාලනය විසින් පුවත්පත් මණ්ඩල පනත නැවත බලාත්මක කරන ලදී. 2012 වසරේදී වෙබ් අඩවිවල හඬ අවහිර කිරීමට පියවර ගත් එය, පුවත්පත් මණ්ඩලයේ බලපෑම අන්තර්ජාල මාධ්‍ය වෙතද ව්‍යාප්ත කළේය. 2013 දී ඔවුන් "මාධ්‍ය සදාචාර සංග්‍රහයක්" ප්‍රකාශයට පත් කළ අතර, එහි වූ අපැහැදිලි වගන්ති මඟින්, එනම් "මහජන බලාපොරොත්තු කඩවන" හෝ "මහජනයා නොමඟ යැවිය හැකි තොරතුරු ඇතුළත්" ප්‍රකාශන තහනම් කිරීම වැනි කරුණු හරහා විවේචන මර්දනය කිරීම සඳහා රජයට අසීමිත අවස්ථාවක් ලබා දුන්නේය. මෙම කාල වකවානුව තුළ, රජයට පක්ෂපාතී ඝාතක කණ්ඩායම් විසින් මාධ්‍යවේදීන් සහ මාධ්‍ය කම්කරුවන් 16 දෙනෙකු ඝාතනය කරන ලද අතර, "සන්ඩේ ලීඩර්" පුවත්පතේ කර්තෘ ලසන්ත වික්‍රමතුංග දහවලේ මහමඟදී ඝාතනයට කෙරුණි.

ව්‍යාජ පුවත් මැඩපැවැත්වීමේ නාමයෙන් 2024 ජනවාරි මාසයේදී රනිල් වික්‍රමසිංහ ආණ්ඩුව විසින් ගෙන ආ මාර්ගගත සුරක්ෂිතතාව පිළිබඳ පනත (Online Safety Act), සමාජ මාධ්‍ය ක්‍රියාකාරීත්වයට දැඩි ලෙස බලපෑම් එල්ල කළේය. අන්තර්ජාලය ඔස්සේ සිදුකරන ප්‍රකාශ නියාමනය කිරීමට සහ වාරණය කිරීමට රජය විසින් පත් කරන ලද කොමිෂන් සභාවකට පුළුල් බලතල ලබා දීමෙන්, මෙම පනත අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට විශාල පහරක් එල්ල කළේය. අන්තර්ජාලය හරහා සිදුවන හානි වැළැක්වීමේ මුවාවෙන්, මෙම නීතිය මගින් යුක්තිසහගත විරෝධතා, ගවේෂණාත්මක මාධ්‍යවේදය සහ සමාජ මාධ්‍ය විවේචන සාපරාධී ක්‍රියා බවට පත් කරනු ලබන අතර, ක්‍රියාකාරීන්ට සහ අන්තර්ගත නිර්මාණකරුවන්ට (content creators) දැඩි සිරදඬුවම් පමුණුවන බවට තර්ජනය මතු කරයි.

ජනතා විමුක්ති පෙරමුණ/ජාතික ජන බලවේග (JVP/NPP) ආණ්ඩුව මෙම අධිපතිවාදී උරුමයෙන් බැහැර වනවා නොව, එය තවදුරටත් දැඩි කරමින් සිටියි. 2024 නොවැම්බර් මාසයේදී, බලයට පත්වී සති කිහිපයක් ඇතුළත, මැතිවරණ ව්‍යාපාරය අතරතුර පොරොන්දු වී තිබුණද, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) අහෝසි නොකරන බව එය නිවේදනය කළේය. ඒ වෙනුවට, එය "ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත" (PSAT) නමින් නව පනතක් හඳුන්වා දුන් අතර, එමඟින් වර්ජන, විරෝධතා සහ විරුද්ධ මතධාරීන්ගේ ක්‍රියාකාරකම් ද ඇතුළත් වන පරිදි ත්‍රස්තවාදය පිළිබඳ අර්ථ දැක්වීම තවදුරටත් පුළුල් කර ඇත. 2025 නොවැම්බර් මාසයේදී, දිට්වා (Ditwah) සුළි කුණාටුවෙන් පසුව, දිසානායක විසින් හදිසි අවස්ථා තත්ත්වයක් ප්‍රකාශයට පත් කරන ලද අතර, "මහජන කැළඹීමක්" ඇති කළ හැකි යැයි කියනු ලබන ඕනෑම "අසත්‍ය" ප්‍රකාශයක් සන්නිවේදනය කිරීම හෝ ප්‍රකාශයට පත් කිරීම වසර දහයක් දක්වා සිරදඬුවම් ලැබිය හැකි අපරාධ

වරදක් බවට පත් කරමින් රෙගුලාසි පනවනු ලැබීය. නියෝජ්‍ය අමාත්‍ය සුනිල් වටගල විසින්, සමාජ මාධ්‍ය විවේචකයන් "සැකකරුවන් ලෙස පමණක් නොව වැරදිකරුවන් ලෙස" සලකන ලෙස පොලිසියට පැහැදිලිවම උපදෙස් ලබා දෙන ලදී. මෙම බලතල භාවිත කරන ලද්දේ "නැවත ගොඩනැඟීමේ" මුවාවෙන් වඩාත් දරුණු කප්පාදු ප්‍රතිපත්ති බලාත්මක කිරීම සඳහාය. ආණ්ඩුව හදිසි අවස්ථා තත්ත්වය මේ වන විට හය වතාවක් [1] දීර්ඝ කර ඇති අතර, එමඟින් දිසානායක වෙත අසීමිත ඒකාධිපති බලතල පැවරී ඇත.

2026 මැයි 28 වන දින, එනම් වරලත් ආයතන (Chartered Institute) පනත් කෙටුම්පත් ගැසට් පත්‍රය නිකුත් කිරීමට සතියකට පෙර, ජනාධිපති දිසානායක විසින් රජයේ මුද්‍රණාලය සහ රාජ්‍ය මාධ්‍ය අත්‍යවශ්‍ය සේවාවන් බවට පත් කරමින් විශේෂ ගැසට් නිවේදනයක් නිකුත් කළ අතර, එමඟින් එම ක්ෂේත්‍රයන්හි සිදුවන කාර්මික වර්ජන ක්‍රියාමාර්ග සඵල ලෙස (effectively) නීති විරෝධී කරනු ලැබීය. වරලත් ආයතන පනත් කෙටුම්පත යනු මෙම දැඩි ක්‍රියාමාර්ගයේ මතවාදී සමගාමී පියවර වේ. මේවායේ එකතුව දඬු අඬුවක් බඳු තත්ත්වයක් නිර්මාණය කරයි: රජය විසින් මාධ්‍ය කම්කරුවන්ගේ වැඩ වර්ජනය කිරීමේ අයිතියට ප්‍රහාර එල්ල කරන අතරම, එම සේවකයන්ට ලිවිය හැක්කේ මොනවාද සහ ලිවිය හැක්කේ කාටද යන්න පාලනය කිරීම සඳහා විනය පාලන යාන්ත්‍රණයක් ද ඒ සමඟම ගොඩනඟයි.

**මාධ්‍ය නිදහසට එරෙහි ජාත්‍යන්තර ප්‍රහාරය**

දිසානායක රජයේ මෙම පනත් කෙටුම්පත, මුද්‍රිත මාධ්‍ය සහ විශේෂයෙන්ම මාර්ගගත (online) මාධ්‍ය, රාජ්‍ය හා ආයතනික පාලනය යටතට පත් කිරීම සඳහා ධනේශ්වර රාජ්‍යයන් විසින් දියත් කරනු ලබන ගෝලීය ප්‍රහාරයක කොටසකි.

2010 දෙසැම්බර් මාසයේදී, අග්‍රාමාත්‍ය වික්ටර් ඕර්බන් (Viktor Orbán) යටතේ පැවති හන්ගේරියානු පාර්ලිමේන්තුව, සියලුම රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ආයතන ඕර්බන්ගේ පාක්ෂිකයන්ගෙන් සැදුම්ලත් රාජ්‍ය "මාධ්‍ය කවුන්සිලයක" පාලනයට නතු කරමින් පුළුල් මාධ්‍ය නීතියක් සම්මත කළේය. "දේශපාලනිකව සමබර නොවන" බවට තීරණය කරනු ලබන වාර්තාකරණයන් සඳහා යුරෝ 730,000ක් දක්වා දඩ පැනවීමට එම කවුන්සිලයට බලය පවරා තිබුණි. ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) එකල පෙන්වා දුන් පරිදි [2], ඕර්බන්ගේ මෙම ඒකාධිපති ගමන "යුරෝපීය සුවිශේෂී තත්ත්වයක්" නොව, ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළවල් විසින් ඉල්ලා සිටි "දරුණු සමාජයීය ප්‍රහාරයන්ගේ නව වටයක්" සඳහා වූ සූදානමකි. මාධ්‍ය මුඛවාඩම් බැඳීම සහ රාජ්‍ය යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සිදුකරන ලද්දේ, සමාජ කප්පාදු හේතුවෙන් ඇතිවිය හැකි සමාජ ගැටුම් සෘජුවම අපේක්ෂා කරමිනි.

2018 වසරේදී බලාත්මක වූ ජර්මනියේ ජාල බලාත්මක කිරීමේ පනත (NetzDG), "වෛරී ප්‍රකාශ" සහ "අසත්‍ය පුවත්" වලට එරෙහිව සටන් කිරීමේ මුවාවෙන් අන්තර්ජාල වාරණයක් සඳහා අවශ්‍ය නීතිමය රාමුව සකස් කර දුන්නේය. ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) ලේඛනගත කර ඇති පරිදි [3], මෙම නීතිය" වාමාංශික සහ සමාජවාදී අදහස් මර්දනය කිරීම අරමුණු කරගනිමින්, අන්තර්ජාලය තුළ අදහස් ප්‍රකාශ කිරීමේ නිදහසට ප්‍රහාර එල්ල කිරීම සඳහා දියත් කළ ජාත්‍යන්තර මර්දනකාරී පියවරක කොටසක්" විය.

2022 වසරේදී, බ්‍රිතාන්‍යයේ ඔෆ්කොම් (Ofcom) ආයතනය විසින් "නිෂ්පාක්ෂිකභාවය" සහ "නිදහස" යන වචන භාවිත කරමින්, ආර්.ටී (RT) නාලිකාවේ විකාශන බලපත්‍ර අවලංගු කරන ලදී. 2025 වසරේදී, රුසියාවට එරෙහිව යුරෝපා සංගමය විසින් පනවන ලද 17 වන සම්බාධක පැකේජය මඟින් රුසියානු හිතවාදී සහ පලස්තීන හිතවාදී මාධ්‍ය තහනම් කිරීම දක්වා එය තවදුරටත් පුළුල් කෙරිණි. ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) මෙය හැඳින්වූයේ [4] "මාධ්‍ය නිදහස සඳහා වූ ප්‍රජාතන්ත්‍රවාදී අයිතියට එල්ල කළ විවෘත ප්‍රහාරයක්" ලෙසය.

එහි රටාව ඉතා පැහැදිලිය. ලොව පුරා වර්ධනය වන සමාජ විරෝධතාවලට මුහුණ දෙන ධනවාදී ආණ්ඩු, පොදු සමාජ කතිකාවන් පාලනය කිරීම සඳහා නෛතික හා ආයතනික යාන්ත්‍රණයන් ගොඩනඟමින් සිටී. ඒ සඳහා ඔවුන් නිරන්තරයෙන් භාවිත කරන්නේ "වෘත්තීය ප්‍රමිතීන්," "ආචාර ධර්ම," සහ "අසත්‍ය තොරතුරු මර්දනය කිරීම" වැනි එකම ආකාරයේ වදන් මාලාවකි. නමුත් මෙහි එකම අරමුණ වන්නේ කම්කරු පන්තියේ විරෝධය සහ ධනවාදයට එරෙහි විග්‍රහයන් යටපත් කිරීමයි.

**කප්පාදු කිරීමේ ප්‍රතිපත්ති සඳහා මර්දනය අවශ්‍යය**

වරලත් ආයතන පනත් කෙටුම්පත ජනතා විමුක්ති පෙරමුණ/ජාතික ජන බලවේග (JVP/NPP) ආණ්ඩුවේ පුළුල් ගමන් මඟෙන් බැහැර කර තනිව වටහා ගත නොහැක. දිසානායක 2024 සැප්තැම්බර් මාසයේදී බලයට පත්වූයේ, පවතින දේශපාලන ක්‍රමයට එරෙහි බාහිර පුද්ගලයෙකු ලෙස පෙනී සිටිමින්, ජනතා අප්‍රසාදයේ රැල්ලක් මත ය. කෙසේ වෙතත්, නව පාර්ලිමේන්තුව රැස්වී දින කිහිපයක් ඇතුළත, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) මූල්‍ය ඇප දී ගලවා ගැනීමේ (bailout) වැඩසටහන නැවත සාකච්ඡා කරන බවට වූ තම මැතිවරණ පොරොන්දුව [5] අතහැර දැමූ ආණ්ඩුව, එම වැය කප්පාදු වැඩසටහන සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීමට කැපවිය.

එතැන් පටන් වාර්තා වී ඇත්තේ කම්කරු පන්තියට එරෙහිව එල්ල වූ නොනවතින ප්‍රහාරයන් ය. ජනගහනයෙන් හතරෙන් එකක් දරිද්‍රතා රේඛාවෙන් පහළට වැටී සිටින තත්ත්වයක් තුළ පවා, ආණ්ඩුව රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීම සහ පෞද්ගලීකරණය කිරීම සිදුකර ඇති අතර, 2026 පෙබරවාරි මාසයේ

සිට ඉන්ධන මිල දළ වශයෙන් සියයට 40කින් ද, විදුලි ගාස්තු සියයට 32කින් ද, ගෑස් මිල සියයට 31කින් ද ශීඝ්‍රයෙන් ඉහළ නංවා, දැඩි වියදම් සීමාවන් පවත්වාගෙන ගොස් ඇත. 2026 අප්‍රේල් මාසයේදී ලංකාවට පැමිණි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) නියෝජිත පිරිසක්, දිසානායක “IMF නියෝගයන් දැඩි ලෙස අනුගමනය කිරීම” [6] අගය කරමින් ඔහුව ඉහළින්ම ප්‍රශංසාවට ලක් කළේය. එහිදී ජනාධිපතිවරයා ද “මෙම වැඩසටහන යටතේ නියම කර තිබූ සියලුම ඉලක්ක ශ්‍රී ලංකාව සපුරා ඇති බව” පවසමින් උදම් ඇනීය.

ආණ්ඩුව මේ වන විට බරපතල වෙමින් පවතින අර්බුදයකට මුහුණ දී සිටී [7]. එනම්, ගෙවුම් ශේෂ හිඟය තවදුරටත් නරක අතට හැරීම, රුපියලේ අගය පහත වැටීම, ඉරානයට එරෙහිව ඇමරිකානු-ඊශ්‍රායල යුද්ධය හේතුවෙන් තෙල් ආනයන වියදම් ශීඝ්‍රයෙන් ඉහළ යාම සහ කම්කරුවන් මෙන්ම ග්‍රාමීය දුප්පත් ජනතාවගෙන් මතුවන කැකෑරෙන විරෝධයයි. ආණ්ඩුව මීට ප්‍රතිචාර දක්වා ඇත්තේ අත්‍යවශ්‍ය සේවා නියෝග පැනවීම, විරෝධතාකරුවන්ට එරෙහිව පොලිස් ප්‍රචණ්ඩත්වය මුදාහැරීම, ශිෂ්‍ය ක්‍රියාකාරීන් අත්අඩංගුවට ගැනීම, වර්ජන මර්දනය සඳහා හමුදාව යෙදවීම සහ හදිසි නීතිය යටතේ පාලනය දිගින් දිගටම දීර්ඝ කිරීම මඟිනි. වරලත් ආයතන පනත් කෙටුම්පත යනු මෙම ඒකාධිපති ගමන් මඟෙහි මෑතකදීම ගනු ලැබූ දරුණුතම ඉදිරි පියවරයි. එනම්, එය සත්‍යය ප්‍රචාරය වීමට එරෙහිව ද, වැඩකරන ජනතාවගේ සැබෑ තත්ත්වය හෙළිදරව් කරන සහ කම්කරු පන්තිය එක්සත් විප්ලවවාදී බලවේගයක් ලෙස සංවිධානය වීමට අවශ්‍ය දේශපාලන විග්‍රහයන් සපයන මාධ්‍යවේදයට එරෙහිව ද, පූර්ව සූදානමකින් යුතුව එල්ල කරන ලද ප්‍රහාරයකි.

### ජනතා විමුක්ති පෙරමුණ (JVP): ඝාතක කණ්ඩායම්වල සිට “වෘත්තීය ප්‍රමිතීන්” දක්වා

මාධ්‍ය වාරණය ක්‍රියාත්මක කරන්නා ලෙස ජනතා විමුක්ති පෙරමුණේ (JVP) වත්මන් භූමිකාව වටහා ගත යුත්තේ එහි දේශපාලන ඉතිහාසය ආශ්‍රයෙන් ය. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI) සහ ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) දශක ගණනාවක් තිස්සේ ලේඛනගත කර ඇති පරිදි [8], ජනතා විමුක්ති පෙරමුණ යනු සමාජවාදී හෝ කම්කරු පක්ෂයක් නොවන අතර එය කිසිදාක එවැන්නක් වී ද නැත. එය සිංහල ජනතාවාදය මත පදනම් වූ, දක්ෂිණාංශික, ජාතිකවාදී සහ වාර්ගිකවාදී (communalist) ව්‍යාපාරයකි. 1988-89 කාලසීමාවේදී එය (ජනතා විමුක්ති පෙරමුණ) දේශපාලන ඝාතන ව්‍යාපාරයක් දියත් කළ අතර, එහිදී විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ සාමාජිකයන් ඇතුළු වාමාංශික දේශපාලන විරුද්ධවාදීන්, වෘත්තීය සමිති නායකයන් සහ කම්කරුවන් සිය ගණනක් ඝාතනය කෙරිණි. එමෙන්ම, 2009 මැයි මාසයේදී දෙමළ ජනතාව 40,000ක් සමූල ඝාතනය කිරීමෙන් කෙළවර වූ, දෙමළ සුළුතරයට එරෙහි ජාතිවාදී යුද්ධයේ දැඩිම සහ ප්‍රබලම ප්‍රකාශකයා වූයේ ද මෙම ව්‍යාපාරයයි.

**ජනතා විමුක්ති පෙරමුණ (JVP), ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැය කප්පාදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන, පොලිස්-හමුදා මර්දනය මුදාහරින සහ දැන් මාධ්‍ය වාරණය සඳහා රාජ්‍ය යාන්ත්‍රණයක් ගොඩනඟන ධනේශ්වර පාලනයේ පක්ෂයක් බවට පරිවර්තනය වීම, එහි මුල් ප්‍රතිපත්ති පාවාදීමක් නොවේ. එය සුළු ධනේශ්වර ජාතිකවාදී සංවිධානයක් ලෙස එහි පන්ති ස්වභාවයේ තර්කානුකූල අවසානයයි. දිනෙක තම වාමාංශික විරුද්ධවාදීන් භෞතිකව විනාශ කළ පක්ෂයම, දැන් “වරලත් ආයතනයක” නිලධාරිවාදී යාන්ත්‍රණයන් හරහා ඔවුන්ගේ හඬ යටපත් කිරීමට උත්සාහ කරයි. එහි ක්‍රමවේදයන් නවීකරණය වී ඇත, නමුත් කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය මර්දනය කිරීම යන එහි මූලික අරමුණ එලෙසම පවතී.**

### ව්‍යාජ වාම සහ වෘත්තීය සමිති: මර්දනයේ අනුබලදෙන්නන් ලෙස

ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීම සඳහා කම්කරු පන්තියට ව්‍යාජ වාම සංවිධාන හෝ වෘත්තීය සමිති නිලධාරිවාදය දෙස බලා සිටිය නොහැක. ආණ්ඩුවේ වාමාංශික විරුද්ධවාදියෙකු ලෙස ව්‍යාජ ලෙස පෙනී සිටින පෙරටුගාමී සමාජවාදී පක්ෂය (FSP), වෘත්තීය සමිති යාන්ත්‍රණය සමඟ සහයෝගයෙන් කටයුතු කරමින්, ඔවුන්ගේ පාවාදීම් වසන් කරන අතරතුර, කම්කරුවන් නිශ්ඵල සාකච්ඡා සහ පාර්ලිමේන්තුව වෙත කෙරෙන ඉල්ලීම් වෙත යොමු කරයි. ජනතා විමුක්ති පෙරමුණ/ජාතික ජන බලවේගයට (JVP/NPP) අනුබද්ධ වෘත්තීය සමිති මේ සම්බන්ධයෙන් මාරාන්තික නිශ්ශබ්දතාවයක් පවත්වාගෙන යන අතර, ඔවුන්ගේ සාමාජිකයන්ගේ සියලුම ආණ්ඩු විරෝධී ක්‍රියාකාරකම් සක්‍රියව වළක්වයි. විපක්ෂයේ පාර්ලිමේන්තු පක්ෂ වන සමගි ජන බලවේගය (SJB) සහ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට (SLPP) සම්බන්ධ වෘත්තීය සමිති, කම්කරු පන්තියේ සැබෑ විරෝධය දියකර හැරීමේ අරමුණින් යුතුව සීමිත ක්‍රියාමාර්ග පමණක් කැඳවනු ලබයි.

මෙම බලවේග කිසිවක් මාධ්‍ය නිදහස වෙනුවෙන් ප්‍රතිපත්තිගරුක ආරක්ෂාවක් ගොඩනඟන්නේ නැත. මන්ද, ආණ්ඩුව මෙන්ම විපක්ෂය ද ඇතුළු ඔවුන් සියලු දෙනාම, කම්කරු පන්තිය අන්ත අසරණ භාවයට පත් කරන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැඩසටහනට සහයෝගය දක්වන බැවිනි. ඔවුන් සියලු දෙනාම කම්කරුවන්ගේ සහ තරුණයන්ගේ ස්වාධීන දේශපාලන බලමුලු ගැන්වීම කෙරෙහි බියක් දක්වති. එමෙන්ම, පොදු සමාජ කතිකාව පාලනය කිරීම සම්බන්ධයෙන් ඔවුන් සැමටම ඇත්තේ එක හා සමාන අවශ්‍යතාවයකි. ජනාධිපති දිසානායක විසින් දිට්වා (Ditwah) සුළි කුණාටුවෙන් පසු හදිසි නීති රෙගුලාසි ප්‍රකාශයට පත් කිරීමට ප්‍රථම, විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස විසින් ඒ සඳහා ඉල්ලා සිටියා සේම, වරලත් මාධ්‍යවෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත ද එහි මූලික හරය අනුව ද්විපාර්ශ්වික (පක්ෂ විපක්ෂ

දෙපාර්ශවයේම සහභාගීත්වය ඇති) ව්‍යාපෘතියකි.

**කම්කරු පන්තියේ ස්වාධීන බලමුලු ගැන්වීම ගොඩනගනු**

ශ්‍රී ලංකා වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතනය (CIMP) පනත් කෙටුම්පතට එරෙහි අරගලය, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කප්පාදු පියවරයන්ට එරෙහි, අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහි සහ කම්කරු පන්තියේ දේශපාලන ස්වාධීනත්වය උදෙසා වන අරගලයෙන් වෙන් කළ නොහැක්කකි. මාධ්‍ය නිදහස යනු “ආර්ථික ඉල්ලීම්” දිනා ගන්නා තෙක් පසෙක තැබිය යුතු ධනේශ්වර සුඛෝපභෝගීත්වයක් නොවේ. එය පන්ති අරගලයේදී අත්‍යවශ්‍ය ආයුධයකි. **ඉදිරි සටන් සඳහා සන්නද්ධ වීමට නම්, තොරතුරු, විශ්ලේෂණ සහ දේශපාලන විවාද සඳහා කම්කරු පන්තියට බාධාවකින් තොරව ප්‍රවේශ වීමේ හැකියාව තිබිය යුතුය.** හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව (ICFI), ලෝක සමාජවාදී වෙබ් අඩවිය සහ thesocialist.lk වෙබ් අඩවිය ඉදිරිපත් කරන විප්ලවවාදී මාක්ස්වාදී ඉදිරිදර්ශනය ද ඊට ඇතුළත් වන අතර, එය විශේෂයෙන්ම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) කම්කරුවන්ගෙන්, තරුණ ජනතාවගෙන්, මාධ්‍යවේදීන්ගෙන්, අන්තර්ජාල අන්තර්ගත නිර්මාණකරුවන්ගෙන් සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සුරකින සියලු දෙනාගෙන් මෙසේ ඉල්ලා සිටියි:

- වරලත් මාධ්‍ය වෘත්තිකයන්ගේ ආයතන පනත් කෙටුම්පත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනු! මෙය සංශෝධනය කළ යුතු පනතක් නොවේ — එය පරාජය කළ යුතු පනතකි!
- **මාධ්‍යවේදීන්ට රාජ්‍ය බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදය එපා! මාධ්‍ය නිදහස යනු අයිතිවාසිකමකි, ධනපති රාජ්‍යය විසින් පිරිනමනු ලබන වරප්‍රසාදයක් නොවේ!**
- රාජ්‍ය මැදිහත්වීම්වලින් තොරව ප්‍රකාශනයෙහි යෙදීමට සමාජ මාධ්‍ය අන්තර්ගත නිර්මාණකරුවන්ට සහ අන්තර්ජාල විචාරකයන්ට ඇති අයිතිය සුරකිනු!
- පුවත්පත් මණ්ඩල පනත, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත, යෝජිත රාජ්‍යය ත්‍රස්තවාදයෙන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත සහ පෙර පාලන තන්ත්‍රයන්ගෙන් උරුම වූ සියලුම මර්දනකාරී නීති අහෝසි කරනු!
- **රජයේ මුද්‍රණාල සහ රාජ්‍ය මාධ්‍ය සේවකයන්ට පනවා ඇති අත්‍යවශ්‍ය සේවා තහනම එපා ! වැඩවර්ජනය කිරීමේ අයිතිය සුරකිනු!**
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැය කප්පාදුවලට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට එල්ල වන ප්‍රහාරයන්ට එරෙහිව සටන් කිරීම සඳහා, සියලුම සේවා ස්ථාන පුරා ස්වාධීන ක්‍රියාකාරී කමිටු ගොඩනැගීමට පෙරමුණ ගනු!
- පොදු සතුරා වන ගෝලීය ධනවාදයට සහ එහි රාජ්‍ය ආයතනවලට එරෙහිව, දකුණු ආසියාවේ සහ ජාත්‍යන්තරව සිටින තම පන්ති සහෝදර සහෝදරියන් සමඟ ශ්‍රී ලාංකික කම්කරු පන්තියේ එක්සත්භාවය ඇති කරනු!
- **ධනපති පක්ෂ සහ ඔවුන්ගේ වෘත්තීය සමිති අනුබද්ධයන් මත නොව, කම්කරු කමිටු මත පදනම් වූ කම්කරු ආණ්ඩුවක් ගොඩනැගීමට පෙරමුණ ගනු!**
- සැබෑ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ මාධ්‍ය නිදහසේ එකම පදනම වන සමාජය සමාජවාදී ලෙස ප්‍රතිසංවිධානය කිරීමට පෙරමුණ ගනු!

දිසානායක ආණ්ඩුව පොලිස් රාජ්‍යයක ව්‍යුහය ගොඩනගමින් සිටින්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) වැය කප්පාදුවලින් තමන් තවදුරටත් උග්‍ර කරමින් සිටින සමාජ අර්බුදය, දැවැන්ත මහජන විරෝධයක් ජනිත කරනු ඇති බව එය දන්නා බැවිනි. වැඩකරන ජනතාව මීට පිළිතුරු දිය යුත්තේ තමන්ගේම ස්වාධීන සංවිධාන ගොඩනැගීමෙනි — එනම් ප්‍රජාතන්ත්‍රවාදීව පාලනය වන, සමාජවාදී-ජාත්‍යන්තරවාදී වැඩපිළිවෙළකින් දේශපාලනිකව සන්නද්ධ වූ ක්‍රියාකාරී කමිටු සෑම සේවා ස්ථානයකම සහ නිවහන් ප්‍රදේශයකම පිහිටුවීමෙනි. **මාධ්‍ය වාරණයට එරෙහි සටන යනු වැඩකරන ජනතාවගේ දේශපාලන ස්වාධීනත්වය උදෙසා කෙරෙන සටනකි.** එය ජයගත හැක්කේ විප්ලවවාදී පක්ෂයක් ගොඩනැගීමෙන් සහ සමස්ත ධනපති ක්‍රමයට එරෙහිව ජාත්‍යන්තර කම්කරු පන්තිය බලමුලු ගැන්වීමෙන් පමණි.

ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය ( SLLA) වන අපි මෙම සටනේ යෙදෙන්නේ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (International Committee of the Fourth International) ජාත්‍යන්තර වැඩපිළිවෙළ සමඟ සහයෝගීතාවයෙනි. සමාජවාදය සඳහා වන සටනට අත්‍යවශ්‍ය විප්ලවවාදී නායකත්වය ගොඩනැගීමට සහ මෙම අරගලය ඉදිරියට ගෙන යාමට අප හා එක්වන ලෙස අපි කම්කරුවන්ගෙන් , තරුණ ජනතාවගෙන්, බුද්ධිමතුන්ගෙන් සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සුරකින සියලු දෙනාගෙන් ඉල්ලා සිටිමු.

[1] දිට්වා සුළි කුණාටු ව්‍යසනයෙන් පසු ශ්‍රී ලංකාවේ එන්පීපී ආණ්ඩුව හදිසි නීතිය පනවයි: කම්කරු පන්තියට අනතුරු ඇඟවීමක්, සංජය ජයසේකර (4 දෙසැම්බර් 2024) <https://www.thesocialist.lk/04-12-2025-sri-lanka-npp-government-imposes-emergency-laws-following-cyclone-ditwah-disaster-a-warning-to-the-working-class-sin/>

Sri Lankan government extends draconian state of emergency, Saman Gunadasa (15 May 2026) <https://www.wsws.org/en/articles/2026/05/16/fkbi-m16.html>

[2] The demolition of press freedom in Hungary, Markus Salzmann, Peter Schwarz (24 December 2010) <https://www.wsws.org/en/articles/2010/12/hung-d24.html>

[3] Germany's "Network Enforcement Law" goes into effect: A move to censor the Internet, Johannes Stern (4 January 2018) <https://www.wsws.org/en/articles/2018/01/04/netz-j04.html>

[4] Ban on Red Media: EU sanctions against Russia attack press freedom, Marianne Arens (28 May 2025) <https://www.wsws.org/en/articles/2025/05/29/qopq-m29.htm>

[5] Sri Lankan president announces JVP/NPP government will implement savage IMF austerity program in full, Saman Gunadasa, Keith Jones (22 November 2024) <https://www.wsws.org/en/articles/2024/11/23/kjdl-n23.html>

[6] IMF delegation praises Sri Lankan government's austerity measures, Saman Gunadasa(7 April 2026) <https://www.wsws.org/en/articles/2026/04/08/abhi-a08.html>

[7] ජාමූඅ නියෝග බලාත්මක කිරීමට ශ්‍රී ලංකාවේ පාලක ජාජබ ශක්තිමත් පාර්ලිමේන්තු බහුතරයක් ලබා ගනී: කප්පාදුවලට එරෙහිව සටන් කිරීමට සසප ගොඩනඟන්න! ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වයේ (එස්එල්එල්ඒ) ප්‍රකාශය. (21 නොවැම්බර් 2024) <https://www.thesocialist.lk/sri-lankas-ruling-npp-secures-a-strong-parliamentary-majority-to-enforce-imf-dictates-build-the-sep-to-fight-the-cuts/>

JVP/NPP government in Sri Lanka preparing further attacks on workers amid growing crisis, Saman Gunadasa (21 May 2026) <https://www.wsws.org/en/articles/2026/05/22/ingw-m22.html>


[8] The Sri Lankan elections: JVP assumes responsibility for defending capitalism amid a deepening revolutionary crisis, Keith Jones (23 September 2024) <https://www.wsws.org/en/articles/2024/09/24/gpzw-s24.html>

# පන්හිඳ පාවාදීම: යෝජිත CIMP පනත පිළිගන්නා මාධ්‍යවේදීන්ගේ ප්‍රතිගාමී ආකල්පය පරාජය කරනු!

**සංජය ජයසේකර** විසිනි.

මෙම ලිපිය ඉංග්‍රීසි බසින් *"The Betrayal of the Pen: Defeat the Reactionary Attitude of Journalists Who Welcome the CIMP Bill"* සිරසින් *2026* ජුනි *27* දින පළ විය.

වරලත් මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ආයතන (CIMP) පනත් කෙටුම්පත කෙරෙහි ආයතනගත (institutionalized) මාධ්‍යවේදීන් දක්වන නිශ්ශබ්දතාවය — සහ බොහෝ අවස්ථාවලදී දක්වන විවෘත උද්‍යෝගය — හෙළිදරව් කළ යුතු දේශපාලන අපකීර්තියකි. මෙම පනත් කෙටුම්පත තමන්ගේම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට එල්ල වූ සෘජු ප්‍රහාරයක් ලෙස හඳුනා ගන්නවා වෙනුවට, ස්ථාපිත මාධ්‍ය වෘත්තිකයන්ගේ සැලකිය යුතු ස්ථරයක් එය වැළඳගෙන ඇත්තේ පෞද්ගලික අභිවෘද්ධිය සඳහා වූ අවස්ථාවක් ලෙසය. ඔවුන් වරලත් ආයතනය දකින්නේ සිර කුඩුවක් ලෙස නොව, වරප්‍රසාදිත තට්ටුවක "ක්ලබ්" එකක් ලෙසය: එනම් ඔවුන්ගේ වෘත්තීය තත්ත්වය සහතික කරන, හීලෑ නොවූ "අන්තර්ගත තනන්නන්ගේ" (content developers) මහා සමාජයෙන් සහ සමාජ මාධ්‍ය විචාරකයන්ගෙන් ඔවුන්ව වෙන් කර හඳුනා ගන්නා, සහ — වඩාත්ම වැදගත් දෙය නම් — රාජ්‍ය පිළිගැනීම මඟින් ලබා දිය හැකි ද්‍රව්‍යමය වරප්‍රසාද සඳහා දොරටු විවෘත කරන රාජ්‍ය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ආයතනයක් ලෙසය. මේ ද්‍රව්‍යම වාසි අතර විශ්‍රාම වැටුප්, රක්ෂණ ක්‍රම, සහනපොලී අනුපාතයට තේ බැංකු ණය, විදේශ වීසා පහසුකම්, රජයේ ප්‍රචාරණ සහ



කොන්ත්‍රාත්තු සඳහා ප්‍රවේශය මෙන්ම බලවතුන් සමඟ මේසයේ අසුනක් ලබාගැනීම අන්තර්ගත වේ.

මෙය මාධ්‍ය නිදහසේ ආරක්ෂකයන්ගේ දැක්ම නොව, ධනේශ්වර රාජ්‍යය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම තුළින් තම තත්ත්වය සුරක්ෂිත කර ගැනීමට උත්සාහ කරන වරප්‍රසාදිත සුළු-ධනේශ්වර ස්ථරයක දැක්මයි. එය මාධ්‍යවේදියාගේ නොව, රාජ සභිකයෙකුගේ මානසිකත්වයයි.

**අල්ලස සහ යදම්**

2026 පෙබරවාරි 17 වන දින, NPP/JVP රජයේ ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍ය කෞශල්‍යා ආරියරත්න පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළේ, මාධ්‍යවේදීන්ගේ රැකියා සුරක්ෂිතතාව, වෘත්තීයභාවය, සෞඛ්‍ය රක්ෂණය සහ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම සඳහා රජය වරලත් ආයතනයක් පිහිටුවන බවත්, ශිෂ්‍යත්ව ක්‍රම අඛණ්ඩව ක්‍රියාත්මක කරන බවත්ය.

දිසානායක රජය මෙම දිරිගැන්වීම් ලබා දෙන්නේ ත්‍යාගශීලීකමකින් නොවේ. එය ධනේශ්වර රාජ්‍ය තාන්ත්‍රිකභාවයේ සම්භාව්‍ය මූලෝපායක් ක්‍රියාත්මක කිරීමකි: එනම් වෘත්තියේ මූලෝපායික ස්ථරයක් මුදලට ගැනීම, ඔවුන්ගේ ද්‍රව්‍යමය අවශ්‍යතා පාලන තන්ත්‍රයේ පැවැත්ම සමඟ ගැටගැසීම, සහ එමඟින් ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ගෙල සිර කිරීමට එරෙහිව ඇති විය හැකි ඕනෑම විරෝධයක් කැබලි කිරීමයි. **අද දින රාජ්‍ය සහතික ලත් අක්තපත්‍රයක්, පහසුකම් සහිත බැංකු ණයක් හෝ රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් ලබා ගන්නා මාධ්‍යවේදියා හෙට දින ප්‍රාණ ඇපකරුවෙකු බවට පත්වේ.** මෙම වරප්‍රසාද ලබා දෙන රාජ්‍යයටම ඒවා අවලංගු කිරීමටද හැක; CIMP පනත යටතේ, අවලංගු කිරීමේ යාන්ත්‍රණය දැනටමත් එහි ව්‍යුහය තුළම ගොඩනගා ඇත. 24 වන වගන්තිය මඟින් "වෘත්තීමය විෂමාචාරය" සඳහා "සාමාජිකයෙකුගේ නම ලියාපදිංචියෙන් ඉවත් කිරීමට" කවුන්සිලයට බලය පවරා ඇති අතර, එම පදය 23(2) වගන්තිය යටතේ හිතාමතාම නිර්වචනය නොකර තබා ඇත. එය පසුව එම කවුන්සිලය විසින්ම සාදනු ලබන රීති මඟින් සම්පූර්ණ කරනු ඇත. **තමන් විශ්‍රාම වැටුපක් සුරක්ෂිත කර ගන්නා බව විශ්වාස කරන මාධ්‍යවේදියා සැබවින්ම කරන්නේ තමන්ගේ හිස තොණ්ඩුවකට හසු කර ගැනීමයි.**

මෙය උපකල්පිතයක් නොවේ. මෙම ගතිකත්වය නැවත නැවතත් සිදුවන අයුරු අපි දැක ඇත්තෙමු. 2023 දී, ශ්‍රී ලංකා වෛද්‍යවරුන්ගේ වෘත්තීය සමිතිය වන රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය — තම සාමාජිකයන්ගේ සන්නිවේදනයන් රජය විසින් වාරණය කිරීමට එකඟ වූ අතර, එමඟින් වෘත්තීය සමිති රජය සහ සංස්ථා සඳහා කාර්මික පොලිසියක් ලෙස ක්‍රියා කරන්නේ කෙසේද යන්න පෙන්නුම් කළේය. එවැනි විධිවිධාන සාකච්ඡා කරන වෘත්තීය සමිති නිලධාරීහු තම සාමාජිකයන්ගේ අයිතිවාසිකම් පාවා දෙමින් තම තනතුරු සුරක්ෂිත කර ගනිති. CIMP පනත මෙම ආකෘතිය මාධ්‍යවේදයට ද ව්‍යාප්ත කරයි: එනම් වරලත් ආයතනයක් නිර්මාණය කිරීම, අවනත පුද්ගලයන් එයට පත් කිරීම සහ වෘත්තිය ඇතුළතින්ම විනයගත කිරීම සඳහා එය භාවිතා කිරීමයි.

**පාවාදීමේ පන්ති ස්වභාවය**

CIMP පනත පිළිගන්නා මාධ්‍යවේදීන් ක්‍රියා කරන්නේ නොදැනුවත්කම නිසා නොවේ. ඔවුන් ක්‍රියා කරන්නේ පන්ති උවමනාවන් මතය — එනම් රාජ්‍ය වාරණයට වඩා, කම්කරු පන්තියේ ස්වාධීන බලමුලු ගැන්වීමට සහ අන්තර්ජාලයේ නියාමනය නොකළ ප්‍රජාතන්ත්‍රවාදී කතිකාවට බිය වන, වරප්‍රසාදිත ස්ථරයක උවමනාවන් මතය. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධාරාවේ ආයතනික මාධ්‍ය දැනටමත් කතිපයාධිකාරීන් (පරපුටු මහා ව්‍යාපාරික කිහිපය) සහ රාජ්‍යය විසින් දැඩි ලෙස පාලනය කරනු ලැබේ. එහි ජ්‍යෙෂ්ඨ වෘත්තිකයන් බොහෝ කලකට පෙර සිටම දේශපාලන බලය සමඟ සමාදාන වී ඇත. ඔවුන්ව භීතියට පත් කරන්නේ රජයේ මර්දනය නොව, ස්වාධීන මාර්ගගත (online) මාධ්‍යවල නැගීමයි — එනම් වෘත්තියේ ස්ථාපිත ධුරාවලියෙන් බැහැරව ක්‍රියා කරන සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කප්පාදු පියවර, පෞද්ගලීකරණය සහ අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහිව කම්කරු පන්තියේ කෝපයට හඬක් දෙන බ්ලොග්කරුවන්, සමාජ මාධ්‍ය විචාරකයන්, යූටියුබ්කරුවන්, පුරවැසි මාධ්‍යවේදීන් සහ සමාජවාදී ප්‍රකාශනයි.

CIMP පනත, "අන්තර්ගතය තනන්නන්" රාජ්‍යයේ විනය උපකරණ යටතේට පත් කිරීම මඟින්, මෙම තරඟකාරිත්වය තුරන් කිරීමට පොරොන්දු වෙයි. ආයතනගත මාධ්‍යවේදියාට මෙම පනත මාධ්‍ය නිදහසට තර්ජනයක් නොවේ — එය ඔවුන්ගේ වෘත්තීය බලකොටුව වටා ඇති දිය අගලකි. ඔවුන්ව සහතික කරනු ලැබෙනු ඇත. ඔවුන්ගේ ප්‍රතිවාදීන් ලේඛනයෙන් ඉවත් කරනු ලැබෙනු ඇත. නිදහස් ප්‍රකාශනයේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය බලපත්‍රලාභී වරප්‍රසාදයක් බවට පරිවර්තනය කරනු ඇති අතර, ඔවුන් එම බලපත්‍රලාභීන් අතර සිටිනු ඇත.

මෙය වඩාත්ම භයානක ආකාරයේ ප්‍රතිගාමී ස්ථාවරයකි. වෘත්තීය සමිති නිලධාරී තන්ත්‍රය විසින් තැපැල් සේවකයන්ගේ, විදුලි සේවකයන්ගේ සහ සෞඛ්‍ය සේවකයන්ගේ වැඩ වර්ජන මර්දනය කිරීමට හේතු වූයේද මෙම මානසිකත්වයමය — එනම් රාජ්‍ය උපකරණ තුළ තම තනතුරු රැක ගැනීම සඳහා පුළුල් කම්කරු පන්තියේ අවශ්‍යතා පූජා කිරීමයි. එය මූල්‍ය ප්‍රාග්ධනයේ නියෝග ප්‍රවාහනය කරන වාහකයක් ලෙස සේවය කිරීම සඳහා යටත් විජිත සහ අර්ධ යටත් විජිත රටවල අධිරාජ්‍යවාදය විසින් පෝෂණය කරනු ලබන වරප්‍රසාදිත ස්ථරය වන කම්කරු ප්‍රභූතන්ත්‍රයේ (labor aristocracy) මානසිකත්වයයි.

**උගුලක් මිස සෙවණක් නොවේ**

CIMP පනතෙන් තමන්ට ප්‍රතිලාභ ලැබෙනු ඇතැයි සිතන මාධ්‍යවේදීන් මුළාවක පසුවෙති. වරප්‍රසාද ලබා දෙන රාජ්‍යයට ඒවා ආපසු ලබා ගත හැකිය. මාධ්‍ය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අන්තර්කාලීන කවුන්සිලය —

අමාත්‍යාංශ ලේකම්වරයාගෙන් සහ දේශපාලන පත්වීම්ලාභීන් හය දෙනෙකුගෙන් සමන්විත වන අතර — “වෘත්තීය විෂමාචාරය” නිර්වචනය කරන රීති ලියනු ඇත. එම රීති ලියනු ලබන්නේ මාධ්‍යවේදයේ අවංකභාවය (integrity) ආරක්ෂා කිරීමට නොවේ. ඒවා ලියනු ලබන්නේ රජය විවේචනය කිරීම නිශ්ශබ්ද කිරීමටය. අද දින අක්තපත්‍ර පිළිගන්නා මාධ්‍යවේදියා, වැඩ වර්ජනයක් වාර්තා කිරීම, දූෂණ වංචාවක් හෙළිදරව් කිරීම හෝ IMF වැඩසටහන විවේචනය කරන ලිපියක් පළ කිරීම හේතුවෙන් හෙට දින සාමාජික ලේඛනයෙන් ඉවත් කරනු ලැබිය හැකිය. විශ්‍රාම වැටුප, බැංකු ණය, වීසා පහසුකම් — මේ සියල්ල මාධ්‍යවේදියා සීමාවෙන් ඔබ්බට පියවර තබන මොහොතේම අතුරුදහන් වනු ඇත.

මාධ්‍ය නිදහසේ එකම විශ්වාසදායක සහතිකය රාජ්‍යය විසින් නිකුත් කරන ලද වෘත්තීයභාවය පිළිබඳ සහතිකයක් නොවේ. එම සහතිකය වන්නේ කම්කරු පන්තියේ සංවිධානාත්මක බලයයි. රාජ්‍යය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම මඟින් රාජ්‍ය මර්දනයෙන් තමන්ව ආරක්ෂා කර ගැනීමට උත්සාහ කරන මාධ්‍යවේදීන්ට පෙනී යනු ඇත්තේ, ඔවුන් තමන්ව එයට වඩාත් ගොදුරු කර දී ඇති බව පමණි. **ඔවුන් තම ස්වාධීනත්වය කැඳ කෝප්පයක් වෙනුවෙන් පාවා දී ඇති අතර, නියමිත වේලාවට ඔවුන්ව ගිල දමනු ඇත.**

**මාධ්‍යවේදීන් කම්කරු පන්තිය සමඟ බැඳීගත යුතුය**

CIMP පනත මුලින් වෘත්තීය අභිවෘද්ධිය සඳහා වූ අවස්ථාවක් ලෙස සැලකූ අය ඇතුළුව සියලුම අවංක මාධ්‍යවේදීන්ගෙන් ශ්‍රී ලංකාවේ හා දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) ඉල්ලා සිටින්නේ මෙම ප්‍රතිගාමී දිශානතියෙන් තීරණාත්මක ලෙසම මිදෙන ලෙසයි. CIMP පනතට එරෙහි සටන වෘත්තීය ප්‍රභූ පැලැන්තියක වරප්‍රසාද සඳහා වන සටනක් නොවේ. එය සමස්ත කම්කරු පන්තියේ, සියලුම “අන්තර්ගත නිර්මාණකරුවන්ගේ” (content creators) ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් සඳහා වන සටනකි. ධනේශ්වර රාජ්‍යයේ අනුග්‍රහය සෙවීමෙන් මාධ්‍යවේදීන්ට තම ප්‍රකාශන අයිතිය ආරක්ෂා කර ගත නොහැක. ඔවුන්ට එය ආරක්ෂා කර ගත හැක්කේ එම රාජ්‍යය පෙරළා දැමීමට බලය ඇති පන්තිය සමඟ එක්වීමෙන් පමණි.

- **අල්ලස ප්‍රතික්ෂේප කරනු! රක්ෂණ, විශ්‍රාම වැටුප්, ණය සහ වීසා පිළිබඳ රජයේ පොරොන්දුව ඔබේ යදම් සඳහා ගෙවන මිලයි. කිසිදු ද්‍රව්‍යමය දිරිගැන්වීමක් මාධ්‍ය නිදහස පාවා දීමට තරම් වන්නේ නැත!**

- **රාජ්‍යය සමඟ සහයෝගයෙන් කටයුතු කරන ආයතනගත මාධ්‍යවේදීන්ගෙන් මිදෙනු! ඔවුන්ගේ “වෘත්තීයභාවය” පන්ති පාවාදීම සඳහා වූ වැස්මකි. ඔවුන් මාධ්‍යවේදය වෙනුවෙන් කතා නොකරයි — ඔවුන් කතා කරන්නේ තමන්ගේම වෘත්තීය ජීවිතය වෙනුවෙනි!**

- **මාධ්‍යවේදීන් හා කම්කරු පන්තියේ එක්සත්කම සඳහා සටන් කරනු! මාධ්‍ය නිදහස සඳහා වන සටන IMF කප්පාදු පියවරවලට එරෙහිව, අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහිව සහ සමාජයේ සමාජවාදී ප්‍රතිසංවිධානය සඳහා වන සටනෙන් වෙන් කළ නොහැක!**

- **ආයතනික මාධ්‍ය හිමිකරුවන්ගෙන්, වෘත්තීය සමිති නිලධාරිවාදයෙන් සහ රාජ්‍යයෙන් ස්වාධීනව, බාධාවකින් තොරව ප්‍රකාශනය කිරීමේ අයිතිය වෙනුවෙන් සටන් වැදීම සඳහා මාධ්‍ය කම්කරුවන්ගේ ක්‍රියාකාරී කමිටු ගොඩනගනු!**

- **CIMP පනත පරාජය කරනු! මාධ්‍යවේදීන් රාජ්‍ය බලපත්‍රගත කිරීමට එරෙහි වනු! මාධ්‍ය නිදහස යනු අයිතිවාසිකමකි, වරප්‍රසාදයක් නොවේ!**


රාජ්‍යයට සේවය කරන පන්හිද රාජ්‍යය විසින්ම බිඳ දමනු ඇත. කම්කරු පන්තියට සේවය කරන පෑන කම්කරු පන්තිය විසින් ආරක්ෂා කරනු ඇත. මාධ්‍යවේදීන් තමන් සිටින්නේ කුමන පාර්ශවයේද යන්න තෝරා ගත යුතුය.


*Sri Lankan union agrees to government censorship of health employees (07 August 2023) https://www.wsws.org/en/articles/2023/08/,07/rhjc-a07.html


අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි)

---




**මෙම පොත් Mehring Books වෙතින් ඇනවුම් කරන්න.**

 ISSN 3093-6217

# “ආයෙත් නම් කවදාවත් එපා” – යාපනය මහජන පුස්තකාලය ගිනිබත් කිරීමේ 45 වැනි සමරුව



ගිනි තැබීමෙන් පසු යාපනය මහජන පුස්තකාලය. ඡායාරූපය CPA X අනුග්‍රහයෙනි.

මේ කතාව 2026 මැයි 31 දින thesocialist.lk හි “Never Again” — 45th Commemoration of the Jaffna Public Library Arson යන හිසින් ඉංග්‍රීසි බසින් පල කෙරුණි.

1981 මැයි මාසයේදී යාපනය මහජන පුස්තකාලය ගිනිබත් කරපු සිද්ධියට අද රාත්‍රියේදී අවුරුදු 45 ක් පිරෙනවා. ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (SEP) විප්ලවවාදී වාම කණ්ඩායම (Revolutionary Left Faction) වන, ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වය (Socialist Lead of Sri Lanka and South Asia – SLLA) සංවිධානය විදිහට අපි, අද දවසේ යාපනය මහජන පුස්තකාලය ඉස්සරහ පැවැත්වෙන සමරුවකට සහභාගි වී අපගේ සිංහල, දෙමළ හා මුස්ලිම් සහෝදර සහෝදරියන්, මිතුරන්, සහ සහෝදරවරුන්ගෙන් සමන්විත පිරිසක් අමතන්න ලැබුණා නම්, අපි කරන්නේ පහත දේශනයයි:

**සංජය ජයසේකර, ශ්‍රී ලංකාවේ සහ දකුණු ආසියාවේ සමාජවාදී නායකත්වයේ** (SLLA) සාමාජික.

මිතුරනි, සහෝදරවරුනි, ඒ වගේම සහෝදර සහෝදරියනි — දෙමළ, සිංහල, මුස්ලිම්, ඒ වගේම මිනිස් ගරුත්වයේ අර්ථය අගය කරන ඔබ හැමගෙන්ම අවසරයි,

අදට අවුරුදු හතළිස් පහකට කලින්, හරියටම අද වගේ දවසක කරුවල රෑක, දකුණු ආසියාවේ තිබුණ වටිනාම සංස්කෘතික නිධානයක් ගින්නට බිලිවුණා. පොත්පත් 97,000 කට වඩා, ඒ වගේම ආදේශ කරන්න බැරි පුස්කොළ අත්පිටපත්, පැරණි ඉතිහාස ලේඛන, ජීවමාන මතකයන් වගේම ශතවර්ෂ ගණනාවක් තිස්සේ එකතු වුණ දෙමළ ජනතාවගේ බුද්ධිමය උරුමය ගබඩා කරලා තිබුණ යාපනය මහජන පුස්තකාලය අළු දූවිලි බවට පත්වුණා. ඒක අහම්බෙන් වෙච්ච දෙයක් නෙවෙයි. සොබාදහමෙන් සිද්ධ වෙච්ච දෙයකුත් නෙවෙයි. ඒක කළේ හිතාමතාම සැලසුම් කරපු මිනිස් අත්වලින්: ඒ කියන්නේ ජේ.ආර්. ජයවර්ධනගේ එක්සත් ජාතික පක්ෂ (UNP) ආණ්ඩුවේ ආරක්ෂාව වගේම මඟපෙන්වීම යටතේ දකුණෙන් එවපු, නිල ඇඳුම් ඇඳගත්ත පොලිස් නිලධාරීන්

සහ සංවිධානාත්මක මැර කල්ලි විසින්. “බුද්ධාගම රැකගන්න” සිංහලයන් නැගී සිටින්න ඕනේ කියලා ප්‍රසිද්ධියේම ලියලා පුරසාරම් දොඩපු ගාමිණී දිසානායක (Gamini Dissanayake) වගේම සිරිල් මැතිව් (Cyril Mathew) කියන ඇමතිවරු මේ මෙහෙයුම පුද්ගලිකවම අධීක්ෂණය කරන්න යාපනයට ආවා. දෙමළ මිනිස්සු හතරදෙනෙක්ව තමන්ගේ ගෙවල්වලින් එළියට ඇදලා දාලා මරලා දැම්මා. ගෙවල් දොරවල්, කඩසාප්පු, කාර්යාල, ඒ වගේම ‘ඊළනාඩු’ (Ealanadu) කියන දෙමළ පුවත්පතේ මුද්‍රණාලය ගිනිබත් කළා. පාරවල් මංසන්ධිවල තිබුණ දෙමළ සංස්කෘතික නායකයන්ගේ පිළිම බිමට සමතලා කරලා දැම්මා.

මේක එකපාරටම මතු වුණ ස්වයංසිද්ධ පිපිරීමක් නෙවෙයි. ඒක කොළඹදී ගත්ත දේශපාලන තීරණයක්, යාපනයේදී ක්‍රියාත්මක කරපු එකක්, ඒ වගේම මුළු මහත් දේශපාලන සංස්ථාපිතයයි එයාලට කීකරු මාධ්‍යයි විසින් නිහඬවම වහලා දාපු එකක්. පුස්තකාලය විනාශ කිරීම ගැන කිසිම නිල පරීක්ෂණයක් කවදාවත් පැවැත්වුණේ නැහැ. කාටවත් විරුද්ධව නඩු පැවරුණේ නැහැ. කිසිම ඇමතිවරයෙක් නීතිය ඉස්සරහට ගෙනාවේ නැහැ. 1981 මැයි 31 වැනිදා රෑ පත්තු වුණ ඒ ගින්න ඇවිලෙව්වේ මේ දූපතේ පාලක පන්තියයි — ඒ වගේම නිදහසේ ඉඳන් එක්සත් ජාතික පක්ෂය වගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (SLFP) කියන ප්‍රධාන දේශපාලන පක්ෂ හැම එකක්ම ශ්‍රී ලාංකික සමාජයේ ලේ ධාතුවට එන්නත් කරපු දශක ගණනාවක වාර්ගික විෂ ඒකට ඉන්ධන සපයලා තිබුණා.

අපි අද මෙතනට එකතු වෙලා ඉන්නේ ශෝක වෙන්න විතරක් නෙවෙයි. අපි එකතු වෙලා ඉන්නේ තේරුම් ගන්න. හැම යුගයකම, හැම පක්ෂයකම පාලක පන්තිය මේ දූපතේ මිනිස්සු තේරුම් ගන්නවාට වඩාත්ම බය වුණ වගේම තේරුම් ගන්න එක වළක්වන්න මහන්සි වුණ ඒ පාඩම් අවබෝධ ගන්නයි අපි මෙතනට එකතු වෙලා ඉන්නේ.

**ඒ රෑ විනාශ වුණේ මොනවාද?**

ගිනිබත් වුණ පොත් අතර ආදේශ කරන්න බැරි ඒවා තිබුණා— යාපනයේ ඉතිහාසය ලියවුණ ‘යාල්පානම් වෛපවමාලෛයි’ පොතේ තිබුණේ එකම එක පිටපතක් විතරයි, ඒකත් ඒ ගින්නෙන් විනාශ වෙලා ගියා. හැබැයි ලංකාවේ පාලකයෝ එතනදී ප්‍රධාන වශයෙන්ම කළේ පොත් පත් පුච්චපු එක විතරක් නෙවෙයි. ඒගොල්ලෝ පිච්චුවේ ජනතාවකට තමන් ගැනම තිබුණ ආත්ම අභිමානයයි. දෙමළ සුළුතරයට තමන්ගේ සංස්කෘතික අනන්‍යතාවය, අඛණ්ඩතාවය වගේම විශ්වාසය ගැන තිබුණ හැඟීමයි ඒගොල්ලෝ ගිනිබත් කළේ. ඒගොල්ලෝ ගින්නෙන් ලියපු පණිවිඩයක් තමයි ඒ හරහා යැව්වේ: ඒ කියන්නේ ‘ඔයාලා මෙහෙට අයිති නෑ. ඔයාලගේ ඉතිහාසයෙන් වැඩක් නැහැ. ඔයාලගේ සංස්කෘතිය ඕනෙ වෙලාවක විසික් කරන්න පුළුවන් එකක්. ඔයාලගේ ජීවිත පවතින්නේ අපේ අවසරය උඩ විතරයි’ කියන එක.

මේක තමයි සිංහල ජාතිවාදයේ (chauvinism) භාෂාව — ඒක පැත්තක කොන්වෙච්ච මතවාදයක් නෙවෙයි, ඒක තමයි රාජ්‍යයේ නිල මතවාදය. 1956 ‘සිංහල පමණයි’ පනතින්, දෙමළ විරෝධී විශ්වවිද්‍යාල ප්‍රමිතිකරණ ක්‍රමවලින්, ඒ වගේම බුද්ධාගමට උත්තරීතරම ස්ථානය දෙමින් රාජ්‍ය ආගම මට්ටමට ව්‍යවස්ථාවට ඇතුළත් කිරීමෙන් මේ ජාතිවාදය ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ඇතුළටම කාවද්දලයි තිබුණේ. ඒ වගේම, වාර්ගික වෛරය තමන්ගේ පාලන මෙවලමක් විදිහට පාවිච්චි කරපු පාලක පන්තියක භාෂාව තමයි ඒක. තමන්ගේම ජීවිත විනාශ කරමින් තිබුණ ආර්ථික ප්‍රතිපත්ති — ඒ කියන්නේ සමාජ වියදම් කප්පාදුකිරීම්, විවෘත වෙළඳපොළ “ලිබරල්කරණය”, වැටුප් වගේම පොදු සේවාවන්ට කරපු ප්‍රහාරයන් — මෙවා ගැන සිංහල දුප්පත් සහ කම්කරු පන්තියේ අවධානය වෙනතකට හරවන්න, දෙමළ කම්කරුවන්ගේ ජීවිත වගේම සිංහල කම්කරුවන්ගේ ජීවිතත් බිලිගත්ත ආයුධයක් විදිහටයි පාලකයෝ මේ වාර්ගික වෛරය පාවිච්චි කළේ.

යාපනය පුස්තකාලය ගිනිබත් කිරීම කියන්නේ ආරම්භය නෙවෙයි. ඒ වගේම ඒක අවසානයත් නෙවෙයි. ඒක හැරවුම් ලක්ෂයයක් — 1983 ජූලි මහා කලබලයට (July 1983 pogrom) අවුරුදු දෙකකට කලින් පත්තු කරපු අනතුරු ඇඟවීමේ සංඥා එළියක්. ඒ 83 ජූලි මාසයේදී රාජ්‍ය ආයතනවලින් ලබාදුන්න ඡන්දහිමි නාමලේඛන අතට ගත්ත සංවිධානාත්මක සිංහල මැර කල්ලි, කොළඹ වගේම මුළු දිවයින පුරාම ගෙයින් ගෙට ගිහින් දෙමළ මිනිස්සු පවුල් පිටින් පණපිටින් පුච්චලා මැරුවා. කළු ජූලිය විසින් දශක තුනකට ආසන්න කාලයක් තිස්සේ ඇවිලිලා ගිය, දසදහස් ගණනකගේ ජීවිත බිලිගත්ත, ඒ වගේම දෙමළ-සිංහල මුළු මහත් සමාජයන්ම විනාශ කරපු සිවිල් යුද්ධයක් නිර්මාණය කළා. ඒක කෙළවර වුණේ 2009 මැයි මාසයේ මුල්ලිවයික්කාල්වල (Mullivaikkal) සිද්ධ වුණ අවසාන මිලිටරි ප්‍රහාරයෙන්. එතනදී දසදහස් ගණනක් දෙමළ සිවිල් වැසියන්ව මහා පරිමාණයෙන් ඝාතනය කෙරුණා. මුළු ලෝකයම අහක බලාගෙන ඉන්නකොට සිද්ධ වුණ මේ දේවල් යුධ අපරාධ වෙන්න ඉඩකඩ තියෙනවා කියලා එක්සත් ජාතීන්ගේ සංවිධානය පවා පිළිගත්තා.

**කලකට ඉහතදී ගින්නෙන් වෙලාගෙන තිබුණ, මේ විශිෂ්ට ස්මාරකයේ බිත්ති දෙස බලාගෙන අද දවසේ අපි මෙතන ඉඳන් ශබ්ද නඟලා කියන්න ඕනේ, “ආයෙත් නම් කවදාවත් එපා” (Never Again) කියලා.** තවත් නම් එපා කියන එකේ ඇත්තම තේරුම වෙන්න ඕනේ: ආයෙ කවදාවත් පුස්තකාල පුච්චන්න දෙන්න බැහැ. ආයෙ කවදාවත් කළු ජූලියක් වෙන්න දෙන්න බැහැ. ආයෙ කවදාවත් මුල්ලිවයික්කාල් එකක් වෙන්න දෙන්න බැහැ කියන එකයි.

**හැබැයි “ආයෙත් නම් කවදාවත් එපා” (Never Again) කියන එක නිකම්ම නිකන් ප්‍රාර්ථනාවක් විතරක් වෙන්න බැහැ. ඒක දේශපාලන වැඩපිළිවෙළක් වෙන්නම ඕනේ.**

2009 මැයි මාසයේදී තුවක්කුවල සද්දේ නැවතිලා දැන් අවුරුදු දාහතක්

ගතවෙලා ඉවරයි. මොනවාද වෙනස් වෙලා තියෙන්නේ? යුද්ධය ඉවරයි — හැබැයි යුද්ධය ඇතිකරපු තත්ත්වයන් තවමත් ඉවර වෙලා නැහැ. මිලිටරිය තවමත් උතුර වගේම නැගෙනහිර පළාත් අල්ලගෙන ඉන්නවා. දෙමළ ජනතාවගේ ඉඩම් තවමත් මිලිටරි පාලනය යටතේ අත්පත් කරගෙනයි තියෙන්නේ. මුල්ලිවයික්කාල් අනුස්මරණ — ඒ කියන්නේ තමන්ගේ මියගිය අය වෙනුවෙන් වැලපෙන්න තියෙන මූලිකම අයිතිය පවා — රාජ්‍ය අනුග්‍රහය ලබන මැර කල්ලි වගේම ආරක්ෂක අංශ විසින් බලහත්කාරයෙන් කඩාකප්පල් කරනවා. දෙමළ විරෝධතාකරුවන්ට ජාතිවාදී මැරයන්ගෙන් හිරිහැර වෙනවා, ඒ වගේම ඒගොල්ලන්ව අත්අඩංගුවට ගන්නවා. තමන්ගේ ඉතිහාසය, තමන්ගේ ශෝකය, එහෙම නැත්නම් තමන්ගේ අයිතිවාසිකම් ගැන කතා කරන හැම දෙමළ මනුස්සයෙක්වම ත්‍රස්තවාදියෙක්, LTTE හිතවාදියෙක්, නැත්නම් බෙදුම්වාදියෙක් විදිහට හංවඩු ගහන දරුණු සමාජ මාධ්‍ය වෛරී ප්‍රචාරණයක් සැලසුම් සහගතව වගේම සම්බන්ධීකරණය කරලා ක්‍රියාත්මක කරනවා. “ජාතික සමගිය” කියන කපටි ලේබලය යටතේ දෙමළ ලේඛකයන්ගේ පොත්පත් ආණ්ඩුවේ වාරණ මණ්ඩල විසින් තහනම් කරනවා. අද දවසේ මේ හැමදේකටම නායකත්වය දෙන්නේ අනුර කුමාර දිසානායකගේ ජනතා විමුක්ති පෙරමුණ (JVP) / ජාතික ජන බලවේගය (NPP) ආණ්ඩුවයි — JVP කියන්නේ දෙමළ විරෝධී යුද්ධයට මුල පටන්ම උද්‍යෝගිමත් සහයෝගයක් දීලා තමන්ගේ දේශපාලන ගමන හදාගත්ත, දෙමළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට දෙන හැම සහනයකටම විරුද්ධ වුණ, ඒ වගේම සිංහල ජාතිවාදී ප්‍රචාරයන්ට නිදහසේ පැතිරෙන්න ඉඩ දීලා දැන් “ජාතික සමගියේ” ආණ්ඩුවක් විදිහට පෙනී ඉන්න පක්ෂයක්.

අපි මේක කෙලින්ම කියන්න ඕනේ: උතුර මිලිටරිකරණය කිරීම යුද්ධයත් එක්ක ඉවර වුණේ නැහැ. ඒක තවදුරටත් ඉදිරියටම ගිහින් තවත් දැඩි වෙලා තියෙනවා. රාජපක්ෂ ඉඳන් වික්‍රමසිංහ හරහා දිසානායක දක්වා බලයට පත්වුණ හැම ආණ්ඩුවක්ම දෙමළ වැසියන්ගේ ජීවිත උඩ තියෙන මිලිටරි පාලනය ඒ විදිහටම තියාගත්තේ ඇයි? මොකද මිලිටරිය කියන්නේ සිංහල ධනේශ්වර පන්තියේ වුවමනාවන් වෙනුවෙන් පාලනය ගෙනයන, ඒ වගේම වාර්ගික මර්දනයේ මෙවලමක් විදිහට වැඩකරන ධනපති රාජ්‍යයේ යකඩ කුලු ගෙඩිය නිසා. මිලිටරිය උත්කර්ෂයට නැංවීම — ඒ කියන්නේ යුද ජයග්‍රහණ පෙළපාලි, යුද ස්මාරක, සොල්දාදුවා වන්දනාමාන කිරීම — මේක පුරුද්දට කරන දෙයක් නෙවෙයි. ඒක තමයි පාලක පන්තිය විසින් සිංහල මහජනතාවට මිලිටරිවාදය තමන්ගේ ජාතික අනන්‍යතාවය විදිහට පිළිගන්න උගන්වන ක්‍රමය. ඒ වගේම ඒ හරහා දෙමළ වගේම සිංහල කම්කරුවන්ගේ ඒකාබද්ධ අරගලයකින් මේ පවතින සමාජ ක්‍රමයට අභියෝගයක් එල්ල වෙන එක වළක්වනවා.

අද සිංහල සමාජය ඇතුළේ ඔයාලා දකින සදාචාරාත්මක පිරිහීම — ඒ කියන්නේ ගුරුවරුන්ට වඩා සොල්දාදුවන්ව සැමරීම, ජාතිවාදී සමාජ මාධ්‍ය භාවිතය ඉවසීමෙන් දරාගැනීම, දෙමළ ජනතාව පත්කරන අවමානයන් නිහඬව පිළිගැනීම, ඒ වගේම අතීතයේ සිද්ධ වුණ ප්‍රචණ්ඩත්වය, මහා ඝාතන වගේම විනාශ කිරීම් ආයෙත් කරන්න කියලා ඉල්ලන එක — ඒක සිංහල ජනතාවගේ ස්වභාවික ගුණාංගයක් නෙවෙයි. ඒක කෘතිමව හදපු තත්ත්වයක්. සිංහල කම්කරුවන්ට, දෙමළ කම්කරුවන් තමන්ගේ සහෝදරවරු විදිහට දකිනවාට වඩා තමන්ගේ හතුරෝ විදිහට දකින්න අවශ්‍ය වුණ පාලක පන්තිය විසින් දශක ගණනාවක් තිස්සේ මේක කෘතිමව නිර්මාණය කළා. මේක මිලිටරිවාදය, ජාතිවාදය, බය, ඒ වගේම බොරුව උඩ ගොඩනගපු දේශපාලන සංස්කෘතියක සැලසුම් සහගත ප්‍රතිඵලයක් — මොකද දෙමළ කම්කරුවන්ට වෛර කරන සිංහල කම්කරුවෙක් කියන්නේ කවදාවත් තමන්ව ඇත්තටම මර්දනය කරන පාලකයා දෙසට හැරිලා බලන්නේ නැති කම්කරුවෙක් නිසයි.

**මෙන්න මේ පසුබිම ඇතුළෙ තමයි දශක හතක පාවාදීම්වලින් ලැබුණ පාඩම් දිහාට අපි හැරෙන්න ඕනේ.**

ලංකාවේ ඛේදවාචකය කියන එක, කාලෙකට කලින් වැඩකරන පන්තිය වෙනුවෙන් කතා කරනවා කියලා කියාගත්ත පක්ෂ විසින් කරපු පාවාදීමේ ඉතිහාසයෙන් වෙන් කරන්න බැහැ. ට්‍රොට්ස්කිවාදී සම්ප්‍රදායෙන් මතු වුණ ලංකා සමසමාජ පක්ෂය (LSSP) කාලෙකදී දකුණු ආසියාවේ තිබුණ ලොකුම කම්කරු පක්ෂය. සමාජවාදී ජාත්‍යන්තරවාදය පදනම් කරගෙන සිංහල වගේම දෙමළ කම්කරුවන්ව එකතු කරන්නත්, ජාතිවාදය එහි මුල්වලින්ම විනාශ කරන්නත්, ඒ වගේම හැම ජාතික සුළුතරයකටම සමාන අයිතිවාසිකම් සහතික කරන වැඩකරන පන්තියේ ආණ්ඩුවක් වෙනුවෙන් සටන් කරන්නත් අවශ්‍ය කරන දේශපාලන මෙවලම් ඒගොල්ලන්ගේ අතේ තිබුණා. ඒ වෙනුවට, 1964 දී ලංකා සමසමාජ පක්ෂයේ නායකත්වය පන්ති සහයෝගිතාවයට (class collaboration) දණ නමලා සිරිමා බණ්ඩාරනායකගේ ධනපති හවුල් ආණ්ඩුවට එකතු වුණා — ඒ වගේම දෙමළ මර්දනය ජනරජයේ ව්‍යවස්ථාව ඇතුළටම දාලා මුද්‍රා තැබුවා. කාලෙකදී හතරවැනි ජාත්‍යන්තරය (Fourth International) වෙනුවෙන් සටන් කරපු කොල්වින් ආර්. ද සිල්වා, ඇමතිවරයෙක් විදිහට ඉඳගෙන සිංහල පමණක් භාෂණ ප්‍රතිපත්තිය ව්‍යවස්ථාව ඇතුළේ තහවුරු කිරීමට නායකත්වය දුන්නා. මේක පොඩි වැරදීමක් නෙවෙයි. මේක ලෝක ඓතිහාසික පාවාදීමක්. ඊට පස්සේ සිද්ධ වුණ හැම ජන හිංසනයකටම, හැම යුද අපරාධයකටම වගේම හැම සංස්කෘතික ගිනිබත් කිරීමටම පාර කැපුවේ මෙන්න මේ පාවාදීමයි.

ධනවාදයට ලංකාවේ ජාතික ගැටලුව විසඳන්න බැහැ. යුද්ධය අවසන් වීමෙන් දෙමළ ජාතික ප්‍රශ්නය විසඳුණේ නැහැ, ඒ වගේම පාලක පන්තිය එදා ඉඳන්ම මේ විසඳෙන්නේ නැති ප්‍රශ්නයෙන් තමන්ගේ වාසි ප්‍රයෝජන ගන්නවා. නිදහස ලැබිලා ගතවුණ අවුරුදු හැත්තෑ අට පුරාම මේකෙන් බිහිවුණේ වාර්ගික

යුද්ධයයි, ආර්ථික විනාශයයි විතරයි. දෙමළ ධනපති පක්ෂ — ඒ කියන්නේ TULF, TNA වගේම ඒවයෙන් පස්සේ ආපු පක්ෂ — දෙමළ කම්කරුවන්ව වගේම තරුණයන්වත් ඒ හා සමානවම සම්පූර්ණයෙන්ම පාවා දීලා තියෙනවා. ඒ ගොල්ලෝ දෙමළ ජනතාවගේ සාධාරණ දුක්ගැනවිලි කොළඹ පාලක පන්තිය එක්ක කරන පාර්ලිමේන්තු ගනුදෙනුවලටයි, කවදාවත් දෙමළ ජනතාවගේ වුවමනාවන්ට වැඩ නොකරපු (ඉදිරියටත් වැඩ කරන්නේ නැති) විදේශ අධිරාජ්‍යවාදී බලවතුන්ට කරන ආයාචනාවලටයි සීමා කළා. LTTE එකේ බෙදුම්වාදී වැඩපිළිවෙළ, දෙමළ තරුණයන්ගේ සාධාරණ කෝපයෙන් මතු වුණ එකක් වුණත්, ඒකට මූලික යථාර්ථය ජයගන්න බැරි වුණා. ඒ කියන්නේ, වෙන්වුණ දෙමළ ධනපති රාජ්‍යයක් කියන්නේ කොළඹ මිලිටරිය සන්නද්ධ කරලා නඩත්තු කරපු ඒ අධිරාජ්‍යවාදී බලවතුන් මතම යැපෙන, ආර්ථික වශයෙන් දුර්වල කුඩා කොටසක් විතරයි කියන එක. ඒ වගේම ඒකට උතුර සහ නැගෙනහිර ඇතුළේ වගේම පිටතත් ජීවත් වෙන දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් සහතික කරන්නවත්, මූලික පන්තිමය ප්‍රශ්නයට විසඳුම් දෙන්නවත් පුළුවන්කමක් තිබුණේ නැහැ.

**ඉදිරියට තියෙන පාර බෙදී වෙන්වීම නෙවෙයි.** ඒක දෙමළ වගේම සිංහල ප්‍රභූන් අතර සිද්ධ වෙන වාර්ගික ගනුදෙනුවකුත් නෙවෙයි. ඒක තමයි, දශක හතක් තිස්සේ තමන්ගේ පාලන මෙවලමක් විදිහට ජාතිවාදය (communalism) පාවිච්චි කරපු ධනපති ක්‍රමයට එරෙහිව පොදු අරගලයක් ඇතුළේ ලංකාවේ වැඩකරන පන්තිය — ඒ කියන්නේ දෙමළ, සිංහල, වගේම මුස්ලිම් කම්කරුවන් — ඒකාබද්ධ වීම.

**"ආයෙත් නම් කවදාවත් එපා" (Never Again) කියන එක අපෙන් ඉල්ලන්නේ මොනවාද?**

අපි "තවත් නම් එපා" කියලා කියනකොට, අපි කරන්නේ හැඟීම්බර ආයාචනයක් නෙවෙයි. අපි කරන්නේ දේශපාලන කැපවීමක්.

ආයෙ කවදාවත් පුස්තකාල ගිනිබත් කරන්න දෙන්නේ නැහැ කියන එකේ තේරුම තමයි ආයෙ කවදාවත් පාලක පන්තියට කිසිම ජනකොටසක සංස්කෘතික උරුමයන් පුච්චලා දාන්න අපි ඉඩ දෙන්නේ නැහැ කියන එක — මොකද ඒ ගින්න ඇවිලෙව්වේ ජාතිවාදී වෛරය තමන්ගේ මෙවලම විදිහට පාවිච්චි කරපු පන්ති පාලනයේ (class rule) අතින්මයි කියන එක අපි තේරුම් ගන්න නිසා.

ආයෙ කවදාවත් කළු ජූලියක් වෙන්න දෙන්නේ නැහැ කියන එකේ තේරුම තමයි තමන්ගේ පන්ති සහෝදර සහෝදරියන්ව මහා පරිමාණයෙන් ඝාතනය කරනකොට සිංහල කම්කරුවෝ ආයෙ කවදාවත් පැත්තකට වෙලා බලාගෙන ඉන්නේ නැහැ කියන එක — මොකද ඒ මහා ජන හිංසනය (pogrom) දෙමළ ජනතාවට එරෙහිව සංවිධානය කළේ පාලක පන්තියට තර්ජනයක් වෙන ඒ පන්ති එකමුතුව (class unity) වළක්වන්නයි කියන එක අපි තේරුම් ගන්න නිසා.

ආයෙ කවදාවත් මුල්ලිවයික්කාල් එකක් වෙන්න දෙන්නේ නැහැ කියන එකේ තේරුම තමයි සමාජයීය වගේම දේශපාලන ප්‍රශ්නයක් වෙච්ච දේකට ආයෙ කවදාවත් වැඩකරන පන්තිය "මිලිටරි විසඳුමක්" පිළිගන්නේ නැහැ කියන එක — මොකද දෙමළ සිවිල් වැසියන් සමූල ඝාතනය (massacre) කිරීමෙන් සේවය වුණේ සිංහල කම්කරුවන්ගේ වුවමනාවන්ට නෙවෙයි, ඊට පස්සේ සමාජ වියදම් කපාහැරීම් (austerity), මර්දනය, ඒ වගේම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් විනාශ කිරීම් හරහා තමන්ගේ තුවක්කු සිංහල කම්කරුවන් දෙසටම හරවපු මිලිටරි යාන්ත්‍රණයකයි පාලක පන්තියකයි වුවමනාවන්ට විතරයි කියන එක අපි තේරුම් ගන්න නිසා.

අද දවසේ තමන්ගේ ජාතික අභිමානය තියෙන්නේ මිලිටරි පෙළපාළිවලයි දෙමළ ස්මරණ යටපත් කිරීමෙයි කියලා විශ්වාස කරන්න සලස්වල තියෙන සිංහල කම්කරුවෝ, තරුණයෝ, — ඒ ගොල්ලෝ මංකොල්ලකෑමකට ලක්වෙලයි ඉන්නේ. ඒගොල්ලන්ගේ පන්ති විඥානය (class consciousness), තමන්ගේම සහෝදර කම්කරුවන් එක්ක තියෙන සහෝදරත්වය (solidarity), ඒ වගේම තමන්ගේම නිදහස වෙනුවෙන් සටන් කරන්න තියෙන හැකියාව කියන ඒව තමයි ඒගොල්ලන්ගෙන් මංකොල්ලකාලා තියෙන්නේ. යාපනය පුස්තකාලය ගිනි තියපු ඒ පාලක පන්තියම තමයි සිංහල කම්කරුවන් මතටත් දරිද්‍රතාවය, අනියම් ශ්‍රම සූරාකෑම, ඒ වගේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) කප්පාදු බර පටවලා තියෙන්නේ. මුල්ලිවයික්කාල්වලදී දෙමළ වැසියන්ව සමූල ඝාතනය කරපු ඒ මිලිටරියම තමයි වර්ජනය කරන කම්කරුවන්ව හිරේ දාන, ඒ වගේම වෘත්තීය සමිති කඩලා බිඳලා දාන රාජ්‍යයක මෙවලම විදිහට වැඩකරන්නේ. දෙමළ කම්කරුවන්ගේ හතුරාම තමයි සිංහල කම්කරුවන්ගේත් හතුරා වෙන්නේ. ඒ හතුරාගේ නම දෙමළ හරි සිංහල හරි නෙවෙයි. ඒකේ නම තමයි ප්‍රාග්ධනය (Capital), එහෙම නැත්නම් ධනපති පන්ති පාලනය.

**අපි සටන් කරන්නේ මොනවා වෙනුවෙන්ද?**

තමන්ව විතරක් නියෝජනය කරන ප්‍රභූන් විසින් මැදිහත් වෙලා කරන ජාතික සමගි සන්ධාන (reconciliation) ව්‍යාපාරයක් නෙවෙයි, මෙන්න මේ අපි කියන්න යන දේවල් වෙනුවෙන් සටන් කරන වැඩකරන පන්තියේ ඒකාබද්ධ ව්‍යාපාරයක් ගොඩනගන්න කියලා දෙමළ වගේම සිංහල කම්කරුවන්, තරුණයන්, ගුරුවරුන්, ශිෂ්‍යයන්, ඒ වගේම බුද්ධිමතුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා:

උතුර වගේම නැගෙනහිර පළාත් මිලිටරිය මඟින් අත්පත් කරගෙන ඉන්න එක වහාම නතර කිරීම, ඒ වගේම අත්පත් කරගෙන තියෙන හැම දෙමළ ඉඩමක්ම ඒවයේ නියම අයිතිකරුවන්ට ආපහු ලබාදීම. කිසිම හිරිහැරයක්, කඩාකප්පල් කිරීමක්, එහෙම නැත්නම් අපරාධකරණය කිරීමක් නැතුව මුල්ලිවයික්කාල්වලදී වගේම දරුණු අපරාධ සිද්ධ වුණ හැම තැනකදීම මියගිය දෙමළ ජනතාව සිහිපත් කිරීමේ

අයිතිය ලබාදීම. තමන්ටම ආවේණික වෙච්ච ජාතිවාදී පීඩාවලට මුහුණ දීපු මුස්ලිම් ජනතාව ඇතුළු දෙමළ වගේම හැම ජාතික සුළුතරයකටම සම්පූර්ණ භාෂාමය, සංස්කෘතික, වගේම ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම් ලබාදීම. සිංහල සමාජය ඇතුළට වස විදිහට කාවද්දලා තියෙන, මිනීමැරීම උත්කර්ෂයට නංවන, ඒ වගේම සහෝදරත්වය යටපත් කරන මිලිටරිවාදී සංස්කෘතිය අවසන් කිරීම. කළු ජූලියේ ඉඳන් මුල්ලිවයික්කාල් දක්වා සිද්ධ වුණ යුද අපරාධ වගේම මනුෂ්‍යත්වයට එරෙහි අපරාධවලට වගකිවයුතු අයට විරුද්ධව නඩු පැවරීම. ඒ වගේම හැමදේටම වඩා — මේ දිවයිනේ තියෙන සම්පත් — ඒ කියන්නේ ඉඩම්, ශ්‍රමය, වගේම නිෂ්පාදන ධාරිතාවය — සිංහල, දෙමළ, වගේම මුස්ලිම් වැඩකරන ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය යටතට පත්කරන සමාජවාදී දේශපාලන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම. ඒ හරහා දරිද්‍රතාවය, වාර්ගික බෙදීම් වගේම පාලක පන්තියේ උගුල් ඒවයේ මුල්වලින්ම අතුගාලා දාන්න පුළුවන් වෙනවා.

යාපනය පුස්තකාලය ඇතුළේ තිබුණේ ශිෂ්ටාචාරයක මතකයක්. ඒක ඇතුළේ ආයෙ කවදාවත් හොයාගන්න බැරි පොත්පත් තිබුණා. හැබැයි ඒක අපිට ආදේශ කරන්න බැරි දේශපාලන පාඩමකුත් ඉතිරි කරලා තියෙනවා: ඒ කියන්නේ පුස්තකාලයක් පුච්චන්න ලෑස්ති පාලක පන්තියක් කියන්නේ තමන්ගේ බලයයි ලාභයයි ආරක්ෂා කරගන්න ඕනෙම දෙයක් පුච්චන්න ලෑස්ති පාලක පන්තියක් කියන එකයි — ඒගොල්ලෝ ගම්මාන පුච්චන්න, සිවිල් වැසියන් සමූල ඝාතනය කරන්න, ඒ වගේම මුළු මහත් ජනකොටස්ම විනාශ කරන්න වුණත් ලෑස්ති අය.

අදට අවුරුදු 45 කට කලින් මේ රෑ විනාශ කරපු දේවල්වල මතකය අපි ස්මරණය කරන්නේ නිකම්ම නිකන් වැලපීමෙන් විතරක් නෙවෙයි, කැපවීමෙන් — ඒ කියන්නේ මේ වගේ විනාශයන් සිද්ධ කරන්න අවශ්‍ය කරන ක්‍රමය අවසන් කරලා, ඒ වගේ විනාශයන් කරන්න කවදාවත් ඉඩ නොදෙන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමට කැපවීමෙන්.

උරුමයක් අළු දූවිලි බවට පත් කෙරුණා. ඒත් අරගලය තවමත් ජීවමානයි!

**උතුරේ වගේම දකුණේ වැඩකරන පන්තියේ එකමුතුවෙන් — "ආයෙත් නම් කවදාවත් එපා!"**

---

වැඩසටහන, සම්බාධක සහ කලාපීය ආරක්ෂාව පිළිබඳව පසුව සාකච්ඡා කිරීමට දෙපාර්ශවයම බැඳී සිටී.

මෙම ගිවිසුම සැබවින්ම ක්‍රියාත්මක වේද යන්න තවමත් අවිනිශ්චිතය. එහි සැබෑ පිටපත මෙතෙක් ප්‍රසිද්ධ කර නොමැත. අත්හිටුවා තිබූ ඩොලර් බිලියන 25 ක පමණ ඉරාන වත්කම් නිදහස් කර ඇති බව ඉරානය ප්‍රකාශ

# ඉරානය තුළ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පරාජය

**ඇන්ඩ්‍රේ ඩේමන්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ජූනි *16* දින ***"US imperialism's debacle in Iran"*** යන හිසින් පළවූ ඇන්ඩ්‍රේ ඩේමන් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

පසුගිය පෙබරවාරි 28 වැනිදා ට්‍රම්ප් පරිපාලනය විසින් ආරම්භ කරන ලද යුද්ධයේ සටන් විරාම ගිවිසුමක් ඇමරිකා එක්සත් ජනපදය සහ ඉරානය විසින් ඉරිදා ප්‍රකාශයට පත් කරන ලදී. ඉරාන ජාතිකයන් 3,000 කට වඩා ඝාතනය කරමින් සහ ගෝලීය ආහාර හා බලශක්ති අර්බුදයක් ඇති කර තිබියදීත්, ඇමරිකා එක්සත් ජනපදය තමන් යුද්ධයට අවතීර්ණ වූ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අසමත් වී ඇත.

ඉරිදා දින "අවබෝධතා ගිවිසුමක්" ඩිජිටල් ලෙස අත්සන් කරන ලද අතර, නිල අත්සන් කිරීමේ උත්සවයක් සිකුරාදා ස්විට්සර්ලන්තයේ දී පැවැත්වීමට නියමිතය. වාර්තා වන පරිදි දින 60 ක කාලරාමුවක් සහිත මෙම ගිවිසුම මගින් හෝර්මුස් සමුද්‍ර සන්ධිය (Strait of Hormuz) නැවත විවෘත කිරීම, ඇමරිකානු නාවික අවහිරය ඉවත් කිරීම සහ ලෙබනනය ඇතුළු ප්‍රදේශවල මිලිටරි මෙහෙයුම් වහාම අත්හිටුවීම අපේක්ෂා කෙරේ. එමගින් ඉරානයේ න්‍යෂ්ටික කර ඇතත්, ඇමරිකාව එය හබ කර ඇත. ට්‍රම්ප් නැවතත් අවධාරණය කර ඇත්තේ "ඉරානයට කිසිදා න්‍යෂ්ටික ආයුධයක් හිමි කර ගැනීමට ඉඩ නොදෙන" බව වන අතර සාකච්ඡා අසාර්ථක වුවහොත් ඇමරිකාව "නැවතත් ඉරානයට ප්‍රහාර එල්ල කළ හැකි" බවට අනතුරු අඟවා ඇත. මෙම ගිවිසුමේ පාර්ශවකරුවෙකු නොවන ඊශ්‍රායලය එය ප්‍රතික්ෂේප කර ඇති අතර එදිනම ලෙබනනයට ප්‍රහාර එල්ල කිරීම ද දිගටම කරගෙන ගියේය.

කෙසේ වෙතත්, මෙහි ප්‍රතිඵලය ඇමරිකානු අධිරාජ්‍යවාදයට එල්ල වූ අවිවාදිත පරාජයක් (debacle) නිරූපණය කරයි. මෙය පාසල් භූමියක සිටින වණ්ඩියෙකු රණ්ඩුවක් පටන් ගෙන අවසානයේ ඇසක් කළු කරගෙන (ගුටි කා) පරාජය වීම වැනි තත්ත්වයකි. ඉරාන රජය තවමත් බලයේ පවතී. ඔවුන්ගේ න්‍යෂ්ටික වැඩසටහනට හානියක් වී නැත. මෙමගින් ලැබුණු වඩාත්ම සැබෑ ප්‍රතිඵලය වන්නේ හෝර්මුස් සමුද්‍ර සන්ධිය නැවත විවෘත කිරීමයි, එනම් යුද්ධයට පෙර පැවති තත්ත්වයටම නැවත පත්වීමයි.

යුද්ධය ආරම්භ කරන විට පල කළ පාරට්ටු කර ගැනීම් (braggadocio) සහ එහි ප්‍රතිඵලයේ සැබෑ ස්වභාවය අතර විශාල පරතරයක් පවතී. ඉරානයේ "කොන්දේසි විරහිත යටත් වීමෙන්" යුද්ධය අවසන් වන බවට ට්‍රම්ප් පොරොන්දු විය. ආරක්ෂක ලේකම් පීට්

හෙග්සෙත් (Pete Hegseth) මාර්තු 2 වැනිදා ප්‍රකාශ කළේ ඇමරිකා එක්සත් ජනපදය “කිසිදු මෝඩ සටන් නීති රීතිවලින් තොරව” ඉතිහාසයේ “වඩාත්ම මාරාන්තික ගුවන් බලශක්ති මෙහෙයුම” දියත් කරන බවයි. දින කිහිපයකට පසු ඔහු මාධ්‍යවේදීන්ට පොරොන්දු වූයේ “දවස පුරා අහසින් මරණය සහ විනාශය” ළඟා කර දෙන බවයි.

ඉරාන රජය බිඳ දැමීමට මේ වසර පුරා උත්සාහ කරමින් සහ පෙබරවාරි මාසයේදී ඉරාන වැසියන්ගෙන් “ඔබේ රජය අත්පත්කර ගන්නා ලෙස” ඉල්ලා සිටි ට්‍රම්ප්, ඉරිදා වෝල් ස්ට්‍රීට් ජර්නල් (Wall Street Journal) වෙත පැවසුවේ: “මම කවදාවත් පාලන තන්ත්‍රය වෙනස් කිරීම (regime change) ගැන තැකීමක් කළේ නැහැ” යනුවෙනි

මාධ්‍ය පුරා ඇමරිකානු අධිරාජ්‍යවාදයේ පරාජය පිළිබඳ විවරණයන්ගෙන් පිරී පවතී. වෝල් ස්ට්‍රීට් ජර්නල් පුවත්පත මෙය හඳුන්වා දී ඇත්තේ “තම යුධ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වූ මූලුපායික පසුබැසීමක්” ලෙසය. 1991 දී සෝවියට් සංගමය (USSR) බිඳවැටීමත් සමඟ ආරම්භ වූ, අභියෝගයට ලක් නොවුණු ඇමරිකානු ආධිපත්‍යයේ යුගය අවසන් වී ඇති බවට ලෝකය ඉදිරියේ ප්‍රායෝගිකව පෙන්නුම් කළ අවස්ථාව මෙයයි.

ඇමරිකානු පාලක පන්තියේ ප්‍රතිචාරයේ දේශපාලන ස්වභාවය, ඩිමොක්‍රටික් පක්ෂය වෙනුවෙන් හඬ නගන නිව්යෝර්ක් ටයිම්ස් (New York Times) පුවත්පත “ජනාධිපති ට්‍රම්ප් මේ යුද්ධය පැරදුණා” යන සිරස්තලයෙන් පළ කළ කතුවැකියෙන් මනාව පැහැදිලි වේ. ටයිම්ස් පුවත්පතේ කනස්සල්ල වී ඇත්තේ මෙම යුද්ධය මහා පරිමාණ මිනිස් ඝාතන සහ ඝාතන දේශපාලනයක් ඔස්සේ සිදු කිරීම ගැන නොව, එය අසාර්ථක වීම ගැනය.

“ට්‍රම්ප් මහතා මේ යුද්ධය ආරම්භ කිරීමෙන් බරපතල වැරැද්දක් කළා,” යැයි එම කතුවැකියේ සඳහන් වේ. “ඔහු එය මෙහෙයවූයේ පරිස්සම නොතකාම සහ නීතිය විවෘතව උල්ලංඝනය කරමිනි. ඇමරිකා එක්සත් ජනපදය මිලිටරිමය, රාජ්‍ය තාන්ත්‍රික සහ ආර්ථික වශයෙන් දුර්වලව ඉන් මතු වෙන අතර ඉදිරි වසර ගණනාව තුළ මෙහි මූලෝපායික පිරිවැය ගෙවීමට සිදුවනු ඇත.” ටයිම්ස් පුවත්පත දුක් වෙමින් පවසන්නේ “සමස්තයක් ලෙස ගත් කල, මෙම සිව්මස් යුද්ධයේ මූලෝපායික ජයග්‍රාහකයා ලෙස ඉරානය මතු වන” බවයි. ඇමරිකානු මිලිටරිය තමන් සතු දිගු දුර නිරවද්‍ය මිසයිල සහ ප්‍රතිරෝධක මිසයිල බොහොමයක් ක්ෂය කර දැමූවද, තමන්ට වඩා බෙහෙවින් කුඩා ප්‍රතිවාදියෙකු මර්දනය කිරීමට නොහැකි බව පෙන්වා දී ඇත. මෙම ප්‍රතිඵලය වෙනත් විභව (potential) ප්‍රතිවාදීන් අධෛර්යමත් කිරීමට (deter) මෙම රටට ඇති හැකියාවට හානි පමුණුවයි.”

එම කතුවැකියේ අවසන් නිගමනය මෙම ප්‍රකාශයට ලඝු වේ: “පෙන්ටගනයට නූතනකරණය වීමට සහ අනාගත යුද්ධ සඳහා සූදානම් වීමටද අවශ්‍ය වනු ඇත.”

අනාගත යුද්ධ. විශේෂයෙන්ම චීනය සහ රුසියාව සමඟ පවතින ස්ථිර අධිරාජ්‍යවාදී ගැටුම්කාරී රාමුව නිව්යෝර්ක් ටයිම්ස් පුවත්පත සාමාන්‍ය දෙයක් ලෙස සලකන අතර, ඒ සඳහා පෙන්ටගනය “නූතනකරණය වී සූදානම් විය යුතුය”. මෙහිදී ප්‍රශ්නයකට ලක්ව ඇත්තේ එම රාමුව පාලනය කරනු ලබන දක්ෂතාවය (competence) පිළිබඳව පමණි.

කොංග්‍රස් මණ්ඩලයේ ඩිමොක්‍රටික් පාර්ශවයේ ප්‍රතිචාරයද ක්‍රියාත්මක වන්නේ එම රාමුව තුළමය. සෙනෙට් සභික ක්‍රිස් මර්ෆි (Chris Murphy) මෙම ගිවිසුම හැඳින්වූයේ “මූලික වශයෙන් ඉරානයට යටත් වීමක්” ලෙසය. නියෝජිත (සභික) සෙත් මෝල්ටන් (Seth Moulton) එය හැඳින්වූයේ “මූලික වශයෙන් ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ඉරානයේ උත්තරීතර නායකයා වෙත ලබා දුන් යටත් වීමේ ලේඛනයක්” ලෙසය. සෙනෙට් සභික ජැක් රීඩ් (Jack Reed) මැසිවිලි නැඟුවේ ඔබාමා යුගයේ න්‍යෂ්ටික ගිවිසුම වූ JCPOA යටතේ තිබූ ප්‍රමාණයටත් වඩා “අඩු දෙයක්” දැන් ඇමරිකාවට ලැබෙන බවයි. ඩිමොක්‍රටික් පාර්ශවය යුද්ධය ආරම්භ කරන විට එය අනුමත කළේය. ඔවුන් දැන් ඒ ගැන මැසිවිලි නඟන්නේ ඉරානය විනාශ නොකර යුද්ධය අවසන් වූ නිසා පමණි.

යුද්ධයට එරෙහිව දැවැන්ත ජනතා විරෝධයක් පැවති නමුත්, නිල දේශපාලන රාමුව තුළ එයට කිසිදු ප්‍රකාශනයක් (නියෝජනයක්) ලැබුණේ නැත.

**යුද්ධයේ මෙම අදියර අවසන් වීමෙන් යුද්ධය මුළුමනින්ම අවසන් වූ බවක් අදහස් නොවේ. ඇමරිකානු අධිරාජ්‍යවාදය තම තත්ත්වය යථා තත්ත්වයට පත් කර ගැනීම සඳහා නව යුද්ධ සූදානම් කරනු ඇත.** ඔබාමා යටතේ පිහිටුවන ලද 2015 JCPOA රාමුව 2018 දී ට්‍රම්ප් විසින් අවසන් කරන ලද අතර එය 2026 යුද්ධයට මග පෑදීය. මෙම 2026 සටන් විරාම රාමුව ඊළඟට එන යුද්ධයට මග පාදනු ඇත.

කෙසේ වෙතත්, මෙම දැවැන්ත පරාජයේ වඩාත්ම කැපී පෙනෙන ප්‍රතිවිපාක දැකගත හැකි වන්නේ ඇමරිකා එක්සත් ජනපදය තුළමය.

**මෙම යුද්ධය දියත් කරන ලද්දේ, එක් අතකින් ඇමරිකානු ධනවාදයේ ව්‍යුහාත්මක පරිහානිය නැවැත්වීමේ උත්සාහයක් වශයෙනි.** යුරෝපීය මහ බැංකුව මේ මාසයේ වාර්තා කළේ රන්, යුරෝ මුදල් ඒකකය අභිබවා යමින් ලොව දෙවන විශාලතම සංචිත වත්කම බවට පත්ව ඇති බවයි. එය වසරකට පෙර පැවති 20% සිට ගෝලීය සංචිතවලින් 27% දක්වා ඉහළ ගොස් ඇත. ෆෙඩරල් ණය ප්‍රමාණය 1946 න් පසු පළමු වතාවට මාර්තු මාසයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් (GDP) 100% සීමාව පසු කළේය. යුද්ධයේ අසාර්ථකත්වය ඩොලරයේ පරිහානිය වේගවත් කර ඇති අතර යුද්ධයෙන් විසඳීමට බලාපොරොත්තු වූ

ව්‍යුහාත්මක අර්බුදය තවදුරටත් උග්‍ර කර ඇත.

යුද්ධය දියත් කරන ලද්දේ සමාජ ගැටුම් උත්සන්න වෙමින් පැවති පසුබිමකය. යුද්ධය ආරම්භ වීමට සති කිහිපයකට පෙර, මිනියාපොලිස් හි ෆෙඩරල් ඒජන්තයින් විසින් 37 හැවිරිදි කවියෙකු වූ රෙනී නිකෝල් ගුඩ් (Renée Nicole Good) සහ 37 හැවිරිදි හෙදියක වූ ඇලෙක්ස් ප්‍රෙට්ටි (Alex Pretti) ඝාතනය කිරීමෙන් පසු ICE (ආගමන හා රේගු බලාත්මක කිරීමේ ආයතනය) ට එරෙහිව මහා පරිමාණ ජනතා විරෝධතා තීව්‍ර විය. **ට්‍රම්ප් පරිපාලනය විසින් යුද්ධය දියත් කිරීම, අනෙකුත් කරුණු අතර, මෙම වර්ධනය වෙමින් පැවති විරෝධය දේශප්‍රේමී යුධ උණක් වෙත හරවා යැවීමේ උත්සාහයක් විය.**

සමාජ විරෝධය දැන් තවදුරටත් උත්සන්න වනු ඇති අතර, එය වැඩි වැඩියෙන් කම්කරු පන්තිය කේන්ද්‍ර කර ගනු ඇත. ඇමරිකන් ඇක්සල් (American Axle) හි මෝටර් රථ කොටස් නිෂ්පාදන කම්කරුවන් මේ මාසයේ වැඩ වර්ජනයක නිරත විය. දුම්රිය සේවකයන්, මස් ඇසුරුම් කරන්නන්, ගුරුවරුන් සහ හෙදියන් සේවයෙන් ඉවත් වී ඇත (walked out). ඉරිදා ගිවිසුමේ ආරංචියත් සමඟ වෝල් ස්ට්‍රීට් කොටස් වෙළඳපොළ ඉහළ ගියද, ඉන්ධන සහ ආහාර මිල ගණන් තවමත් යුද්ධයට පෙර පැවති මට්ටමට වඩා බෙහෙවින් ඉහළ මට්ටමක පවතී. පුද්ගලික පරිභෝජන වියදම් (PCE) උද්ධමනය 3.8% දක්වා ඉහළ ගොස් ඇති අතර එය 2021 න් පසු ඉහළම වේගයයි. පාරිභෝගික විශ්වාසය (Consumer sentiment) ඉතිහාසයේ අවම මට්ටමක පවතින අතර, එය මහා අවපාතය (Great Recession) හෝ වසංගත කාලයටත් වඩා දරුණුය.

සමාගම් ලාභ ලබන අතරතුර, කම්කරුවන්ට සිදු වූයේ මිල ඉහළ යාම හරහා යුද්ධයේ බර දැරීමටය. මෙම ආර්ථික බලපෑම ඉදිරි වසර ගණනාව තුළ ඇමරිකාව තුළ මෙන්ම ජාත්‍යන්තරවද පන්ති අරගල සඳහා ඉන්ධන සපයනු ඇත. **යුද්ධය ඇති කරන එම අර්බුදයම, යුද්ධයට එරෙහිව කම්කරු පන්තියේ ගෝලීය ව්‍යාපාරයක් ද බිහි කරමින් පවතී.**

ගැඹුරු වන සමාජ විරෝධයට ට්‍රම්ප් පරිපාලනය ප්‍රතිචාර දක්වනු ඇත්තේ තමන් දැනටමත් ප්‍රදර්ශනය කර ඇති ක්‍රමවේදයන් මඟිනි: එනම් ICE වැටලීම්, මහා පරිමාණ රැඳවුම් යටිතල පහසුකම්, දේශීය විරෝධතාවලට එරෙහිව ජාතික ආරක්ෂක බලකාය (National Guard) යෙදවීම, දේශපාලන විරුද්ධවාදිකම් අපරාධකරණය කිරීම සහ ඒකාධිපති රාජ්‍ය බලය තහවුරු කිරීම මඟිනි. ඉරානය තුළ ලැබූ පරාජය මෙම ගමන මන්දගාමී නොකරනු ඇත; එය තවදුරටත් තීව්‍ර කරනු ඇත. **විදේශයන්හි තම අධිරාජ්‍යවාදී ප්‍රහාරයේ අසාර්ථකත්වයට මුහුණ දෙන ඇමරිකානු පාලක පන්තිය, මෙරට කම්කරු පන්තියට එරෙහිව නව ම්ලේච්ඡත්වයකින් හැරෙනු ඇත.**

දැන් පවතින කාර්යභාරය වන්නේ ජාත්‍යන්තර මට්ටමේ වපසරියක් සහිත, සමාජවාදී වැඩපිළිවෙළක් සහ තම අරමුණු පිළිබඳ දේශපාලනික සවිඥානිකත්වයක් ඇති කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීමයි.

(අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි)

---

## කම්කරුවනි, පීඩිත ජනතාවනි, තරුණයිනි, ශිෂ්‍යයිනි,

**ගාසා ජන සංහාරය නවතනු!**

**අධිරාජ්‍යවාදය භංග කරනු! සයොන්වාදය පරාජය කරනු!**

**යුද අපරාධකරුවන් වගවීමට ලක් කරනු!**

**ඉරානයට අත නොතබනු - ඇමරිකානු-ඊශ්‍රායල යුද්ධය වහා නවතනු!**

**සියලුම ඇමරිකානු හමුදා නැවත කැඳවනු! කළුවුරු වසා දමනු!**

**තෙල් සඳහා තවත් ලේ නැත — සම්පත් අත්පත් කර ගැනීම අවසන් කරනු!**

**මිලිටරිය සඳහා අරමුදල් නවතනු! පාසල්, රෝහල්, නිවාස සඳහා අරමුදල් සපයනු!**

**ඉරාන කම්කරුවන් සමඟ සහයෝගීතාවය ගොඩ නගනු! අධිරාජ්‍යවාදී ආක්‍රමණයට හා පාලක රෙජීමයට එරෙහිව ඉරාන ජනතාව ආරක්ෂා කරනු!**

**කම්කරු ක්‍රියාකාරී කමිටු ගොඩනගනු! ජාත්‍යන්තරව සෑම සේවා ස්ථානයකම කාර්මික ශක්තිය එක්සත් කරනු!**

**වැඩ අඩාල කිරීමේ සිට මහා වැඩ වර්ජනය දක්වා සටන් කරනු! යුද යන්ත්‍රය නවතනු!**

**කම්කරු පන්තියේ ස්වාධීන බලය ගොඩ නගනු!**

**IMF කප්පාදු එපා! සියලු විදෙස් ණය අහෝසි කරනු!**

# යුරෝපානු සංගම් (EU) සමුළුව යුද මාවත වේගවත් කරයි: ආයුධ ගොඩනැඟීම, වෙළඳ යුද්ධය, සමාජ කප්පාදු සහ සරණාගත විරෝධී පියවර

**ජොහැන්නස් ස්ටර්න්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ජුනි *11* දින ***"EU summit accelerates war course: Arms build-up, trade war, social cuts and anti-refugee measures"*** යන හිසින් පළවූ ජොහැන්නස් ස්ටර්න් විසින් ලියන ලද ලිපියේ සිංහල පරිවර්තනය යි.




ජර්මානු චාන්සලර් ෆ්‍රෙඩ්රික් මර්ස් 2026 ජුනි 18-19 දිනවල බ්‍රසල්ස් හි පැවති EU සමුළුවේදී කතා කරයි. [AP ඡායාරූපය/මාරියස් බර්ගල්මන්]

බ්‍රහස්පතින්දා සහ සිකුරාදා බ්‍රසල්ස් හි පැවැත්වුණු යුරෝපා සංගම් (EU) සමුළුව සෑම අතින්ම යුද සමුළුවක් විය. "ආරක්ෂාව", "තරඟකාරිත්වය", "ප්‍රත්‍යස්ථතාව" සහ "සංක්‍රමණ" වැනි නිල සූත්‍රගත කිරීම් පිටුපස සැඟවී ඇත්තේ නැවත ප්‍රතිසන්නද්ධ වීම, යුද්ධය උත්සන්න කිරීම, සමාජ කප්පාදු සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිවාසිකම්වලට ප්‍රහාර එල්ල කිරීමේ පුළුල් වැඩපිළිවෙලකි.

යුක්රේනය සඳහා වන මිලිටරි ආධාර දැවැන්ත ලෙස පුළුල් කිරීමටත්, මුළු මහද්වීපය පුරාම ආයුධ නිෂ්පාදනය වේගවත් කිරීමටත්, 2030 වන විට යුරෝපා සංගමය යුද්ධයට සූදානම් කිරීමටත් යුරෝපා සංගමයේ රාජ්‍ය සහ ආණ්ඩු ප්‍රධානීහු තීරණය කළහ. එම සමගම ඔවුහු, මැදපෙරදිග කලාපය තුළ යුරෝපය සඳහා වඩාත් විශාල මිලිටරි භූමිකාවක්, චීනයට එරෙහිව වඩාත් දැඩි වෙළඳ යුද ප්‍රතිපත්තියක්, නැවත ප්‍රතිසන්නද්ධ ගැන්වීමේ අවශ්‍යතාවලට වඩ වඩාත් යටත් කරන ලද නව යුරෝපා සංගම් අයවැයක් සහ සරණාගත ප්‍රතිපත්තිය තවදුරටත් දැඩි කිරීම පිළිබඳව සාකච්ඡා කළහ.

මෙම සමුළුව සෘජුවම ගලා ආවේ, සතියකට පෙර ජර්මන් චාන්සලර් ෆ්‍රීඩ්රික් මර්ස් විසින් බුන්ඩෙස්ටැග් (ජර්මන් පාර්ලිමේන්තුව) වෙත ඉදිරිපත් කරන ලද ඔහුගේ ආණ්ඩු ප්‍රකාශය මගින් පනවන ලද ප්‍රතිගාමී මාවතෙනි. මර්ස් ප්‍රකාශ කළේ, නැවත ප්‍රතිසන්නද්ධ ගැන්වීම, යුරෝපීය "තරඟකාරිත්වය" ශක්තිමත් කිරීම සහ සරණාගතයින් පලවා හැරීම යුරෝපා සංගමයේ කේන්ද්‍රීය කාර්යයන් විය යුතු බවයි. එම අවස්ථාවේදීම, එහි පිරිවැය දරාගත යුත්තේ කවුරුන්ද යන්න ඔහු පැහැදිලි කළේය: එනම් කම්කරු පන්තියයි. මිලිටරිමය වශයෙන් නැවත ප්‍රතිසන්නද්ධ ගැන්වීමට ප්‍රතිපාදන සැපයීම සඳහා ජනගහනය "අනෙකුත් ක්ෂේත්‍රවලද සීමා කිරීම් පිළිගත යුතු" බව ඔහු පැවසීය.

දැන් බ්‍රසල්ස් හිදී සම්මත කරගෙන ඇති වැඩපිළිවෙල යනු මෙම යුද න්‍යාය පත්‍රය යුරෝපය පුරා ක්‍රියාවට නැංවීමයි.

මෙහි කේන්ද්‍රයේ පැවතියේ, යුක්රේනය තුළ රුසියාවට එරෙහිව නේටෝව (NATO) ගෙන යන යුද්ධය තවදුරටත් උත්සන්න කිරීමයි. යුක්රේන ජනාධිපති වොලොඩිමියර් සෙලෙන්ස්කි පෞද්ගලිකවම මෙම සමුළුවට සහභාගී වූ අතර, තව තවත් ආයුධ, පතොරම්, ගුවන් ආරක්ෂක පද්ධති සහ කඩිනම් යුරෝපා සංගම් සාමාජිකත්වය ඉල්ලා සිටියේය. යුරෝපා සංගම් නායකයෝ යුක්රේනය සඳහා වන ඔවුන්ගේ "නොසැලෙන" සහයෝගය යළිත් සහතික කළ අතර, ඔවුන්ගේ දේශපාලන, මූල්‍ය, ආර්ථික සහ මිලිටරි ආධාර අඛණ්ඩව ලබා දීමට පොරොන්දු වූහ.

යථාර්ථය නම්, මෙය "සහයෝගයක්" වීම බොහෝ කලකට පෙර නතර වී ඇති අතර එය යුද්ධයට සෘජුවම සම්බන්ධ වීමක් බවට පත්ව ඇත. යුරෝපීය බලවත්තු යුක්රේන රාජ්‍ය අයවැයට ප්‍රතිපාදන සපයමින්, වඩ වඩාත් දිගු දුර

විහිදෙන ආයුධ පද්ධති සපයමින්, යුක්රේන සෙබළුන් පුහුණු කරමින්, බුද්ධි තොරතුරු සපයමින් සහ යුක්රේන යුද මෙහෙයුම් ඔවුන්ගේම මිලිටරි සැලසුම්වලට වඩ වඩාත් සමීපව අනුකලනය කරමින් සිටිති. 2026 සහ 2027 වර්ෂ සඳහා වන යුරෝ බිලියන 90 ක ණය මුදලක පළමු වාරිකය ජූනි මස අවසානයට පෙර නිකුත් කරන බව සමුළුව යළිත් තහවුරු කළේය. එම අවස්ථාවේදීම, ඔවුන්ගේ ද්විපාර්ශ්වික මිලිටරි ආධාර අඛණ්ඩව පවත්වාගෙන යන ලෙස සාමාජික රටවලින් ඉල්ලා සිටින ලදී.

ආයුධ සහයෝගීතාව පිළිබඳ තීරණ විශේෂයෙන්ම භයානක ය. ගුවන් ආරක්ෂක පද්ධති, පතොරම්, ඩ්‍රෝන යානා සහ මිසයිල නිෂ්පාදනය හා බෙදා හැරීම "කඩිනමින්" වේගවත් කරන ලෙස යුරෝපා සංගමය ඉල්ලා සිටියි. යුරෝපීය සහ යුක්රේන ආයුධ කර්මාන්ත අතර සහයෝගීතාව තවදුරටත් ගැඹුරු කිරීමට නියමිතය. **මෙඟින් යුක්රේනය යුරෝපීය යුද ආර්ථිකයට තවදුරටත් සෘජුවම සම්බන්ධ කෙරේ.**

මෙහිදී ප්‍රමුඛ භූමිකාවක් ඉටු කරන්නේ ජර්මනියයි. මීට සති කිහිපයකට පෙර, ෆෙඩරල් ආණ්ඩුව කියෙව් (Kiev) පාලනය සමඟ එකඟ වූයේ, රුසියාවේ අභ්‍යන්තරයටම ප්‍රහාර එල්ල කළ හැකි දිගු දුර ඩ්‍රෝන යානා සහ අනෙකුත් ආයුධ පද්ධති ඒකාබද්ධව සංවර්ධනය කිරීමට සහ නිෂ්පාදනය කිරීමටයි. පිස්ටෝරියස්, මර්ස් සහ සෙලෙන්ස්කි එකල විවෘතවම පැහැදිලි කළේ, මෙය තවදුරටත් යුක්රේන භූමිය ආරක්ෂා කිරීම ගැන පමණක් නොව, රුසියානු නගර, පිරිපහදු, බලශක්ති පහසුකම්, මිලිටරි කඳවුරු සහ කාර්මික මධ්‍යස්ථානවලට ප්‍රහාර එල්ල කිරීම ගැන වන බවයි.

මෙහි ප්‍රතිවිපාක ගණන් බලාගත නොහැකි තරම්ය. යුක්රේන හමුදාව දැනටමත් රුසියාවේ අභ්‍යන්තරයටම නිරන්තරයෙන් ඩ්‍රෝන ප්‍රහාර එල්ල කරමින් සිටියි. එවැනි ප්‍රහාරයන්ට ඉඩ සලසන බටහිර රාජ්‍යයන් යුද්ධයේ පාර්ශවකරුවන් ලෙස සලකන බව ක්‍රෙම්ලිනය නැවත නැවතත් ප්‍රකාශ කර ඇත. ඒ සමගම, යුරෝපීය බලවත්තු යුක්රේනය සඳහා වන අනාගත "ආරක්ෂක සහතිකයන්" තුළ තමන්ම ප්‍රධාන භූමිකාවක් භාර ගැනීමටත්, තමන්ගේම යුරෝපා සංගම් සෙබළුන් පවා යුක්රේනයට අනුයුක්ත කිරීමටත් වඩ වඩාත් විවෘතව බලපෑම් කරමින් සිටිති.

සමුළුවේ නිල නිගමනවල සඳහන් වන්නේ: "යුක්රේනයේ සාමය කරා යන මාවත යුක්රේනය නොමැතිව තීරණය කළ නොහැක." ඊට සෘජුවම පසුව තීරණාත්මක වාක්‍යය පැමිණේ: "යුරෝපා සංගමය එහි හැකියාවට හෝ එහි ආරක්ෂාවට බලපාන කරුණු පිළිබඳව තීරණය කරනු ඇත." ඊළඟ කරුණ මෙසේ ඉදිරියට යයි: "ඕනෑම අනාගත සමථයකදී යුරෝපයට ඉටු කිරීමට ප්‍රධාන භූමිකාවක් ඇති අතර එය තම අවශ්‍යතා ආරක්ෂා කිරීමට සූදානම්ව සිටියි."

අනාගත "ආරක්ෂක සහතික" පිළිබඳ ඡේදය ද විශේෂයෙන්ම දුරදිග යන්නකි. යුරෝපීය කවුන්සිලය ප්‍රකාශ කරන්නේ, යුරෝපා සංගමය සහ එහි සාමාජික රටවල් "විශේෂයෙන්ම කැමැත්ත ඇති අයගේ සන්ධානය (Coalition of the Willing) හරහා සහ එක්සත් ජනපදය සමඟ සහයෝගීතාවයෙන් යුක්රේනය සඳහා ශක්තිමත් සහ විශ්වසනීය ආරක්ෂක සහතිකයන් සඳහා දායක වීමට සූදානම්" බවයි. යුරෝපා සංගම් මිලිටරි ආධාර මෙහෙයුම (EU Military Assistance Mission-EUMAM Ukraine), යුරෝපා සංගම් උපදේශන මෙහෙයුම (EU Advisory Mission-EUAM Ukraine) සහ යුරෝපා සංගම් චන්ද්‍රිකා මධ්‍යස්ථානය මඟින් සටන් විරාම නිරීක්ෂණය කිරීම ඇතුළු ක්‍රම මඟින්, "දිගුකාලීනව ද ආක්‍රමණ වැළැක්වීමට සහ ඵලදායී ලෙස ආරක්ෂා වීමට" යුක්රේනයට ඇති හැකියාවට සහය දීම මෙයට ඇතුළත් වේ.

වෙනත් වචනවලින් කිවහොත්, අනාගත මිලිටරි-රාජ්‍ය තාන්ත්‍රික සමථයකදී, යුරෝපා සංගමය කියෙව් පාලනයේ හුදු ආධාරකරුවෙකු ලෙස පමණක් නොව, ස්වාධීන අධිරාජ්‍යවාදී බලවතෙකු ලෙස මේසයේ වාඩි වීමට සහ තමන්ගේම භූ-මූලෝපායික අවශ්‍යතා බලාත්මක කිරීමට ඇති අයිතිය පැහැදිලිවම කියා පාමින් සිටියි. වොෂින්ටනය සහ මොස්කව් තමන්ට උඩින් එකඟතාවයකට පැමිණීම වැළැක්වීමට යුරෝපීය බලවත්තු උත්සාහ කරති. **ඉරාන යුද්ධය සහ ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අර්බුදය මඟින් වේගවත් කරන ලද, යුක්රේන යුද්ධයේ සෘජු නායකත්වයෙන් එක්සත් ජනපදය සාපේක්ෂව පසුබැසීම, බර්ලිනය, පැරිසිය, ලන්ඩනය සහ බ්‍රසල්ස් විසින් වඩාත් ආක්‍රමණශීලී ලෙස ක්‍රියා කිරීම සඳහා යොදා ගනිමින් තිබේ.**

නේටෝ බලවතුන් සහ රුසියාව අතර සෘජු යුද්ධයක අනතුර දිනෙන් දින වර්ධනය වේ. මේ සතියේ ඉංග්‍රීසි ඕඩය (English Channel) තුළ බ්‍රිතාන්‍යය සහ රුසියාව අතර ඇති වූ ගැටුමෙන් මෙය විශේෂයෙන් පැහැදිලි විය. රුසියානු යුද නෞකාවක් බ්‍රිතාන්‍ය යාත්‍රාවක් අසලට අනතුරු ඇඟවීමේ වෙඩි ප්‍රහාර එල්ල කළේය. නිශ්චිත තත්ත්වයන් මතභේදාත්මක වුවද, **නේටෝ රාජ්‍යයන් සහ රුසියාව අතර මිලිටරි ප්‍රකෝපකරනයක් හෝ**

**ගැටුමක් පාලනය කළ නොහැකි උත්සන්න වීමකට කොතරම් ඉක්මනින් මඟ පෑදිය හැකිද යන්න මෙම සිදුවීමෙන් පැහැදිලි වේ.**

ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) එහි ඉදිරිදර්ශන ලිපියක් වූ, "ඉංග්‍රීසි ඕඩයේ වෙඩි තැබීම් – බ්‍රිතාන්‍යය, රුසියාව සහ තුන්වන ලෝක යුද්ධයේ අනතුර" මඟින් අනතුරු ඇඟවූයේ, මෙම සිදුවීම යුරෝපීය කම්කරු පන්තිය විසින් අනතුරු ඇඟවීමක් ලෙස වටහා ගත යුතු බවයි: **"ආණ්ඩු ඔවුන්ව රුසියාව සමඟ යුද්ධයකට වඩ වඩාත් සෘජුවම ඇද දමමින් සිටී. මෙම අනතුරු ඇඟවීම යුරෝපා සංගම් සමුළුව මඟින් හරියටම තහවුරු වේ. යුරෝපීය බලවත්තු වර්ධනය වන යුද අනතුරට ප්‍රතිචාර දක්වන්නේ සංයමයෙන් නොව, තව තවත් නැවත ප්‍රතිසන්නද්ධ ගැන්වීම් සහ උත්සන්න කිරීම් සමඟිනි."**

සමුළුව නැවත වරක් රුසියාව යුරෝපා සංගමයට "පැවැත්ම පිළිබඳ අභියෝගයක්" (existential challenge) ලෙස ප්‍රකාශ කළ අතර 2030 වන විට යුරෝපයේ "ආරක්ෂක සූදානම" තීරණාත්මක ලෙස ඉහළ නැංවීමට කැඳවුම් කළේය. නිල නිගමනවලදී, ඩ්‍රෝන සහ ඩ්‍රෝන මර්දන පද්ධති, පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති, ගුවන් ආරක්ෂක, අභ්‍යවකාශ හැකියාවන් සහ "ගැඹුරු නිරවද්‍ය ප්‍රහාරක හැකියාවන්" (deep precision strike capabilities) කේන්ද්‍රීය ප්‍රමුඛතා ලෙස නම් කර ඇත. මෙම තාක්ෂණික යෙදුම පිටුපස සැඟවී ඇත්තේ නිරවද්‍ය ආයුධ මඟින් දුරස්ථ ඉලක්ක විනාශ කිරීමේ හැකියාවයි — එනම් රුසියාවට එරෙහිව ප්‍රහාරාත්මක බලයක් සංවර්ධනය කිරීමයි.

එම අවස්ථාවේදීම "මිලිටරි සංචලතාව" (military mobility) වේගවත් කිරීමට නියමිතය. ඊට අදාළ ව්‍යවස්ථාදායක යෝජනා වසර අවසානයට පෙර සම්මත කර ගැනීමට නියමිතය. මෙයින් අදහස් කරන්නේ යුරෝපය පුරා ඇති මාර්ග, දුම්රිය මාර්ග, පාලම්, වරායන්, ගුවන් තොටුපළවල් සහ දේශසීමා තරණ මාර්ග, සෙබළුන් සහ බර උපකරණ වේගයෙන් ගෙනයාම සඳහා පෙළගැස්මයි. මෙය ජර්මනියේ "ජර්මනියේ මෙහෙයුම් සැලැස්ම" (Operation Plan Germany) සමඟ හරියටම ගැළපෙන අතර, එමගින් මුළු සමාජයම, ආර්ථිකය සහ යටිතල පහසුකම් නැඟෙනහිර පෙරමුණේ මහා යුද්ධයක් සඳහා සූදානම් කරනු ලබයි.

"ආරක්ෂාව" පිළිබඳ නිල වාක්‍ය ඛණ්ඩ හුදු විහිලුවකි. **යුරෝපීය බලවත්තු න්‍යෂ්ටික බලවතෙකු වන රුසියාවට එරෙහිව අධිරාජ්‍යවාදී යුද්ධයක් සූදානම් කරමින් සිටිති. ජර්මානු පාලක පන්තිය එමඟින් තම අපරාධකාරී ඉතිහාසය යළිත් කරලියට ගනිමින් සිටී.** සෝවියට් සංගමයට එරෙහි විනාශකාරී යුද්ධය ආරම්භ වී වසර අසූ පහකට පසු, ජර්මානු සටන් බලඇණියක් නැවත වරක් ලිතුවේනියාවේ ස්ථානගත වෙමින් පවතී; ජර්මානු ආයුධ සමාගම් රුසියාවට එරෙහි යුද්ධය සඳහා ආයුධ නිෂ්පාදනය කරමින් සිටී; **එමෙන්ම බර්ලිනය යුරෝපයේ නායකත්වය ඉල්ලා සිටියි.**

සමුළුවේ දෙවන ප්‍රධාන විදේශ ප්‍රතිපත්ති කේන්ද්‍රය වූ මැදපෙරදිග ද මිලිටරිවාදී ආක්‍රමණකාරීත්වයකින් සලකුණු වී ඇත. වොෂින්ටනය විසින් සාකච්ඡා කරන ලද එක්සත් ජනපද-ඉරාන ගිවිසුම, යුරෝපීය බලවතුන් දකින්නේ ආතතිය අඩු කිරීමේ පියවරක් ලෙස නොව, කලාපය තුළ තමන්ගේම භූමිකාව ශක්තිමත් කර ගැනීමේ අවස්ථාවක් ලෙසය. දැනටමත් G7 සමුළුවේදී, මර්ස්, මැක්‍රෝන්, ස්ටාමර් සහ මෙලෝනි සංඥා කර තිබුණේ ඔවුන් හෝමුස් සමුද්‍ර සන්ධියේ (Strait of Hormuz) යුරෝපීය නාවික බලයක් සූදානම් කරන බවයි. මර්ස් බුන්ඩෙස්ටැග් හිදී පැහැදිලිවම ප්‍රකාශ කළේ, නිසි කොන්දේසි සකස් වූ වහාම හෝමුස් සමුද්‍ර සන්ධියේ ආරක්ෂාව තහවුරු කිරීමට සහභාගී වීමට ජර්මනිය සූදානම් බවයි.

මෙය තවත් අධිරාජ්‍යවාදී යුද පෙරමුණක් උත්සන්න කිරීමේ තර්ජනයක් මතු කරයි. හෝමුස් සමුද්‍ර සන්ධිය යනු ලෝකයේ වැදගත්ම බලශක්ති සහ වෙළඳ මාර්ගවලින් එකකි. එහි යුද නැව් ස්ථානගත කරන කවුරුන් වුවද, වෙළඳ නැව්ගත කිරීම් "ආරක්ෂා කිරීමේ" අරමුණ ලුහු බඳිනවා නොවේ; ඒ වෙනුවට මැදපෙරදිග බලශක්තිය, වෙළඳ මාර්ග සහ භූ-මූලෝපායික බලපෑම කෙරෙහි පාලනය සුරක්ෂිත කර ගැනීම සඳහා මිලිටරි මැදිහත්වීම් සූදානම් කරති. **ඇමරිකානු ආධිපත්‍යයේ අර්බුදයට යුරෝපීය බලවත්තු ප්‍රතිචාර දක්වන්නේ, කලාපය තුළ තමන්ම අධිරාජ්‍යවාදී පිළිවෙලක් ඇති කරන බලවතුන් ලෙස පෙනී සිටීමට උත්සාහ කිරීමෙනි.**

චීනය කෙරෙහි වන ප්‍රතිපත්තියට ද මෙය අදාළ වේ. "තරඟකාරීත්වය", "ආර්ථික ආරක්ෂාව", "මූලෝපායික පරායත්තතාවයන් අඩු කිරීම" සහ "ගෝලීය සාර්ව ආර්ථික අසමතුලිතතාවයන්" වැනි ප්‍රචාරක වදන් යටතේ, **සමුළුව යුරෝපයේ වෙළඳ යුද ප්‍රතිපත්තිය දැඩි කිරීම පිළිබඳව සාකච්ඡා කළේය.** තීරුබදු, අපනයන පාලනයන්, යුරෝපීය සංගත සඳහා සහනාධාර සහ යුරෝපයේම සැපයුම් දාමයන් ගොඩනැඟීම හරහා චීනයේ කාර්මික ශක්තියට එරෙහිව සටන් කළ යුතු ක්‍රමවේදයක් ලෙස චීනය වඩ වඩාත් විවෘතව පද්ධතිමය ප්‍රතිවාදියෙකු (systemic rival) ලෙස සලකනු ලබයි.

**වෙළඳ යුද ප්‍රතිපත්තිය යුද ප්‍රතිපත්තිය සමඟ වෙන් කළ නොහැකි ලෙස බැඳී පවතී.** ගෝලීය අධිරාජ්‍යවාදී තරඟකාරිත්වයේ අවශ්‍යතාවලට අනුකූලව යුරෝපා සංගමයට එහි කර්මාන්ත, බලශක්ති ප්‍රතිපත්තිය, අමුද්‍රව්‍ය සැපයුම, පර්යේෂණ සහ යටිතල පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය වී ඇත. මෙම සන්දර්භය තුළ, "තරඟකාරිත්වය" යන්නෙන් අදහස් කරන්නේ වැටුප් කප්පාදු, සමාජ කප්පාදු, නියාමනයන් ඉවත් කිරීම සහ බැංකු, සංගත සහ ආයුධ සමාගම් සඳහා දැවැන්ත රාජ්‍ය සහනාධාර ලබා දීමයි.

2028 සිට 2034 දක්වා වන නව බහු වාර්ෂික යුරෝපා සංගම් මූල්‍ය රාමුව පිළිබඳ විවාදයේදී මෙය විශේෂයෙන් පැහැදිලි වේ. කොමිසම යුරෝ ට්‍රිලියන 2 ක පමණ අයවැයක් යෝජනා කර තිබුණි. ජර්මනිය, නෙදර්ලන්තය, ඔස්ට්‍රියාව, ස්වීඩනය සහ අනෙකුත්

ශුද්ධ දායකයින් (net contributors) වඩාත් ගැඹුරු කප්පාදු ඉල්ලා සිටිති. මර්ස් ප්‍රකාශ කළේ සංඛ්‍යාවන් "පහළට පැමිණිය යුතු" බවයි. ඒ හා සමගම, මෙහි අරමුණ ප්‍රතිසන්නද්ධවීම සීමා කිරීම නොවේ. ඊට පටහැනිව, කෘෂිකර්මාන්තය, සහයෝගීතාව සහ සිවිල් වැඩපිළිවෙලවල් සඳහා වන සාම්ප්‍රදායික වියදම් කප්පාදු කිරීමට හෝ වෙනතකට හැරවීමට නියමිත අතර, ආරක්ෂාව, ආයුධ කර්මාන්තය, දේශසීමා ආරක්ෂාව, කාර්මික ප්‍රතිපත්තිය සහ "මූලෝපායික" ආයෝජන ශක්තිමත් කරනු ලැබේ.

**යුද මාවතේ සමාජීය තර්කනය මෙයයි.** ආයුධ, උන්ඩ, ඩ්‍රෝන යානා, මිසයිල සහ යුද නැව් සඳහා බිලියන ගණන් වෙන් කරන අතරතුර, වැටුප් පහත හෙළීමටත්, විශ්‍රාම වැටුප් කප්පාදු කිරීමටත්, සෞඛ්‍ය හා අධ්‍යාපන වියදම් කපා හැරීමටත්, පොදු සේවාවන් විනාශ කිරීමටත් නියමිතය. මෙම ප්‍රතිපත්තිය වැඩි වර්ධනය වන ප්‍රතිරෝධයකට මුහුණ දෙන බව පාලක පන්තිය දනී. **විදේශයන්හි ප්‍රතිසන්නද්ධ ගැන්වීම රට තුළ ප්‍රතිසන්නද්ධ ගැන්වීම සමඟ අත්වැල් බැඳගෙන යන්නේ එබැවිනි.**

**සංක්‍රමණ ප්‍රතිපත්තිය දැඩි කිරීම සමුළුවේ තවත් ප්‍රධාන කරුණක් විය.** යුරෝපා සංගම් නායකයෝ, සංක්‍රමණ ප්‍රතිපත්තියේ "සියලු අංශ ඔස්සේ", විශේෂයෙන්ම එහි "බාහිර මානය" (external dimension) පිළිබඳව කටයුතු අඛණ්ඩව කරගෙන යන බව යළිත් සහතික කළහ. මෙයින් අදහස් කරන්නේ සරණාගතයින් යුරෝපයට පැමිණීමට පෙර ඔවුන්ව වැළැක්වීම, තුන්වන රටවල කඳවුරු පිහිටුවීම සහ පිටුවහල් කිරීම් වේගවත් කිරීම සඳහා ඒකාධිපති සහ ඒකාධිපති ස්වරූපී පාලන තන්ත්‍රයන් සමඟ ගිවිසුම් ඇති කර ගැනීමයි.

සමුළුවට ඉතා ආසන්නව, යුරෝපීය පාර්ලිමේන්තුව යුරෝපා සංගමයෙන් පිටත "ආපසු හැරවීමේ මධ්‍යස්ථාන" (return hubs) ලෙස හැඳින්වෙන දෑ සඳහා ඉඩ සලසන නව ආපසු හැරවීමේ රෙගුලාසියකට මඟ පෑදීය. ඉතාලිය, ඩෙන්මාර්කය, ජර්මනිය, ඔස්ට්‍රියාව, නෙදර්ලන්තය සහ අනෙකුත් ආණ්ඩු **යුරෝපය සීල් කර වසා දැමීමේ ඊටත් වඩා මිලේච්ඡ ප්‍රතිපත්තියක් සඳහා උත්සාහ කරමින් සිටිති.** අධිරාජ්‍යවාදී බලවතුන් විසින්ම අවුලුවන ලද හෝ කර ගෙන යන යුද්ධවලින් පලා යන සරණාගතයින්ගේ අයිතිවාසිකම් උදුරා ගැනීමටත්, ඔවුන්ව සිර කිරීමටත්, පිටුවහල් කිරීමටත් නියමිතය.

**සරණාගතයින්ට එරෙහි උද්ඝෝෂණය අරමුණු කිහිපයකට සේවය කරයි. එය අන්ත දක්ෂිනාංශය ශක්තිමත් කරයි, කම්කරු පන්තිය බෙදා වෙන් කරයි, සහ වැඩවර්ජන, විරෝධතා සහ යුද විරෝධී විපක්ෂයට එරෙහිව ද යොදා ගනු ලබන මර්දන කාරී රාජ්‍ය උපකරණයක් නිර්මාණය කරයි.** යුද්ධය සඳහා බිලියන ගණන් වියදම් කරන ආණ්ඩුම, රෝහල්, පාසල්, නිවාස සහ සමාජ ආධාර සඳහා "මුදල් නොමැති" බව ප්‍රකාශ කරති. **ඒ පිළිබඳ සමාජ කෝපය සරණාගතයින් වෙත හරවා යැවීමට නියමිතය.**

**යුරෝපා සංගම් සමුළුව පෙන්වා දෙන්නේ සමස්ත යුරෝපීය පාලක පන්තියම — කොන්සර්වේටිව්වරුන්, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්, ලිබරල්වාදීන්, හරිතයන් සහ නාමිකව වාම පක්ෂ — මෙම පිළිවෙත පිටුපස සිට ගන්නා බවයි. යුරෝපා සංගමය තුළ සාමකාමී හෝ ප්‍රගතිශීලී කල්ලියක් නොමැත. සියල්ලෝම යුරෝපීය අධිරාජ්‍යවාදය සහ ධනවාදය ආරක්ෂා කරති. ඔවුන්ගේ වෙනස්කම් පවතින්නේ, යුරෝපය ගෝලීය මිලිටරි බලවතෙකු ලෙස කොතරම් ඉක්මනින්, කුමන ක්‍රම මඟින් සහ කාගේ ජාතික නායකත්වය යටතේ සන්නද්ධ කළ යුතුද යන්න පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් පමණි.**

**ජර්මනිය මෙම ක්‍රියාවලිය විශේෂයෙන් ආක්‍රමණශීලී ලෙස ඉදිරියට ගෙන යයි.** මර්ස්-ක්ලින්බෙයිල් ආණ්ඩුව හිට්ලර්ගෙන් පසු විශාලතම නැවත ප්‍රතිසන්නද්ධ ගැන්වීමේ වැඩපිළිවෙල ක්‍රියාවට නංවමින්, යටිතල පහසුකම් යුද සැපයුම් පද්ධති බවට පරිවර්තනය කරමින්, අනිවාර්ය හමුදා සේවය නැවත හඳුන්වා දීමට සූදානම් වෙමින් සහ වියදම් ජර්මානු ප්‍රාග්ධනයේ මූලෝපායික අවශ්‍යතාවලට සෘජුවම සේවය නොකරන සෑම තැනකම යුරෝපා සංගම් අයවැය කප්පාදු කරන ලෙස ඉල්ලා සිටියි. ඒ සමගම, අභ්‍යන්තර කටයුතු අමාත්‍ය ඇලෙක්සැන්ඩර් ඩොබ්‍රින්ඩ් පොලිසිය, බුද්ධි ආයතන සහ සිවිල් ආරක්ෂක අංශ සන්නද්ධ කරමින් අධිපතිවාදී රාජ්‍ය උපකරණයක් ගොඩනැඟීම ඉදිරියට ගෙන යයි.

මෙම සමුළුව අනතුරු ඇඟවීමකි. **යුරෝපයේ පාලක පන්තිය ලෝක ධනවාදයේ අර්බුදයට ප්‍රතිචාර දක්වන්නේ සහන දීමෙන් නොව, යුද්ධය, සමාජ කප්පාදු සහ ඒකාධිපතිත්වය සමඟිනි.** රුසියාවට එරෙහිව උත්සන්න කිරීම න්‍යෂ්ටික අවිවලින් සන්නද්ධ බලවතුන් අතර සෘජු යුද්ධයක් බවට පත්වීමේ තර්ජනයක් මතු කරයි. මැදපෙරදිග මිලිටරි ප්‍රහාරය, චීනයට එරෙහි වෙළඳ යුද්ධය සහ සරණාගතයින්ට එල්ල කරන ප්‍රහාර එකම වර්ධනයක කොටස් වේ.

මීට එරෙහි විය හැක්කේ ජාත්‍යන්තර කම්කරු පන්තියට පමණි. **යුද්ධයට එරෙහි අරගලයට ධනේශ්වර ක්‍රමයේ සියලුම පක්ෂවලින්, යුරෝපා සංගමයෙන් සහ නේටෝ යුද සන්ධානයෙන් බිඳීමක් අවශ්‍ය වේ.** අවශ්‍ය වන්නේ කම්කරු පන්තියේ බලය බලමුලු ගන්වන, ආයුධ කර්මාන්තය අත්පත් කර ගන්නා, යුද ප්‍රතිපාදන නතර කරන සහ යුද්ධයට, ඒකාධිපතිත්වයට හා සමාජය අන්ත දුප්පත් කිරීමට හේතුව වන ධනවාදය වෙනුවට සමාජවාදී සමාජයක් ආදේශ කරන ජාත්‍යන්තර සමාජවාදී යුද විරෝධී ව්‍යාපාරයක් ගොඩනැඟීමයි.

(අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි

---

# බෙල්ෆාස්ට් නුවර සංක්‍රමණිකයන්ට එරෙහිව සිදුවන අන්ත දක්ෂිණාංශික ප්‍රචණ්ඩ ක්‍රියා තවදුරටත්

**පෝල් බොන්ඩ්** විසිනි.

මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026* ජුනි *11* දින *"***Far-right violence against migrants continues in Belfast***"* යන හිසින් පළවූ පෝල් බොන්ඩ් විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි*.*

උතුරු අයර්ලන්තයේ බෙල්ෆාස්ට් නුවරදී අන්ත දක්ෂිණාංශික ලෝයලිස්ට් (loyalists – එක්සත් රාජධානිය සමඟ එක්ව සිටීමට කැමති රෙපරමාදු ක්‍රිස්තියානින්. කෙසේ වුවද, ඔවුන්ගේ අන්ත දක්ෂිණාංශික ක්‍රියාකාරකම් මෙහෙයවනු ලබන්නේ ආගමික විශ්වාසය හෝ ඇදහීම මත නොව, දේශපාලන, වාර්ගික සහ ජාතිකවාදී පදනමක් මතය) කලහකාරී කණ්ඩායම් විසින් බදාදා රාත්‍රියේදීත් දෙවන වරටත් සංක්‍රමණිකයන් ඉලක්ක කර ගන්නා ලදී. **අඟහරුවාදා ඇති වූ ප්‍රචණ්ඩත්වයට වඩා මෙවර එය සුළු පරිමාණයෙන් සිදු වුවද, සමාජ මාධ්‍ය ඔස්සේ හුවමාරු වූ නිවාස ලැයිස්තුවක් මගින් තහවුරු වන්නේ මෙය සංවිධානාත්මක කෝලහලයක් (pogrom)වූ බවයි.**

උතුරු අයර්ලන්ත පොලිස් සේවය (PSNI) විසින් කලහකාරීන්ට එරෙහිව ජල ප්‍රහාරක එල්ල කරන ලද අතර රබර් උණ්ඩ 20 කින් ද වෙඩි තබා ඇත. ඉදිරියේදී ඇති විය හැකි තවත් කැරලි මර්දනය කිරීම සඳහා එක්සත් රාජධානිය පුරා සිටින පොලිස් නිලධාරීන් 200 දෙනෙකු උතුරු අයර්ලන්තයට අනුයුක්ත කරමින් සිටින බව වාර්තා වේ.

සුඩාන ජාතික සරණාගතයෙකු වන හාඩ් අලොඩිඩ් (Hadi Alodid) විසින් සඳුදා දිනයේදී ස්ටීවන් ඔගිල්වි (Stephen Ogilvie) නමැති පුද්ගලයාට සිදු කළ බිහිසුණු පිහි ඇනුම ව්‍යාජ ලෙස හේතුවක් කර ගනිමින්, අන්ත දක්ෂිණාංශික කලහකාරී කණ්ඩායම් විසින් සංක්‍රමණිකයන්ගේ සහ විදේශීය ජාතිකයන්ගේ නිවාස ඉලක්ක කර ගන්නා ලදී. අඟහරුවාදා මෙන්ම, වෙළඳසැල්, පාසල් සහ බෙදාහැරීමේ සේවාවන් වේලාසනින් වසා දැමුණි. පොදු ප්‍රවාහන සේවා මෙහෙයවනු ලබන ට්‍රාන්ස්ලින්ක් (Translink) ආයතනය විසින් සියලුම බස් සහ දුම්රිය සේවාවන් තාවකාලිකව අත්හිටුවන ලදී.

පළමු රාත්‍රියේ සිදු වූ ප්‍රචණ්ඩත්වයෙන් පසුව, "සංක්‍රමණිකයන්ගේ නිවාස" ඇතුළත් "ප්‍රහාරක ලැයිස්තුවක්" (Hit list) සමාජ මාධ්‍ය ඔස්සේ සංසරණය වූ අතර, බෙල්ෆාස්ට් නුවර සින් ෆේන් (Sinn Féin) පක්ෂයට අයත් නගරාධිපතිනි රෝයිස්-මාරි ඩොනලි (Róis-Máire Donnelly) වෙත ද තර්ජන එල්ල විය. බ්‍රහස්පතින්දා සවස ප්‍රකාශයට පත් කරන ලද විශේෂ වාර්තාවක ගාඩියන් (The Guardian) පුවත්පත සඳහන් කළේ, සංක්‍රමණ විරෝධී ක්‍රියාකාරකම් නිරීක්ෂණය කරනු ලබන උතුරු අයර්ලන්ත වගවීමේ ව්‍යාපෘතිය (APNI) විසින් මෙවැනි ලැයිස්තු පිළිබඳව මෙම වසරේ ආරම්භයේ සිටම උතුරු අයර්ලන්ත පොලිස් සේවය (PSNI) දැනුවත් කර ඇති බවයි.

එම පුවත්පත වාර්තා කළ පරිදි: " ලිපිනයන් ඇතුළත් ඊනියා ප්‍රහාරක ලැයිස්තුවක් (Hitlist) 2025 අගෝස්තු මාසයේ සිට අන්ත දක්ෂිණාංශික කණ්ඩායම් අතර සංසරණය වී ඇති අතර, එය 2026 ජනවාරි මාසයේදී උතුරු අයර්ලන්ත පොලිස් සේවය (PSNI) වෙත යවා ඇති බව වැටහේ". මෙම සතියේ සිදු වූ සංක්‍රමණ විරෝධී නොසන්සුන්තාවලදී ඉලක්ක කරගත් ස්ථාන අතර එම ලිපිනයන් ද විය." **ලෝක සමාජවාදී වෙබ් අඩවිය (WSWS) පෙන්වා දුන් පරිදි, මෙම ප්‍රචණ්ඩත්වය මුලින්ම හටගන්නා අවස්ථාවේදී පොලිසිය මූලික වශයෙන් පසෙකට වී බලා සිටි බව මෙයින් තහවුරු වේ.** ඔවුන්ගේ මුල්ම ක්‍රියාකාරීත්වය බොහෝ දුරට සීමා වූයේ, ප්‍රහාරකයා සෝමාලි ජාතිකයෙකු බවට ඔවුන් මුලින් අසත්‍ය ලෙස ප්‍රකාශ කර තිබූ පසුබිමක, ඔහුගේ සැබෑ ජාතිකත්වය කුමක්දැයි පැහැදිලි කිරීමට පමණි.

ඉදිරියේදී තවත් ප්‍රහාර එල්ල විය හැකි බවට අනතුරු අඟවමින් ගාඩියන් (The Guardian) පුවත්පත වාර්තා කළේ, "පොලිසිය වෙත යවන ලද APNI වාර්තාවල ෆේස්බුක් (Facebook) සටහනක් ද උපුටා දක්වා තිබූ' බවයි. එම සටහනේ සඳහන් වූයේ [බෙල්ෆාස්ට් නුවරට මායිම්ව පිහිටි] ග්ලෙන්ගෝම්ලි (Glengormley) ප්‍රදේශයේ ඇති HMOs [බොහෝ විට රැකවරණ පතන්නන් නවාතැන් ගෙන සිටින, පොදුවේ පරිහරණය කරනු ලබන බහු-කාමර නිවාස]'මින් පසු නියම ඉලක්ක ලෙස සලකා, ඒවාට එරෙහිව සුදුසු පරිදි ක්‍රියාමාර්ග ගන්නා' බවයි. එමෙන්ම එහි තවදුරටත් මෙසේ ද සඳහන් විය: 'මෙම තිරිසනුන්ට නවාතැන් දීමට, මුදල් සපයන හෝ උදව් කරන ඕනෑම අයෙකු අල්ලා ගතහොත්, ඔවුන් ද සමාන ලෙස වරදකරුවන් ලෙස හෙළා දකිනු ඇත.'"

බදාදා සවස, මුහුණු ආවරණය කරගත් 200ක පමණ තරුණයන් පිරිසක් රැකවරණ පතන්නන් නවාතැන් ගෙන සිටින නිව්ටවුන්ඇබේ (Newtownabbey) හි පිහිටි චිම්නි කෝනර් (Chimney Corner) හෝටලය දෙසට ගමන් කිරීමට උත්සාහ කළහ. ඇන්ට්‍රිම් (Antrim) පාරේදී ඔවුන්ට උතුරු අයර්ලන්ත පොලිස් සේවයේ (PSNI) රථ වාහන යොදා තිබූ මාර්ග බාධකයකට මුහුණ දීමට සිදු වූ අතර, ඔවුන් කුණු බඳුන්, ගඩොල්, බෝතල් සහ ගිනිකෙළි ද්‍රව්‍ය ප්‍රහාරක ආයුධ ලෙස භාවිත කරමින් නැවත නැවතත් පොලිසියට ප්‍රහාර එල්ල කළහ. එම කලහකාරී පිරිසේ සිටි අයෙකු මාධ්‍ය වෙත මෙසේ පැවසීය: “ඔවුන් අපට හෝටලය වෙත යාමට ඉඩ දුන්නේ නම් මෙවැනි කිසිවක් සිදු වන්නේ නැත. අද රාත්‍රියේ ඔවුන් ඕනෑවට වඩා දැඩි ලෙස ක්‍රියා කිරීම නිසා මෙම නොසන්සුන්තාව ඇති විය.”

නැවත වරක් අඳුරු පැහැති ඇඳුම් ඇඳ මුහුණු ආවරණය කරගෙන සිටි කලහකාරීහු, ප්‍රහාරක ද්‍රව්‍ය සපයා ගැනීම සඳහා සෙලෙජ්හැමර් (විශාල මිටි) භාවිත කරමින් පදික වේදිකාවේ ගල් පතුරු, ගඩොල් බැම් සහ වැටවල් කඩා දැමූහ. සෑන්ඩිකනෝස් (Sandyknowes) ප්‍රදේශයේදී යටිතල පහසුකම් දෙපාර්තමේන්තුවට අයත් වාහනයකට ගිනි තබා තිබූ අතර, මාර්ගය දිගේ සහ රෝද සහිත කුණු බඳුන්වලට ද තැනින් තැන ගිනි තබා තිබුණි.

රාත්‍රී 11ට පමණ, කලහකාරීහු පිරිසක් ඉන්ධන පිරවුම්හලක් පිටුපස තිබූ බංගලාවකට ගිනි තබා, ගිනි ගනිමින් තිබූ වෑන් රථයක් පොලිස් ආරක්ෂක වළල්ල දෙසට ධාවනය කරවූහ. පොලිසිය ඊට ප්‍රතිචාර වශයෙන් රබර් උණ්ඩවලින් වෙඩි තැබීය. එම බංගලාවේ වහලයට ඇස්බැස්ටෝස් සෙවිලි කර තිබෙන්නට ඇති බැවින්, නිවාස තුළටම වී සිටින ලෙස ගිනි නිවන භටයන් ජනතාවට උපදෙස් දෙන ලදී.

ඩෙරි (Derry) නගරයේදී, සවස් යාමයේ මුල් භාගයේදී රෝද සහිත කුණු බඳුන් සහ ලුණු ගබඩා කරන පෙට්ටියක් (Salt box) ගිනිබත් කරන ලද අතර, Loyalist Tullyally නිවාස සංකීර්ණය පිහිටි ප්‍රදේශයට පැමිණීමෙන් වළකින ලෙස උතුරු අයර්ලන්ත පොලිස් සේවය (PSNI) මහජනතාවට උපදෙස් දුන්නේය. පෝටඩවුන් (Portadown) ප්‍රදේශයේදී පැට්‍රල් බෝම්බ ප්‍රහාර ද එල්ල කර තිබුණි.

ස්කොට්ලන්තයේ ද මෙවැනිම නොසන්සුන්කාරී තත්ත්වයන් නැවතත් හටගත් අතර, එහිදී ග්‍රීනොක් (Greenock) ප්‍රදේශයේ රැකවරණ පතන්නන් නවාතැන් ගන්වා සිටින හොලිඩේ ඉන් (Holiday Inn) හෝටලය ඉදිරිපිට විරෝධතා පවත්වන ලදී.

බදාදා දිනයේදී එල්ල වූ පැට්‍රල් බෝම්බ සහ වෙනත් ද්‍රව්‍යවලින් පහරදීම් හේතුවෙන් පොලිස් නිලධාරීන් 12 දෙනෙකු තුවාල ලබා ඇති බවත්, කලහකාරීන් 16 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇති බවත් උතුරු අයර්ලන්ත පොලිස් සේවය (PSNI) ප්‍රකාශ කළේය. සඳුදා සිට මේ දක්වා අවම වශයෙන් සංක්‍රමණික පවුල් 27ක් වත් බිය ගැන්වීම්වලට ලක්ව ඇති බව හෝ ඔවුන්ගේ නිවාස ගිනිබත් කර ඇති බව රජයේ නිලධාරීහු පවසති.

එම ප්‍රහාරයෙන් ඔගිල්වි (Ogilvie) ගේ වම් ඇස අහිමි වූ අතර, බරපතළ කැපුම් තුවාල රැසකට ලක් වූ ඔහු තවදුරටත් රෝහල්ගතව ප්‍රතිකාර ලබයි.

සුදු ජාතික නොවන සංචාරකයින් සහ මගීන් පරීක්ෂා කිරීමේ මුරපොලවල් ලෙස භාවිත කිරීම සඳහා, ලෝයලිස්ට් (~රාජපාක්ෂික) කලහකාරී කණ්ඩායම් විසින් බෙල්ෆාස්ට් නුවර තාවකාලික මාර්ග බාධක පවත්වාගෙන යන අයුරු වීඩියෝ දර්ශනවල සටහන්ව තිබුණි.

යුනිසන් (Unison) වෘත්තීය සමිතියේ ප්‍රාදේශීය ලේකම්වරියක වන පැට්‍රීෂියා මැක්කවුන් (Patricia McKeown) වාර්තා කළේ, “වෙනස් සමේ පැහැයක් සහිත හෙදියක් පසුපස මුහුණු ආවරණය කරගත් පිරිමින් සිව්දෙනෙකු ලුහුබැඳ විත් ඇය අල්ස්ටර් (Ulster) රෝහල තුළට කොටු කර ඇති” බවයි.

සිය සේවා මුරයෙහි යෙදීමට දැඩි ලෙස අදිටන් කරගත් එම හෙදිය සඳහා දැනට විකල්ප නවාතැන් පහසුකම් සලසා දී ඇත. The Irish News පුවත්පත වාර්තා කරන පරිදි, අවම වශයෙන් එක් දේපළ කළමනාකරණ සමාගමක් වත් අන්ත දක්ෂිණාංශිකයන්ගේ ප්‍රහාරක ලැයිස්තුවේ සිටින කුලී නිවැසියන් සම්බන්ධ කර ගනිමින්, ඔවුන්ගේ නිවාසවල ආරක්ෂාව උපරිමයෙන් සලසා ගන්නා ලෙස උපදෙස් දී තිබේ.

**මෙම සතියේ සිදු වූ ජන සංහාරක ප්‍රහාර , බ්‍රිතාන්‍යය සහ අයර්ලන්තය පුරා අන්ත දක්ෂිණාංශික ප්‍රහාර උග්‍ර වීමේ නවතම තත්ත්වයයි. මේවා, සංක්‍රමණිකයන් සහ රැකවරණ පතන්නන් සමාජය හමුවේ නරක පිරිසක් ලෙස හුවාදැක්වීමට කාලයක සිට ක්‍රමානුකූලව සිදු කරන ලද ක්‍රියාවලියක ප්‍රතිඵලයකි. බලයට පත් වූ ඒ හෝ මේ කොන්සර්වේටිව් සහ ලේබර් රජයන්, තමන් දේශසීමා ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වඩාත් දැඩිව ක්‍රියා කරන බව පෙන්වීමට උත්සාහ කළ අතර, තමන් විසින්ම ඇති කරමින් සිටින සමාජ ව්‍යසනයන් කෙරෙහි පවතින කම්කරු පන්තියේ කෝපය වෙනත් අතකට හැරවීමට ද උත්සාහ කරන ලදී.**

**සුඩානයේ පවතින බිහිසුණු සමාජීය සහ ආර්ථික අර්බුදය සැලකිල්ලට ගනිමින්, පෙර පැවති කොන්සර්වේටිව් රජය විසින් ක්‍රියාත්මක කරන ලද සරල කරන ලද සරණාගත ක්‍රියාවලිය (SAP) යටතේ කිසිදු සම්මුඛ පරීක්ෂණයකින් තොරව 2023 වසරේදී අලොඩිඩ් වෙත දේශපාලන රැකවරණ ලබා දී තිබුණි.** ඇෆ්ගනිස්ථානය, එරිත්‍රියාව, ලිබියාව, සුඩානය, සිරියාව සහ යේමනය යන රටවල් සම්බන්ධයෙන් ද අනුගමනය කෙරුණේ මෙම ක්‍රියාපටිපාටිය. කෙසේ වුවද, ලේබර් (කම්කරු) පක්ෂයේ උතුරු අයර්ලන්තය පිළිබඳ රාජ්‍ය ලේකම් හිලරි බෙන් (Hilary Benn) මෙම සතියේ අවධාරණය කළේ, වර්තමානයේදී “සියලුම සිදුවීම්වලදී පාහේ” රැකවරණ පතන්නන් සම්මුඛ පරීක්ෂණවලට භාජනය කරන බවයි.

 ISSN 3093-6217

මහ මැන්චෙස්ටර් (Greater Manchester) හි නගරාධිපති මෙන්ම ඉදිරියේදී පැවැත්වීමට නියමිත මේකර්ෆීල්ඩ් (Makerfield) පාර්ලිමේන්තු අතුරු මැතිවරණයේ ලේබර් පක්ෂ අපේක්ෂකයා වන ඇන්ඩි බර්න්හැම් (Andy Burnham), සංක්‍රමණිකයන් "රඳවා තබා ගැනීම වැඩි වශයෙන් භාවිත කළ යුතු" බවට ඉල්ලා සිටියි. දැඩි දෝෂදර්ශනයට ලක්ව සිටින කීර් ස්ටාමර් (Keir Starmer) ගෙන් පසුව පක්ෂ නායකත්වය ගැනීමට ඉඩ ඇති අයෙකු ලෙස සැලකෙන්නේ ද මොහුය. ස්වදේශ කටයුතු අමාත්‍යාංශය (Home Office) විසින් දිළිඳු ප්‍රදේශවල රැකවරණ පතන්නන් නවාතැන් ගැන්වීමේ ගැටලුව සම්බන්ධයෙන් ඔහු මෙම සතියේ බීබීසී මැන්චෙස්ටර් ගුවන් විදුලිය (BBC Radio Manchester) වෙත මෙසේ පැවසීය: "[අන්ත දක්ෂිණාංශික රිෆෝම් යූකේ පක්ෂයේ නායක නයිජල්] ෆැරාජ් පවසන දේ සමඟ මම එකඟ වෙමි. අප කළ යුත්තේ නැවතත් විනයක් සහ පාලනයක් සහිත තත්ත්වයක් (Order) ඇති කිරීමයි."

SAP පද්ධතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී තමා (පක්ෂ) නායිකාව ලෙස හෝ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවය කර නොමැති බවත්, "මට දැන් කළ හැකි එකම දෙය ජනතාවගෙන් සමාව අයැදීම පමණයි" යනුවෙන් ද කොන්සර්වේටිව් පක්ෂ නායිකා කෙමී බේඩනොක් (Kemi Badenoch) LBC ගුවන් විදුලියට ප්‍රකාශ කළාය.

එකල කොන්සර්වේටිව් (ටෝරි) පක්ෂයේ ස්වදේශ කටයුතු ලේකම්වරිය සහ ආගමන විගමන අමාත්‍යවරුන් වූයේ සුයෙල්ලා බ්‍රැවර්මන් සහ රොබට් ජෙන්රික් බව බේඩනොක් පෙන්වා දුන්නාය. මොවුන් දෙදෙනාම පසුව රිෆෝම් යූකේ (Reform UK.මෙය නයිජල් ෆරාජ්ගේ පක්ෂයයි) පක්ෂයට එක් වී ඇත. මෙය, සමස්ත පාලක පන්තිය **සඳහාම දැඩි දක්ෂිණාංශික සංක්‍රමණ විරෝධී වැඩපිළිවෙළක් සකසමින් සිටින රිෆෝම් පක්ෂයට වඩා දකුණෙන් කොන්සර්වේටිව් පක්ෂය ස්ථානගත කිරීමට දැරූ උත්සාහයකි.** අඟහරුවාදා පැවති කැරලි කෝලාහල සම්බන්ධයෙන් අදහස් දක්වමින් රිෆෝම් පක්ෂයේ නායක නයිජල් ෆරාජ් ප්‍රකාශ කළේ, "බෙල්ෆාස්ට් හි තත්ත්වය ඉතා දරුණු ලෙස ආරම්භ වූ බවත්, එය තවදුරටත් ඉදිරියට යනු ඇති බවත්" ය. රිෆෝම් පක්ෂය සුඩාන ජාතිකයන් සඳහා වීසා නිකුත් කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කිරීමට ද ප්‍රතිඥා දී ඇත.

ෆරාජ් මෙසේ පැවසීය: "[බෙල්ෆාස්ට් හි] මෙම සිදුවීම්වලට ඉතා නරක චේතනාවන් සහිත පිරිස් සම්බන්ධ වූ බව මම ඉතා විවෘතව පිළිගනිමි. නමුත් බහුතරය එසේ නොවේ... බහුතර ජනතාවට අවශ්‍ය ක්‍රියාවයි". මෙම ප්‍රකාශය මඟින්, අඟහරුවාදා දින දියත් වූ ප්‍රහාරවලට පෙර විරෝධතාවල නිරත වන ලෙස ඉල්ලා සිටි ෆැසිස්ට්වාදී දේශපාලන උසිගන්වන්නෙකු වන ටොමී රොබින්සන්ට (Tommy Robinson) නීත්‍යානුකූලභාවයක් ලබා දුන්නේය. ළඟදීම ට්‍රිලියනපතියෙකු වීමට නියමිත ඉලොන් මස්ක් ද මෙම විරෝධතා කැඳවීම සඳහා ඔහු සමඟ එක් විය. **මස්ක් ට්විටර් (X) පණිවුඩයක් නිකුත් කරමින් කියා සිටියේ, "කිසියම් වෙනසක් සිදුවනු ඇත්තේ නැවත නැවතත් සහ ප්‍රබල ලෙස විරෝධතාවල නිරත වීමෙන් පමණි!!" යනුවෙනි.**

අඟහරුවාදා සිදු වූ ප්‍රචණ්ඩකාරී මිනිස් සංහාරයෙන් පසුව, **මස්ක් සිය ස්ථාවරය තවදුරටත් තහවුරු කරමින් සටහන් කළේ: "මිනිසුන් කෝපයට පත් කරන්නේ "සමාජ මාධ්‍ය" නොව, මිනීමරු සංක්‍රමණිකයන් විසින් ඔවුන්ගේම උපන් ගම්වලදී අහිංසක මිනිසුන්ගේ හිස් ගසා දැමීමයි!" යනුවෙනි.**

උතුරු අයර්ලන්තයේ **යුනියන්වාදී** (සංගමවාදී- Unionist) නායකයන් මෙම ප්‍රහාරය උපයෝගී කරගනිමින් අයර්ලන්තය සමඟ දැඩි දේශසීමා පාලනයක් පනවන ලෙස ඉල්ලා ඇත. ඩෙමොක්‍රටික් යුනියන්වාදී පක්ෂයේ (Democratic Unionist Party-DUP) හිටපු නියෝජ්‍ය නායක ගැවින් රොබින්සන් පාර්ලිමේන්තුවේදී ස්ටාමර් වෙත මෙසේ පැවසීය: "**මිනිසුන්ට දැන් හිස් සුබ පැතුම් සහ පොරොන්දු අසා ඇති වී තිබේ. ඔවුන්ට අවශ්‍ය වන්නේ ප්‍රායෝගික ක්‍රියාමාර්ග දැකීමටයි. රජය අපගේ දේශසීමා ආරක්ෂා කිරීමට සූදානම් බව දැන් පෙන්නුම් කළ යුතුය.**"

ලෝයලිස්ට් (loyalist) සහ දැඩි දක්ෂිණාංශික මැරයන් විසින් සංවිධානාත්මකව මෙහෙයවන ලද "ජාතිවාදී බිය ගැන්වීම් සහ ප්‍රචණ්ඩත්වය" අයර්ලන්තයේ සින් ෆේන් (Sinn Féin) පක්ෂයේ නායිකා මේරි ලූ මැක්ඩොනල්ඩ් විසින් හෙළා දකින ලදී. ඉන්පසුව ඇය උතුරු අයර්ලන්ත පොලිස් සේවයේ (PSNI) "කඩිනම්" ක්‍රියාමාර්ග අගය කළද, සැබවින්ම ඔවුන්ගේ ක්‍රියාකලාපය ඊට හාත්පසින්ම වෙනස් එකක් විය."

දක්ෂිණාංශික ටෙලිග්‍රාෆ් (Telegraph) පුවත්පත මෙම අවස්ථාව උපයෝගී කරගනිමින් සින් ෆේන් පක්ෂයට බලපෑම් කිරීමට උත්සාහ කළේය. ඒලිස් ඕ'හන්ලන් (Eilis O'Hanlon) විසින් ලියන ලද විචාරාත්මක ලිපියක "**ජාතිකවාදීන්** (Nationalists) මෙම කැරලි කෝලාහලවලට සම්බන්ධ නොවූ" බව පිළිගෙන තිබුණද, "ඔවුන් තුළ ද මෙවැනිම පොදු උත්සුකයන් සහ ගැටලු රාශියක් නොමැති බව

ISSN 3093-6217

ඇඟවීම මූලාවක් “ බව එහි සඳහන් කර තිබුණි.

[කර්තෘ සටහන: උතුරු අයර්ලන්තයේ (Northern Ireland) ජාතිකවාදීන් (Nationalists) අපේක්ෂා කරන්නේ උතුරු අයර්ලන්තය එක්සත් රාජධානියෙන් (United Kingdom) ඉවත් වී ඒකාබද්ධ හා ස්වාධීන අයර්ලන්තයක් ගොඩනැගීමටය. අනෙක් අතට, සංගමවාදීන් (Unionists) අපේක්ෂා කරන්නේ උතුරු අයර්ලන්තය දිගින් දිගටම එක්සත් රාජධානියේ කොටසක් ලෙස පැවතීමටය. මෙම දේශපාලන බෙදීම උතුරු අයර්ලන්ත දේශපාලනයේ මූලික හරය වේ. මෙහිදී විශේෂයෙන් සඳහන් කළ යුතු කරුණක් නම්, වාර්තාවන පරිදි, උතුරු අයර්ලන්තයේ වැඩිවන පිරිසක් මෙම ලේබල් දෙකම ප්‍රතික්ෂේප කරමින්, තමන් හුදෙක් “උතුරු අයර්ලන්ත ජාතිකයින්” (Northern Irish) ලෙස හඳුනා ගැනීමට හෝ Alliance Party වැනි මේ කිසිදු පාර්ශ්වයකට පක්ෂපාතී නොවන දේශපාලන පක්ෂ සමඟ පෙළගැසීමට තෝරා ගැනීමයි.

අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි.]

---

**SLLA POLITICAL GRAPHICS**




# රාවුල් කැස්ත්‍රෝට එරෙහි එක්සත් ජනපද අධිචෝදනාව සහ කියුබාවට එරෙහි CIA භීෂණයේ වාර්තාව

**ඇන්ඩ්‍රියා ලෝබෝ** විසිනි.


මෙහි පළවන්නේ ලෝක සමාජවාදී වෙබ් අඩවියේ *(WSWS) 2026 මැයි 20* දින *“**The US indictment of Raúl Castro and the record of CIA terror against Cuba**”* යන හිසින් පළවූ ඇන්ඩ්‍රියා ලෝබෝ විසින් ලියන ලද ඉදිරිදර්ශන ලිපියේ සිංහල පරිවර්තනය යි.

එක්සත් ජනපදය කියුබාවේ සිය හමුදාමය වාඩිලාගැනීම අවසන් කර, 1902 දී කියුබානු ජනරජය නිල වශයෙන් ප්‍රකාශයට පත් කර වසර 124ක් සනිටුහන් වූ මැයි 20 වනදා, ට්‍රම්ප් පරිපාලනය එම දූපතට එරෙහිව මෙතෙක් එල්ල කළ වඩාත්ම විවෘත තර්ජනය සිදු කළේය.

**1996 දී මියාමි නුවර පදනම් කරගත් ‘බ්‍රදර්ස් ටු ද රෙස්කියු’ (Brothers to the Rescue) නම් පිටුවහල් වූවන්ගේ සංවිධානය විසින් ක්‍රියාත්මක කරන ලද ගුවන් යානා දෙකක් බිම හෙළීමේ සිද්ධියට සම්බන්ධව, 94 හැවිරිදි රාවුල් කැස්ත්‍රෝට එරෙහිව මිනීමැරුම් සහ කුමන්ත්‍රණ චෝදනා ඇතුළත් අධිචෝදනා පත්‍රයක් එක්සත් ජනපද අධිකරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධියට පත් කර තිබේ.**

දශකයකට ආසන්න කාලයක් රාජ්‍ය නිලතලවලින් විශ්‍රාම ගෙන සිටින කැස්ත්‍රෝ, මීට පෙර කියුබාවේ ජනාධිපතිවරයා සහ එහි පාලක පක්ෂයේ නායකයා ලෙස කටයුතු කළේය. ඔහු 1959 දී බලයට පත් වූ, ඔහුගේ සහෝදර ෆිදෙල් විසින් මෙහෙයවන ලද ගරිල්ලා හමුදාවේ ප්‍රධාන අණදෙන නිලධාරියෙකු (comandante) ද විය.

අධිචෝදනා පත්‍රය ප්‍රකාශයට පත් කිරීමට පැය කිහිපයකට පෙර, රාජ්‍ය ලේකම් මාර්කෝ රූබියෝ කියුබානු ජනතාව වෙත සෘජුවම ආමන්ත්‍රණය කරමින් ස්පාඤ්ඤ භාෂාවෙන් වීඩියෝවක් පළ කළේය. එමගින් පාලන තන්ත්‍රය වෙනස් කරන ලෙස ඉල්ලා සිටි



1961 දී කියුබාවේ “බේ ඔෆ් පිග්ස්”(Bay of Pigs) හිදී සිරභාරයට ගන්නා ලද 2506 බ්‍රිගේඩයේ සාමාජිකයින්.

ඔහු, වොෂින්ටනය විසින් සමස්ත ලතින් ඇමරිකාව පුරා ක්‍රියාවට නංවමින් සිටින නැවත යටත් විජිතකරණ ප්‍රතිපත්තිය වෙනුවෙන් පෙනී සිටියේය.

බදාදා මියාමි හිදී මෙම අධිචෝදනා පත්‍රය ප්‍රසිද්ධියට පත් කිරීම, නීතිමය ක්‍රියාවලියකට වඩා මැතිවරණ ප්‍රචාරක රැලියක ස්වරූපයක් ගත්තේය. එහිදී වොෂින්ටනයේ ප්‍රතිවිප්ලවවාදී නියෝජිතයන් රැස්ව සිටියේ ඩොනල්ඩ් ට්‍රම්ප් වෙනුවෙන් ජයඝෝෂා කිරීමට සහ කියුබාවට එරෙහිව සෘජු එක්සත් ජනපද හමුදාමය මැදිහත්වීමක් සිදු වීමේ ඇති ඉඩකඩට අත්පොළසන් දීමටය.

**මෙම දක්ෂිණාංශික සැමරුම මධ්‍යයේ, එක් ප්‍රශ්නයක් කැපී පෙනෙන ලෙස නොසලකා හැර තිබුණි: එනම් කියුබාවට එරෙහිව වසර 66ක් තිස්සේ සිදු වූ, පාලනයකින් තොර එක්සත් ජනපද ප්‍රචණ්ඩත්වය, ඝාතන සහ භීෂණය සම්බන්ධයෙන් වගකීම දැරිය යුත්තේ කවුරුන්ද යන්නයි.**

රාවුල් කැස්ත්‍රෝට එරෙහි අධිචෝදනා පත්‍රය යනු මිලියන 10කට වඩා අඩු ජනගහනයක් සහිත දිළිඳු රටකට එරෙහිව සැලසුම් සහගත හමුදාමය ආක්‍රමණයක් සාධාරණීකරණය කිරීම සඳහා වූ පිළිකුල් සහගත දේශපාලන ප්‍රචාරක ක්‍රියාවකි.

අධිචෝදනා පත්‍රයේ සඳහන් වන දශක තුනක් පැරණි මෙම සිදුවීම නම්, 1996 පෙබරවාරි 24 වන දින ෆ්ලොරිඩා සමුද්‍ර සන්ධියට (Straits of Florida) ඉහළින් "බ්‍රදර්ස් ටු ද රෙස්කියු" (Brothers to the Rescue) ගුවන් යානා දෙකක් වෙඩි තබා බිම හෙළීමයි. බිල් ක්ලින්ටන්ගේ පරිපාලනයේ සිට බලයට පත් වූ සෑම එක්සත් ජනපද රජයක් විසින්ම මෙම සිදුවීම ක්‍රමානුකූලව වැරදි ලෙස අර්ථ දක්වා ඇත. ක්ලින්ටන් පරිපාලනය, රිපබ්ලිකන් පක්ෂය සහ ප්‍රධාන පෙළේ මාධ්‍ය ආයතන යන සියල්ලම, සිවිල් ගුවන් යානාවලට එරෙහිව හමුදා බලය භාවිතා කිරීම තහනම් කරන ජාත්‍යන්තර නීති රීති උපුටා දක්වමින්, මෙය "අමානුෂික මිනීමැරුමක්" ලෙස හෙළා දුටහ. ප්‍රහාරයෙන් බේරී පලාගිය ගුවන් යානයේ නියමුවා වූ හොසේ බසුල්තෝ (José Basulto) සහ අනෙක් පුද්ගලයන්, එක්සත් ජනපද බුද්ධි අංශයෙන් වැටුප් ලබන නියෝජිතයන් නොවන බව සී.අයි.ඒ. (CIA) සංවිධානය තරයේ කියා සිටියේය.

**මෙයින් කිසිවක් සත්‍ය නොවීය. එක්සත් ජනපදයේ කියුබානු තානාපති කාර්යාලය මෙම අධිචෝදනා පත්‍රයට ප්‍රතිචාර දක්වමින් මතක් කර දුන්නේ, 1994 සහ 1996 අතර කාලය තුළ 'බ්‍රදර්ස් ටු ද රෙස්කියු' (Brothers to the Rescue) සංවිධානය විසින් සිදු කරන ලද 25කට අධික දේශසීමා උල්ලංඝනය කිරීම් ප්‍රමාණයක් කියුබාව විසින් නිල වශයෙන් හෙළා දැක තිබූ බවයි. එම විරෝධතාවන් වොෂින්ටනය විසින් ක්‍රමානුකූලව නොසලකා හරින ලදී.**

**මානුෂීය සංවිධානයක් වීම කෙසේ වෙතත්, "බ්‍රදර්ස් ටු ද රෙස්කියු" (Brothers to the Rescue) සංවිධානය සිය ගුවන් යානා භාවිතා කරමින් කියුබානු භූමියට ඉහළින් නැවත නැවතත් සතුරු ගුවන් ගමන් සිදු කළේය.** ඇතැම් අවස්ථාවලදී ඔවුහු හවානා නගරයට ඉහළින් පහත් මට්ටමෙන් පියාසර කරමින්, රජයට එරෙහිව නැගී සිටින ලෙස කියුබානු ජනතාවගෙන් ඉල්ලා සිටින පත්‍රිකා බිම හෙළූහ. සී.අයි.ඒ. (CIA) සංවිධානය විසින් මෙහෙයවන ලද "බේ ඔෆ් පිග්ස්" (Bay of Pigs) ආක්‍රමණයේ ප්‍රවීණයෙකු වූ බසුල්තෝ, පැනමාවේ පිහිටි එක්සත් ජනපද යුද හමුදාවේ "ස්කූල් ඔෆ් ද ඇමරිකාස්" (School of the Americas) ආයතනයෙන් තමන් භීෂණ උපක්‍රම පිළිබඳ පුහුණුව ලැබූ බවට පුරසාරම් දොඩා තිබුණි. ඔහු බෝට්ටුවක සිට හවානා නුවර හෝටලයකට ප්‍රහාර එල්ල කිරීමට සහභාගී වූ අතර, පසුව සී.අයි.ඒ. (CIA) මඟින් මෙහෙයවන ලද, නිකරගුවාවේ කොන්ට්‍රා (Contra) ත්‍රස්තවාදී ව්‍යාපාරයට සහයෝගය ලබා දුන්නේය.

ඔහුගේ කණ්ඩායමේ ක්‍රියාකාරකම්, කියුබාවට එරෙහිව එක්සත් ජනපද හමුදා ප්‍රහාරයක් එල්ල කරවීම අරමුණු කරගත්, සැලසුම්සහගත ප්‍රකෝප කිරීමක් විය. **මෙම වෙඩි තබා බිම හෙළීම, එක්සත් ජනපදයේ පිටුබලය ලත්, අඛණ්ඩ ආක්‍රමණශීලී ව්‍යාපාරයකට එරෙහිව සිදු කළ ආත්මාරක්ෂක ක්‍රියාවක් විය.**

**ක්ලින්ටන් පරිපාලනය හමුදාමය වශයෙන් ප්‍රතිප්‍රහාර එල්ල නොකළ නමුත්, හෙල්ම්ස්-බර්ටන් (Helms-Burton) පනත් කෙටුම්පතට එරෙහිව තමන් දැක්වූ විරෝධය වෙනස් කිරීමට කටයුතු කළේය. එම පනත මඟින් කියුබාව සමඟ ව්‍යාපාර කටයුතුවල නිරත වන විදේශීය සමාගම්වලට එරෙහිව දැඩි නව සම්බාධක පැනවූ අතර, එක්සත් ජනපද වෙළඳ තහනම (embargo) ඉවත් කිරීම ද වළක්වන ලදී.**

**යුද්ධය සඳහා ව්‍යාජ හේතුවක් ලෙස අධිචෝදනා පත්‍රය**

**දැන්, වසර 30කට පසුව, ට්‍රම්ප් පරිපාලනය අසීමිත වූ නරුමත්වයකින් යුතුව කැස්ත්‍රෝට අධිචෝදනා නැගීම සඳහා මෙම මවාගත් සිදුවීම වෙත නැවත හැරී බලයි. මෙම අධිචෝදනා පත්‍රය, ජනවාරි 3 වනදා කරකස් නුවරට එල්ල වූ එක්සත් ජනපද හමුදා ප්‍රහාරයකදී පැහැරගනු ලැබීමට පෙර, වංචනික මත්ද්‍රව්‍ය-ත්‍රස්තවාදී චෝදනා මත අධිචෝදනා ලැබූ වෙනිසියුලානු ජනාධිපති නිකොලස් මදුරෝට එරෙහිව භාවිතා කරන ලද ආකෘතියම හරියටම අනුගමනය කරයි.**

මෙම අධිචෝදනා පත්‍රය සකස් කරන ලද්දේ කියුබානු නිලධාරීන්ට එරෙහිව පුළුල් ලෙස නඩු පැවරීම සඳහා, ෆ්ලොරිඩාවේ දකුණු දිස්ත්‍රික්කයේ එක්සත් ජනපද නීතිඥ ජේසන් රෙඩින් කිනියෝනස් (Jason Reding Quiñones) විසින් මාර්තු මාසයේදී පිහිටුවන ලද ක්‍රියාකාරී කණ්ඩායමක් විසිනි. කියුබානු සරණාගතයින්ගේ පුත්‍රයෙකු වන රෙඩින්, එක්සත් ජනපද යුද හමුදාවේ සහ ගුවන් හමුදාවේ දිගුකාලීන සේවාවකින් පසුව, ට්‍රම්ප්ගේ දෙවන ධුර කාලය තුළ, නම් කරන ලද

පළමු රජයේ නීතිඥවරයා (prosecutor) විය.

පසුගිය මාසයේදී ඔහු සංචිත (reserve- අඩ කාල හමුදා) කර්නල් ධුරයට උසස් කරනු ලැබුවා පමණක් නොව, ඉරානයට එරෙහි යුද්ධය ද ඇතුළුව මැදපෙරදිග පුරා එක්සත් ජනපදය සහ ඊශ්‍රායලය විසින් සිදු කරනු ලබන යුද අපරාධ සම්බන්ධයෙන්, එක්සත් ජනපද මධ්‍යම විධානය (US Central Command) සඳහා “ජ්‍යෙෂ්ඨ සංචිත නීති උපදේශක” ලෙසද ඔහු දැනට කටයුතු කරයි.

**මෙම අධිචෝදනා පත්‍රය, මාස ගණනාවක් තිස්සේ සිදුවෙමින් පවතින, ට්‍රම්ප් පරිපාලනය විසින් යුද්ධයක් සඳහා පුළුල් ලෙස පදනමක් මවාපෑමේ ක්‍රියාවලිය සමඟ සමගාමීව බැලිය යුතුය. රහසිගත බුද්ධි තොරතුරු උපුටා දක්වමින් නම සඳහන් නොකළ ධවල මන්දිර නිලධාරීන් කළ ප්‍රකාශ මත පදනම්ව මෑතකදී පළ වූ “ඇක්සියෝස්” (Axios) වාර්තාවක් කියා සිටියේ, කියුබාව රුසියාවෙන් සහ ඉරානයෙන් ඩ්‍රෝන යානා 300 කට වඩා ලබාගෙන ඇති බවයි. එමෙන්ම, ගුවන්තනාමෝ බේ (Guantánamo Bay) හි පිහිටි එක්සත් ජනපද හමුදා කඳවුරට, එක්සත් ජනපද නාවික නැව්වලට සහ ෆ්ලොරිඩාවේ කී වෙස්ට් (Key West) ප්‍රදේශයට ප්‍රහාර එල්ල කිරීම සඳහා ඔවුන් “සැලසුම් සාකච්ඡා කරමින්” සිටි බවද එහි සඳහන් විය.**

**කියුබානු තානාපති කාර්යාලය එම වාර්තාවේම ඇති අභ්‍යන්තර විකාරරූපී බව මෙසේ හෙළිදරව් කළේය: “ඇක්සියෝස් (Axios) ආයතනය ‘ඩ්‍රෝන තර්ජනයක්’ මවාපාන නමුත්, ඡේද කිහිපයකට පසුව ‘එක්සත් ජනපද නිලධාරීන් කියුබාව සක්‍රියව ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කරන බව විශ්වාස නොකරයි’ යනුවෙන් පාපොච්චාරණය කරයි.” ජනවාරි මාසයේදී පනවන ලද ඇමෙරිකානු බලශක්ති සම්බාධක හේතුවෙන් කියුබාවේ විදුලිබල පද්ධතිය බිඳවැටීමකට ලක්ව ඇති බවත්, කියුබාවට තෙල් විකුණන ඕනෑම රටකට එරෙහිව දණ්ඩනීය තීරුබදු පනවන බවට තර්ජනය කර ඇති බවත් පෙන්වා දෙමින් කියුබානු රජය වැඩිදුරටත් කියා සිටියේ “ප්‍රහාරයට ලක්ව ඇති රට කියුබාව” බවයි.**

## කියුබාවට එරෙහි එක්සත් ජනපද භීෂණයේ සහ ආක්‍රමණයේ වාර්තාව

**නූතන ඉතිහාසයේ වඩාත්ම අඛණ්ඩ සහ රුදුරු ත්‍රස්තවාදී ව්‍යාපාරයන්ගෙන් එකක් වන, කියුබාවට එරෙහි එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට අධිචෝදනා නැඟීම සඳහා මැයි 20 වනදා සුදුසුම දිනයක් වනු ඇත.**

මෙම දිනයෙන් සනිටුහන් වන්නේ, ස්පාඤ්ඤ-ඇමරිකානු යුද්ධය අවසන් වීමෙන් පසුව එක්සත් ජනපදය විසින් ස්පාඤ්ඤයේ යටත් විජිතයන් වූ කියුබාව, පුවර්ටෝ රිකෝ, ගුවාම් සහ පිලිපීනය තම පාලනයට නතු කර ගැනීමෙන් පසු, 1902 දී කියුබානු ජනරජය ප්‍රකාශයට පත් කිරීමයි.

ඉන්පසුව, 1917 සහ 1923 අතර කාලය තුළ එක්සත් ජනපද මැරීන් භටයින් මෙම දූපත වාඩිලාගෙන සිටි අතර, ඔවුහු වැඩ වර්ජන මර්දනය කරමින් එක්සත් ජනපද සමාගම්වල ව්‍යාපාරික අවශ්‍යතා ආරක්ෂා කිරීමට කටයුතු කළහ.

**එක්සත් ජනපද හමුදා වාඩිලාගැනීම නිල වශයෙන් අවසන් වීමත් සමඟ ප්ලැට් සංශෝධනය (Platt Amendment) පැනවීමට කටයුතු කෙරුණු අතර, එමඟින් තමන්ට සුදුසු යැයි හැඟෙන ඕනෑම අවස්ථාවක කියුබානු කටයුතුවලට හමුදාමය වශයෙන් මැදිහත් වීම සඳහා වොෂින්ටනයට අසීමිත “අයිතියක්” හිමි විය. ෆිදෙල් කැස්ත්‍රෝ රජය විසින් මැයි 20 වනදා නිල දින දර්ශනයෙන් ඉවත් කරනු ලැබුවේ, 1902 දී ලැබූ “නිදහස” යනු ජනරජ වෙස් ගත් යටත් විජිතවාදී වැඩපිළිවෙළක් පමණක් බව පිළිගනිමිනි.**

**පාලන තන්ත්‍රය වෙනස් කිරීම සඳහා දැනට තීව්‍ර වෙමින් පවතින උත්සාහය මෙන්ම, කියුබාවට එරෙහිව වසර 66ක් තිස්සේ අඛණ්ඩව ක්‍රියාත්මක වූ එක්සත් ජනපද භීෂණයේ අරමුණ වූයේ, 1959ට පෙර ප්ලැට් සංශෝධනය (Platt Amendment) සහ ෆුල්ජෙන්සියෝ බැටිස්ටාගේ (Fulgencio Batista) ආඥාදායකත්වය යටතේ පැවති ආකාරයේ සබඳතාවක් නැවත ඇති කිරීමට ඇති සෑම බාධකයක්ම ඉවත් කිරීමයි. එහි අරමුණ වන්නේ, එක්සත් ජනපද බැංකුවලට සහ සමාගම්වලට කියුබාවේ ඉඩම්, පොදු උපයෝගිතා සේවා, දුම්රිය මාර්ග සහ සීනි කර්මාන්තය පාලනය කිරීමට ඉඩ සලසන අතරම, එක්සත් ජනපද දේශපාලනඥයන් සහ ව්‍යාපාරිකයන් නිතර ගැවසුණු ගණිකා නිවාස සහ කැසිනෝ ශාලා පවත්වාගෙන යාමට මාෆියාවට (Mafia) පූර්ණ නිදහස ලබා දුන් යටත් විජිත පන්නයේ සබඳතා නැවත ඇති කිරීමයි. එම තත්ත්වය පවත්වාගෙන යාම සඳහා බැටිස්ටා විසින් පුද්ගලයන් 20,000ක් ඝාතනය කරන ලදී.**

**1959 දී ෆිදෙල් කැස්ත්‍රෝ විසින් එක්සත් ජනපදයේ පිටුබලය ලත් ෆුල්ජෙන්සියෝ බැටිස්ටාගේ ආඥාදායකත්වය පෙරළා දැමූ විට, වොෂින්ටනයේ ප්‍රතිචාරය ක්ෂණික විය. රහස්‍යභාවයෙන් මුදාහළ සී.අයි.ඒ. (CIA) ලේඛන මඟින් තහවුරු කරන්නේ, කැස්ත්‍රෝ සෝවියට් සංගමය සමඟ සන්ධානගත වීමටත් පෙර සිටම කියුබාවට එරෙහි එක්සත් ජනපදයේ රහසිගත මෙහෙයුම් ආරම්භ වී තිබූ බවයි. එනම්, මෙම ප්‍රහාරවලට සීතල යුද මතවාදයට වඩා වැඩි සම්බන්ධයක් තිබුණේ එම දූපත තුළ සිදුවූ එක්සත් ජනපද සමාගම්වල කොල්ලකෑම ආරක්ෂා කිරීම සමඟය.**

වොෂින්ටනය ආයුධ විකිණීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසු, කියුබාවට යුරෝපයෙන් මිලදී ගැනීමට බලකෙරුණු ආයුධ ප්‍රවාහනය කරමින් තිබූ ‘ලා කුබ්රේ’ (La Coubre) නම් ප්‍රංශ නැවට 1960 මාර්තු මාසයේදී බෝම්බ ප්‍රහාරයෙන් ආරම්භ වූ, ඉන් අනතුරුව සිදුවූ එක්සත් ජනපද ත්‍රස්තවාදයේ වාර්තාව නූතන ඉතිහාසයේ වඩාත්ම පුළුල් ලෙස ලේඛනගත කර ඇති වාර්තාවන්ගෙන් එකකි. පළමු පිපිරීමට ප්‍රතිචාර දක්වමින්

පැමිණෙන සහන සේවකයන් දෙවන පිපිරීමට හසු කර ගැනීම සඳහා, බෝම්බ එකින් එක පිපිරී යන පරිදි හිතාමතාම වේලාව සකස් කර තිබුණි. මෙයින් පුද්ගලයන් 100කට අධික සංඛ්‍යාවක් මියගිය අතර තවත් සිය ගණනක් තුවාල ලැබූහ.

විශාලතම මැදිහත්වීම වූයේ 1961 අප්‍රේල් මස සිදුවූ 'බේ ඔෆ් පිග්ස්' (Bay of Pigs) ආක්‍රමණය වන අතර, එය සී.අයි.ඒ. (CIA) සංවිධානය විසින් මෙහෙයවන ලද සහ මූල්‍ය ප්‍රතිපාදන සපයන ලද, දළ වශයෙන් 1,400ක් පමණ වූ පිටුවහල් කරන ලද කියුබානු කුලී හේවායන්ගෙන් සමන්විත බලකායක් විසින් සිදු කරන ලදී. එම කලාපය තුළ එක්සත් ජනපදය ලැබූ විශාලතම හමුදාමය පසුබෑම සනිටුහන් කරමින් කියුබාව එය පරාජය කිරීමට සමත් වූ නමුත්, ඒ වන විටත් පුද්ගලයන් 176 දෙනෙකු මියගොස් 300කට අධික සංඛ්‍යාවක් තුවාල ලබා තිබුණි. ඉන් අනතුරුව, කියුබාවට එරෙහිව එක්සත් ජනපද හමුදා ප්‍රහාරයක් එල්ල කිරීම සඳහා පෙරනිමිති සැපයීම පිණිස, එක්සත් ජනපද නගරවල ව්‍යාජ (false-flag) ත්‍රස්තවාදී බෝම්බ ප්‍රහාර සහ එක්සත් ජනපද ගුවන් යානා පැහැරගැනීම් සිදු කිරීම සඳහා වූ, දැනට රහස්‍යභාවයෙන් මුදාහැර ඇති යෝජනාවක් වන 'ඔපරේෂන් නෝර්ත්වුඩ්ස්' (Operation Northwoods) සැලැස්ම 1962 මාර්තු මාසයේදී ඒකාබද්ධ මාණ්ඩලික ප්‍රධානීන් (Joint Chiefs of Staff) විසින් කෙටුම්පත් කරන ලදී.

1975 චර්ච් කමිටුව (Church Committee) මඟින් 1960 සහ 1965 අතර කාලය තුළ ෆිදෙල් කැස්ත්‍රෝ ඝාතනය කිරීමට සී.අයි.ඒ. (CIA) සංවිධානය දැරූ උත්සාහයන් අටක් සාක්ෂි සහිතව තහවුරු කරන ලද අතර, පුපුරා යන මුහුදු බෙලිකටු, විෂ සහිත සුරුට්ටු, වස කැවූ පෑන් භාවිත කිරීම සහ මාෆියා සාමාජිකයන් සමඟ පැවැත්වූ සහයෝගීතාව එහිදී ලේඛනගත කෙරිණි. කියුබානු ප්‍රති-බුද්ධි (counterintelligence) අංශය විසින් සමස්තයක් ලෙස මෙවැනි වෙන් වෙන් ඝාතන කුමන්ත්‍රණ 638ක් ලේඛනගත කර ඇත.

විශේෂයෙන්ම ද්වේෂ සහගත කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙස, 1971 වසරේ ඇති වූ අප්‍රිකානු ඌරු උණ වසංගතය සහ ළමුන් 101 දෙනෙකු ඇතුළුව පුද්ගලයන් 158 දෙනෙකු මියගිය 1981 වසරේ ඇති වූ ඩෙංගු රක්තපාත උණ වසංගතය, ඇමෙරිකාවට සම්බන්ධ පාර්ශ්වයන් විසින් හිතාමතාම සිදු කරන ලද හඳුන්වා දීම් බව කියුබාව කියා සිටී.

කීත් බොලෙන්ඩර් (Keith Bolender) ඇතුළු පර්යේෂකයන් විසින් සම්පාදනය කරන ලද, කියුබානු රජයේ වාර්තා සහ පුද්ගලයන්ගේ සෘජු සාක්ෂි ඇසුරින් රැස්කරගත් මෙන්ම, රහස්‍යභාවයෙන් මුදාහළ වාර්තාවල ඇති වෙන් වෙන් සිදුවීම් සමඟ පුළුල් ලෙස සන්සන්දනය කරන ලද ලේඛනගත සංඛ්‍යාලේඛනවලට අනුව; **1959 සිට කියුබාවට එරෙහිව ක්‍රියාත්මක වූ එක්සත් ජනපදය විසින් මෙහෙයවන ලද හෝ එක්සත් ජනපදයට සම්බන්ධ ත්‍රස්තවාදය හේතුවෙන් සිදු වූ මරණ සංඛ්‍යාව 3,000කට වඩා වැඩි වන අතර තුවාල ලැබූ සංඛ්‍යාව 2,100කට ආසන්න වේ.**

**මෙම අපරාධ සිදුකළ කිසිදු අපරාධකරුවෙකු එක්සත් ජනපද රජය විසින් අපරාධමය වශයෙන් වගකීමට ලක් කර නොමැත. ඔවුන්ව පුහුණු කළ, සංවිධානය කළ, මූල්‍ය ප්‍රතිපාදන සැපයූ සහ නඩු පැවරීමෙන් වලක්වා ඔවුන්ව ආරක්ෂා කළ ජාලයන් ගොඩනඟන ලද්දේ සහ ආරක්ෂා කරන ලද්දේ සී.අයි.ඒ. (CIA) සංවිධානය සහ සමස්තයක් ලෙස එක්සත් ජනපද රාජ්‍යය විසිනි.**

ලුයිස් පොසාඩා කැරිලස්ගේ (Luisu Posada Carriles) ක්‍රියාකලාපය මෙයට ඇති පැහැදිලිම උදාහරණයයි. කියුබාවේ උපත ලබා, ජෝර්ජියාවේ ෆෝර්ට් බෙනින් (Fort Benning) හිදී සී.අයි.ඒ. (CIA) සංවිධානය විසින් පුහුණු කරනු ලැබූ පොසාඩා, "බේ ඔෆ් පිග්ස්" (Bay of Pigs) ආක්‍රමණය සංවිධානය කිරීමට දායක විය. ඉන් අනතුරුව එක්සත් ජනපද බුද්ධි අංශවල දැනුවත්භාවය, රැකවරණය සහ ඇතැම් අවස්ථාවලදී ඔවුන්ගේ සෘජු මඟපෙන්වීම යටතේ දශක ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වෙමින්, බටහිර අර්ධගෝලයේ ඉතිහාසය තුළ වඩාත්ම ක්‍රියාකාරී ත්‍රස්තවාදියෙකු බවට පත් විය. ඔහු 1976 දී කියුබානා ගුවන් සේවයට අයත් 455 ගුවන් යානයට (Cubana Airlines Flight 455) සිදු කළ බෝම්බ ප්‍රහාරයේ ප්‍රධාන සංවිධායකයෙකු විය. එම ප්‍රහාරය 2001 සැප්තැම්බර් 11 දිනට පෙර ඇමරිකානු කලාපය තුළ සිදු වූ මාරාන්තිකම ගුවන් සේවා ත්‍රස්ත ක්‍රියාවයි. එමඟින් සමස්ත කියුබානු ජාතික කනිෂ්ඨ කඩු හරඹ (fencing) කණ්ඩායම ඇතුළුව එහි ගමන් ගත් මගීන් 73 දෙනාම ජීවිතක්ෂයට පත් වූහ.

1976 බෝම්බ ප්‍රහාරය සැලසුම් කරන ලද දේශය සහ පොසාඩා (Posada) නීත්‍යානුකූලව (ප්‍රජාකරණ) පුරවැසිභාවය ලබා සිටි රට වූ වෙනිසියුලාව, එම ප්‍රහාරය සම්බන්ධයෙන් ඔහුව අත්අඩංගුවට ගෙන වසර ගණනාවක් රඳවා තබා ගත්තේය. පසුව 1985 දී, ඔහුට එරෙහි නඩු විභාගය අපේක්ෂාවෙන් පසුවන අතරතුර, ඔහු බන්ධනාගාරයෙන් පලා ගියේය.

ඔහු ඉතාලි ජාතික සංචාරක ෆැබියෝ ඩි සෙල්මෝ (Fabio Di Celmo) ජීවිතක්ෂයට පත් කළ 1997 හවානා හෝටල් බෝම්බ ප්‍රහාර මාලාව සංවිධානය කළ අතර, ෆිදෙල් කැස්ත්‍රෝට එරෙහි කුමන්ත්‍රණයක් සම්බන්ධයෙන් 2000 නොවැම්බර් මාසයේදී පුපුරණ ද්‍රව්‍ය රාත්තල් 200ක් ද සමඟ පැනමා නගරයේදී අත්අඩංගුවට පත්විය. දැඩි එක්සත් ජනපද බලපෑම් මධ්‍යයේ, 2004 වසරේදී ධුරයෙන් නික්ම යන පැනමා ජනාධිපතිනි මිරේයා මොස්කොසෝ (Mireya Moscoso) විසින් ඔහුට සමාව ලබා දෙන ලදී.

දිගින් දිගටම එල්ල වූ ජාත්‍යන්තර බලපෑම් හමුවේ, බුෂ් පරිපාලනය විසින් පොසාඩාව අත්අඩංගුවට ගනු ලැබූ

නමුත් වෙනිසියුලාවෙන් සහ කියුබාවෙන් ඉදිරිපත් වූ උදර්පණ (රටින් පිටුවහල් කර භාරදීමේ) ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලදී. වෙනිසියුලාවේ අවශ්‍යතා නියෝජනය කළ වොෂින්ටන් නීතිඥවරයෙකු වූ හොසේ පර්ටියෙරා (José Pertierra), තියුණු උපහාසයකින් යුතුව මෙසේ සඳහන් කළේය: “කියුබාව තුළ වධහිංසා පැමිණවීම් සම්බන්ධයෙන් මා දැක ඇති එකම සාක්ෂිය ලැබෙන්නේ ග්වන්තනාමෝ බොක්කේ (Guantánamo Bay) පිහිටි එක්සත් ජනපද හමුදා කඳවුරෙන් පමණි.”

අවසානයේදී එක්සත් ජනපද රජය විසින් පොසාඩාට එරෙහිව ඉදිරිපත් කරන ලද එකම චෝදනාව වූයේ අසත්‍ය ප්‍රකාශ කිරීම (perjury) සම්බන්ධයෙන් වූ චෝදනාවයි; එනම්, ප්‍රජාකරණ (naturalization-පුරවැසිභාවය ලබාදීමේ) විභාගයකදී, හවානා හෝටල් බෝම්බ ප්‍රහාර සම්බන්ධයෙන් තමා සතු වූ දායකත්වය පිළිබඳව ආගමන විගමන නිලධාරීන්ට අසත්‍ය ප්‍රකාශ කිරීමයි. 2011 වසරේදී, එල් පැසෝ (El Paso) හි ෆෙඩරල් ජූරි සභාවක් විසින් ඔහුව එම චෝදනාවෙන් පවා නිදොස් කොට නිදහස් කරන ලදී. පොසාඩා කැරිලස් 2018 වසරේදී වයස අවුරුදු 90ක්ව සිටියදී, ෆ්ලොරිඩාවේ පිහිටි ප්‍රවීණ සේවා භටයන් රැකබලා ගන්නා නිවාසයකදී සාමකාමීව මියගියේය.

දැන්, මෙම අතීත වාර්තාවන් සම්පූර්ණයෙන්ම පරීක්ෂාවට ලක් නොකර, එම රජයම රාවුල් කැස්ත්‍රෝට (Raúl Castro) එරෙහිව අපරාධ චෝදනා පත්‍රයක් ප්‍රකාශයට පත් කරන්නේ, පොසාඩාගේ (Posada) සමීපතම හවුල්කරුවෙකු විසින් මෙහෙයවනු ලැබූ ජාලයක් මඟින් ක්‍රියාත්මක කරන ලද ගුවන් යානා අතරමඟදී අවහිර කිරීමට නියෝග කිරීම සම්බන්ධයෙනි.

**කියුබාවට එරෙහිව සිදුවෙමින් පවතින මෙම ක්‍රියාවලිය අසාමාන්‍යයක් නොවේ. එය, තමන්ගේ ගෝලීය ආධිපත්‍යයට එල්ල වන සෑම අභියෝගයක්ම විනාශ කිරීම සඳහා එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් දියත් කරනු ලබන පුළුල් මෙහෙයුමක සංකේන්ද්‍රිත ප්‍රකාශනයකි. ඉරාකය, ඇෆ්ගනිස්ථානය, ලිබියාව සහ සිරියාව විනාශ කිරීමටත්, ගාසා හි ජනසංහාරයටත්, ඉරානය වටලෑමටත් සහ වෙනිසියුලාවේ මදුරෝව කොටු කර ගැනීමටත් හේතු වූයේ ද එම මෙහෙයුමමය වේ.**

**මැයි 14 වනදා, කියුබානු රජය සී.අයි.ඒ. (CIA) අධ්‍යක්ෂ ජෝන් රැට්ක්ලිෆ්ව හවානාහිදී පිළිගත් අතර, එහිදී ඔහු හිටපු ජනාධිපතිවරයාගේ මුනුපුරා වන රාවුල් ගිලර්මෝ “රාවුලිටෝ” රොද්‍රිගස් කැස්ත්‍රෝ සහ අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන් සමඟ පැවැති හමුවකදී “මූලික වෙනස්කම්” සිදු කරන ලෙස බලකර සිටියේය. මෙම හමුව මඟින් සංඥා කරන්නේ ජාතිකවාදී උපායමාර්ගය එහි ඓතිහාසික අවසානයට පැමිණ ඇති බවයි: එනම්, දශක හයක් තිස්සේ සී.අයි.ඒ. (CIA) ත්‍රස්තවාදයෙන් බේරී සිටි කැස්ත්‍රෝවාදී නායකත්වය, දැන් සී.අයි.ඒ. අධ්‍යක්ෂවරයා සමඟ එකම මේසයක වාඩි වී තමන්ගේම යටත් වීමේ කොන්දේසි පිළිබඳව සාකච්ඡා කරමින් සිටී. කියුබාවේ සහ ජාත්‍යන්තර වශයෙන් වෙසෙන කම්කරු පන්තිය මෙයින් අවශ්‍ය දේශපාලන නිගමනවලට එළඹිය යුතුය.**

**මේ අතර, මෙක්සිකෝව, බ්‍රසීලය සහ කොලොම්බියාව යන රටවල “වාම” ජාතිකවාදී ආණ්ඩු, කියුබාව සාගින්නට ඇද දමන ඉන්ධන අවහිරතාවයට සහ පාලන තන්ත්‍රය වෙනස් කිරීමේ මෙහෙයුමට සම්පූර්ණයෙන්ම හවුල් වී ඇත.**

ඉදිරි මාවත රැඳී පවතින්නේ එක්සත් ජනපද, කියුබානු සහ ජාත්‍යන්තර කම්කරු පන්තියේ ස්වාධීන දේශපාලන බලමුලු ගැන්වීම මතය: එනම්, අධිරාජ්‍යවාදී යුද්ධය සහ භීෂණය දේශපාලන ජීවිතයේ ප්‍රධාන ලක්ෂණ බවට පත් කරන ධනේශ්වර ක්‍රමයට එරෙහි තම අරගලයේ කොටසක් ලෙස, වරාය කම්කරුවන්, ප්‍රවාහන කම්කරුවන්, තෙල් කම්කරුවන් සහ අනෙකුත් පිරිස් මෙම අවහිරතාවය බලාත්මක කිරීම ප්‍රතික්ෂේප කිරීම සහ කියුබාවට එරෙහි හමුදා ප්‍රහාරයකට විරුද්ධ වීමයි.

(අවධාරණය පරිවර්තනයේදී එක් කෙරුණි)

---

### SLLA POLITICAL GRAPHICS






Socialism AI
by the WSWS
Ask a question
SocialismAI.com

මාක්ස්වාදය, භූ දේශපාලනය හා ජාත්‍යන්තර සමාජවාදී ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න ලෝක සමාජවාදී වෙබ් අඩවිය විසින් නිර්මිත ආවර්ධිත බුද්ධියේ නව යෙදුම
Socialism AI වෙතින් අසන්න. SocialismAI.com වෙත පිවිසෙන්න.

**Socialism AI ඔබගේ දෛනික දේශපාලන අධ්‍යාපනයේ හා ක්‍රියාකාරකම්වල කොටසක් කර ගැනීමට අපි අපගේ සියලුම පාඨකයින්ට ආරාධනා කරමු.**

**සියල්ල රඳා පවතින්නේ අප කරන දේ මත ය. සමාජවාදය සඳහා සටනට සංවිධානය සහ දේශපාලන ඉදිරිදර්ශනය අවශ්‍ය වේ. කිසිවක් ස්වයංක්‍රීයව සිදු නොවේ. ධනවාදය නැවත වරක් මානව වර්ගයා ප්‍රශ්න පිළිබඳ ප්‍රශ්නයට යොමු කරයි: එනම් සමාජවාදය ද, ම්ලේච්ඡත්වය ද යන ප්‍රශ්නයයි.**

**අප ජීවත් වන්නේ පන්ති සමාජයක ය.  එහි කම්කරු පන්තියේ පැත්ත ගන්න. ලෝකය යහපත් ලොවක් බවට පරිවර්තනය කළ හැක්කේ කම්කරු පන්තියේ නායකත්වය යටතේ එම පන්තිය ද, සෙසු පීඩිත ජනතාව ද එක්සත් කිරීමෙන් පමණි. ඒ සඳහා එහි ලෝක පක්ෂය වන හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව හා එහි ශාඛා ගොඩනගන්න. ලෝක සමාජවාදී වෙබ් අඩවිය ගොඩ නැගීමේ අරමුදලට සහාය දෙන්න. ලෝක සමාජවාදී විප්ලවයේ ඉදිරිදර්ශනය සහ වැඩසටහනෙන් කම්කරු පන්තිය සන්නද්ධ කිරීමේ සටනට සහාය දෙන්න, එක් වන්න.**

**The Socialist** සඟරාව ශ්‍රී ලංකාවේ සමාජවාදී සමානතා පක්ෂයේ (සසප/SEP) විප්ලවවාදී වාම කන්ඩායම වන ශ්‍රී ලංකාවේ සහ දකුනු ආසියාවේ සමාජවාදී නායකත්වය (SLLA) හි ඩිජිටල් මාසික ප්‍රකාශනයයි. එහි සියලු කලාප download කර ගැනීමට මෙහි පිවිසෙන්න: https://www.thesocialist.lk/monthly-magazine/ . මෙහි පළකරනු ලබන සියලු ලිපි පිළිබඳ ඔබගේ අදහස් හා සාකච්ඡා සඳහා අපව සම්බන්ධ කර ගැනීමට අපට ලියන්න: socialistlead@gmail.com. අපගේ වෙබ් අඩවිය **theSocialist.lk** නිති පතා කියවන්න. **The Socialist World** YouTube නාලිකාවේ විවරණ අසන්න. හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ (ICFI) ලෝක ප්‍රකාශනය වන ලෝක සමාජවාදී වෙබ් අඩවිය wsws.org දිනපතා කියවන්න. සසප යනු ICFI හි ලංකා ශාඛාවයි. එසේම කම්කරු පන්තියේ නායකත්වය ගොඩනැගීමේ අපගේ අරගලයට එකතු වන්න. **theSocialist.lk** සඳහා මුදලින් දායක වන්න.

**ලංකාවේ එකම සමාජවාදී සඟරාව, The Socialist ඩිජිටල් කලාප ඔබගේ හිතවතුන් අතර බෙදා හරින්න.** සඟරාව WhatsApp හරහා ලබා ගැනීමට 0777497101 වෙතින් ඉල්ලුම් කරන්න.

World Socialist Web Site WSWS.ORG

සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂාවන්ගෙන් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ලිපි දිනපතා කියවන්න